



වාර්ෂික වාර්තාව

2020





භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

වාර්ෂික වාර්තාව
2020

පරිසර අමාත්‍යාංශය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.

දු.ක. : 011 2 88 62 89 / 011 2 88 62 90

ෆැක්ස් : 011 2 88 62 90

විද්‍යුත් තැපෑල : **info@gsmb.gov.lk**

වෙබ් අඩවිය : **www.gsmb.gov.lk**

අපගේ දැක්ම

"සමාජීය, සංස්කෘතිකමය සහ පාරිසරික වටිනාකම් සුරකිමින් ජනතාවගේ ජීවන ප්‍රමිතීන් හා ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම සඳහා මහපොළොව හා එහි ශක්තිය තේරුම් ගැනීම සහ කළමනාකරණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායක වීම".

අපගේ මෙහෙවර

"තාක්ෂණ- ආර්ථික සහ විද්‍යාත්මක -තිරසර සංවර්ධනය හා අනුකූලව ජාතික භූ විද්‍යා සම්පත් සමුදායක් සකස්කරමින් ,බනිජ කැනීම හා සැකසීම සහ ගවේෂණය විධිමත් කරමින්, තිරසර ක්‍රමෝපායික සේවාවන් ලබාදීම ගවේෂණය කරමින් ,විශේෂ පෘථිවි විද්‍යා තොරතුරු ලබාදෙමින් හා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රමෝපායික ලෙස දායක වෙමින් පෘථිවිය සහ එහි ශක්තිය අවබෝධ කරගැනීම සඳහා සිදුකරන පර්යේෂණයන් සඳහා ආයෝජනය කිරීම මගින් ස්වාභාවික සම්පත් හා පරිසරය කළමනාකරණය කිරීම

ක්‍රමෝපායික අරමුණු

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වර්ග වලට අයත් වැඩසටහන් සමුදාය සහ ඒවායේ සංකීර්ණතාවය සලකා බැලීමේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ඉටු කිරීමට භාර ගනු ලබන සියලුම කාර්යයන්හි අරමුණු සහ ක්‍රියාමාර්ග පිළිබඳ ලේඛනයක් ලෙස මෙම සැලැස්ම ක්‍රියාකරනු නොලබයි. එසේ වුවද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අත් කරගැනීමට බලාපොරොත්තු වන ප්‍රතිඵල සහ සිදුකිරීමට බලාපොරොත්තු වන වැදගත් වෙනස්කම් නිරූපණය කරනු ලබන ප්‍රමුඛතාවය ලබා දෙන ලද අරමුණු සහ එම අරමුණු සපුරා ගැනීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ලබාගැනීමට අපේක්ෂා කරනු ලබන ප්‍රධාන ප්‍රවේශයන් නිරූපණය කරනු ලබන මූලික ක්‍රමෝපායන් මෙම සැලැස්ම මගින් ඉදිරිපත් කරනු ලැබේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අත් කරගැනීමට බලාපොරොත්තු වන අරමුණු 10 ක් සහ ඊට අදාළ ක්‍රමෝපායික කාර්ය රාමු සහ ක්‍රමෝපායන් පහත සාකච්ඡා කොට ඇත.

ක්‍රමෝපායික අරමුණු

01. වැනි ක්‍රමෝපායික අරමුණ : පාරදෘශ්‍ය භාවයෙන් යුතු, ආරක්ෂිත ,විද්‍යාත්මක, තිරසර සහ තරගකාරී නියාමන පරිසරයක් සඳහා ව්‍යවස්ථාමය කාර්ය රාමුව නැවත සකස් කිරීම.

02. වැනි ක්‍රමෝපායික අරමුණ : භෞතික සහ මානව සම්පත් ශක්‍යතාවය ඉහළ නැංවීම

03. වැනි ක්‍රමෝපායික අරමුණ : අධ්‍යයනයන්, ව්‍යාපෘති සහ සහයෝගිතාවයන් වර්ධනය කිරීම මගින් භූ විද්‍යා පර්යේෂණ වල විශිෂ්ටතාව ලබා ගැනීම.

04. වැනි ක්‍රමෝපායික අරමුණ : සම්පත් බහුල රටවල් සමඟ සහයෝගිතාවය වේගවත් කිරීම තුළින්, ගවේෂණයන් සඳහා ක්‍රියාකොට සම්පත් සහ සංචිත පුළුල් කිරීම.

05. වැනි ක්‍රමෝපායික අරමුණ : භූ විද්‍යා ලේඛණ හා තොරතුරු ලබා ගැනීම සහ සංරක්ෂණය කිරීම සහ ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක සම්පත් පිළිබඳ ජාතික තොරතුරු කළඹක් සම්පාදනය කිරීම.

06. වැනි ක්‍රමෝපායික අරමුණ : ඛනිජ අංශය තුළ තාක්ෂණික, ආර්ථික, විද්‍යාත්මක සහ තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම.

07. වැනි ක්‍රමෝපායික අරමුණ : ආරක්ෂාව සහ පතල් තුළ මුදවා ගැනීමේ කාර්යයන්

08. වැනි ක්‍රමෝපායික අරමුණ : මහජනතාවට සහ භූ විද්‍යාත්මක ප්‍රජාවන්ට සේවය කිරීම සහ ප්‍රජා සම්බන්ධතාවයන් ගොඩනැංවීම.

09. වැනි ක්‍රමෝපායික අරමුණ : මෙහෙවරෙහි අඛණ්ඩ සංවර්ධනය සඳහා සේවා උත්පාදන මාර්ග ඉහළ නැංවීම.

10. වැනි ක්‍රමෝපායික අරමුණ : පෘථිවියෙහි ගතිකත්වය සහ ස්වභාවික පරිසරය අධීක්ෂණය කිරීම මගින් ස්වභාවික උවදුරු මගින් ඇතිවන ආර්ථික, සමාජීය සහ පාරිසරික බලපෑම් ක්‍රමෝපායික ලෙස අඩු කිරීම.

පටුන

	පිටු අංක
සභාපතිවරයාගේ පණිවිඩය	08-09
අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය	10-11
කළමනාකාරීත්ව මණ්ඩලය	12
ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය	12
කාර්යාංශය ගැන තොරතුරු බිඳක්	13-14
කාර්යාංශය සමඟ සම්බන්ධ විය හැකි ආකාරයේ පිළිබඳ තොරතුරු	15
ඓතිහාසික පසුබිම	16
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අනාගත සැලසුම්	17
ආංශයික කාර්ය සාධනය	
භූ විද්‍යා අංශය	19-55
විද්‍යාගාර අංශය	57-58
පතල් අංශය	60-71
මූල්‍ය සමාලෝචනය	72-73
නීති අංශය	75-79
මානව සම්පත් සමාලෝචනය	81-83
ආයතනික පාලනය	84
මූල්‍ය වාර්තා	
ගිණුම්කරණ ප්‍රතිපත්ති	86-95
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	97
මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශනය	99
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	101-122
විගණකාධිපති වාර්තාව	124-137
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	139-144
විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව	146-147
ආයතනික සමාජ වගකීම්	149-150

සභාපතිවරයාගේ පණිවුඩය



කාර්යාංශයට අභිනවයෙන් පත් කරන ලද සභාපතිවරයා ලෙස 2020 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවුඩය නිකුත් කිරීමට ලැබීම මට ඉමහත් සතුටකි. මෙම වර්ෂය තුළ දී අංශ ප්‍රධානීන්ගෙන් සහ කාර්යමණ්ඩලය වෙතින් මා වෙත ලබා දෙන ලද පූර්ණ සහයෝගය සිහිපත් කිරීමට ද මම කැමැත්තෙමි.

2020 වර්ෂයෙහි ප්‍රථම මාස දෙක තුළදී තම ඉලක්ක සපුරා ගැනීමට කාර්යාංශයට හැකිවුණ මුත් රට තුළ පැවැති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් මාර්තු මස සිට එම කාර්යය ඉටු කිරීම කාර්යාංශයට පහසු නොවීය. වසංගත තත්ත්වයක් පැවතුණ ද මා විසින් ලබාදෙන ලද කෙටි දැනුම් දීමක් තුළ අංශ ප්‍රධානීන් වරින් වර මා හමුවූ අතර කාර්යාංශයෙහි කටයුතු කිසිදු බාධාවකින් තොරව සිදු කරගෙන යෑමට එමගින් හැකියාව ලැබුණි. කාර්යාංශයෙහි කාර්ය මණ්ඩලයේ වැටුප් කිසිදු අඩුකිරීමකින් තොරව, බාධාවකින් තොරව ගෙවන අතරතුරදීම කාර්යාංශයෙහි එදිනෙදා කටයුතු සිදුකරගෙන යෑම සඳහා මෙම කාලය තුළ දී දක්වන ලද සහයෝගය වෙනුවෙන් සියලුම අංශ ප්‍රධානීන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල වෙත මම ස්තුතිවන්ත වෙමි.

රජයෙහි කොවිඩ් අරමුදල වෙත කාර්යමණ්ඩලයේ දායකත්වය ලබාදීමට සහ මීගමුව මහ රෝහලට වෛද්‍ය උපකරණ කිහිපයක් ලබාදීම සඳහා අනුග්‍රාහකත්වය දැරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට හැකියාව ලැබුණි.

ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් අධීක්ෂණ කටයුතු ක්‍රියාකාරී ලෙස සිදු කරමින් බලපත්‍ර නිකුත් කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට කාර්යාංශයේ ප්‍රධානීන්ගේ සහ කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාවය හේතුවෙන් හැකියාව ලැබුණු බව මම විශේෂයෙන් සඳහන් කරමි. එසේ හෙයින්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය තුළ කොවිඩ් තත්ත්වය පාලනය කරමින් මනා සාර්ථකත්වයක් ලබාගැනීමට අප කාර්යාංශයට හැකි වූ අතර සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් හට මාස දෙකක වැටුප් ලබා දෙන ලද අතර දුෂ්කර කාලය තුළදී එය ඔවුන් හට ප්‍රබල සහායක් විය.

සංවර්ධන ප්‍රමුඛතාවයන් සහ ස්වයං රැකියා සඳහා භූ විද්‍යා සම්පත් යොදා ගැනීම සහ සම්ප්‍රදායික කර්මාන්ත වල නිරත තැනැත්තන්ගේ කුඩා පරිමාණයේ ආර්ථික ජීවනෝපාය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා එකී සම්පත් නිස්සාරණය කර ගැනීම පිළිබඳ ක්‍රමවේදයන් සහ එකී සම්පත්වල ප්‍රභවයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයෙකු ලෙස 2020 ඔක්තෝම්බර් මාසයේ දී අතිගරු ජනාධිපතිතුමා විසින් මා පත් කරනු ලැබූ අතර මෙම කටයුතුවල සාර්ථකත්වය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නිලධාරීන් වෙතින් ලැබුණු සම්පූර්ණ සහයෝගය මම ස්තුති පූර්වකව සඳහන් කරමි.

අවසාන වශයෙන්, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ සඳහන් කරන ලද සියලුම ඉලක්ක සපුරා ගැනීමට අප හට නොහැකි වුවද කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කරමින් එකී ඉලක්කයන්ගෙන් බොහොමයක් සපුරා ගැනීමට අපට හැකි වූ අතර මෙම වසංගත කාලය තුළදී ලබා දෙන ලද සුවිශාල සහාය වෙනුවෙන් ඔබ සියලු දෙනාට මාගේ ස්තුතිය පිරිනමන අතර ඔබට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමි.



අනුර වල්පොල
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කාර්යාංශයෙහි 2020 වාර්ෂික වාර්තාව සඳහා මෙම කෙටි පණිවිඩය ඔබ වෙත ගෙන එන්නේ ඉමහත් සතුටිනි. 2020 මූල්‍ය වර්ෂය සුවිශාල වෙනස්කම් වලින් සපිරුණු වර්ෂයක් විය. පළමු මාස තුන තුළදී කාර්යාංශය විසින් අචල ප්‍රගතියක් වාර්තා කරනු ලැබූවද කොවිඩ් 19 වසංගත තත්ත්වය අනපේක්ෂිත ලෙස ඉස්මතු වීම හේතුවෙන් කාර්යාංශයේ කටයුතු වලට දැඩි බලපෑමක් ඇතිවිය. අප සියලු දෙනාම දන්නා ආකාරයට වෛරසය පැතිරීම හේතුවෙන් රට වසා තැබීමට සහ හදිසි තත්වයන් ප්‍රකාශයට පත් කිරීමට සිදුවිය. මෙම හිතකර නොවන තත්වයන් තුළදී පවා, කැණීම් කර්මාන්තය ස්ථාවර තත්ත්වයක පවත්වාගෙන යා හැකි ආකාරයට සහන සැලසීමට කාර්යාංශයට හැකිවූ බව ප්‍රකාශ කරන්නේ ඉමහත් ආඩම්බරයෙනි.

ආර්ථික හා තිරසර සංවර්ධනය සඳහා කැණීම් කර්මාන්තය තුළ පාරිසරික, තාක්ෂණික හා සමාජීය පාලනය වඩ වඩාත් ප්‍රමුඛ වෙමින් පවතී. 2020 වර්ෂය තුළදී, වියදමට පසු ආදායම ලෙස රුපියල් 773,685,180.17ක් කාර්යංශය විසින් වාර්තා කරන ලද අතර මෙහි දී කැණීම් අංශයේ දායකත්වය තුළින් ලැබුණු ආදායම රුපියල් 2,046,391,999.60 ක් ද භූ විද්‍යා අංශය මගින් ලැබුණු ආදායම ලෙස රුපියල් 31 201 852.74 ද වූ අතර අනෙකුත් ආදායම ලෙස රුපියල් 168,565,315.60 ක්ද ලැබුණි. කාර්යාංශයෙහි සියලුම සේවක මහත්ම මහත්මීන්ගේ ප්‍රසංශනීය සාමූහික දායකත්වය තුළින් මහා භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 1190ක් ලබාදීමට කාර්යංශයට හැකිවූ බව මම ඉමහත් ආඩම්බරයෙන් සඳහන් කරමි.

නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ලාභය උපරිම කිරීම සඳහා කටයුතු කරන අතරම ශ්‍රමිකයන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම යන ක්ෂේත්‍රය හා සම්බන්ධව සුවිශේෂී අභියෝගයන් කැණීම් කර්මාන්තය තුළ දක්නට ලැබේ. ආරක්ෂිත නීති හා රෙගුලාසි එකතුවක් සහ යෝග්‍ය තාක්ෂණික පහසුකම් තුළින් උවදුරු සහ අවදානම් තත්වයන් යන සාධක දෙකම අඩු කරමින් ආරක්ෂිත පතල් නිර්මාණය කරනු ලැබේ.

යෝග්‍ය ආරක්ෂිත ක්‍රියාපිළිවෙත් අනුගමනය කිරීම සඳහා බලපත්‍ර ලාභීන් උනන්දු කරවීම පිණිස ආරක්ෂාව පිළිබඳ වැඩමුළු මාලාවක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ආරම්භ කර ඇත. රට තුළ පුපුරණ ද්‍රව්‍ය උපයෝජනය කිරීම නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සෘජු දායකත්වය සහිතව මනාව සැලසුම් කරන ලද මෘදුකාංගයක් නිර්මාණය කරන ලදි. අනිත් අතට, රටෙහි පුපුරණ ද්‍රව්‍ය අවශ්‍යතාවය නැවත ඇගයීම මගින් පුපුරණ ද්‍රව්‍ය භාවිතය පිළිබඳ නිර්ණායක ප්‍රතිව්‍යුහගත කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයට හැකිවිය.

නුවර ප්‍රදේශයේ ඇතිවූ භූ චලන තත්ත්වයෙන් පසුව බියට පත් ජනතාව නැවත පදිංචි කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සම්බන්ධ වූ අතර අහිතකර සංසිද්ධීන් ඇතුළු වැනි අනාගත සිදුවීම් හඳුනාගැනීම සඳහා විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදි. මීට අමතරව භූ විද්‍යා සිතියම් සැකසීම අඛණ්ඩව සිදුකරන ලද අතර භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි භූ විද්‍යා අංශය තුළින් එප්පාවල පොස්පේට් නිධිය, කොටිකගම් බොක්ක තිරුවානා ඉල්ලම් නිධි වැනි සංචිත ඇස්තමේන්තු ගත කිරීම් අඛණ්ඩව සිදු කරනු ලැබුණි.

කැණීම් කර්මාන්තය බාධාවකින් තොරව පවත්වාගෙන යෑම සඳහා සත්‍ය වශයෙන්ම කණින ලද පාෂාණ පරිමාව නිර්ණය කිරීම අතිශයින්ම වැදගත් බව පෙනී ගිය හෙයින් කණින ලද ස්ථානීය පාෂාණ පරිමාව වඩාත් නිවැරදි ආකාරයකින් නිර්ණය කිරීම සඳහා නව ඇස්තමේන්තු ක්‍රමවේදයක් ලබන වසරේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලැබ ඇත. රටෙහි පවතින ඛනිජ සම්පත් සක්‍රීය ආකාරයෙන් උපයෝජනය කිරීම සඳහා ඉදිරි වර්ෂය ඉලක්ක කරගනිමින් ජනාධිපති කාර්ය සාධක බලකාය සඳහා සුදුසු නිර්දේශ සහ යෝජනා සකස් කරන ලදි.

පෙර කිසිදිනක දක්නට නොලැබුණු මෙවැනි තත්ත්වයන් තුළදී තම ඥානාන්විත උපදේශකත්වය සහ වටිනා දායකත්වය ලබාදීම වෙනුවෙන් අමාත්‍යතුමා, සභාපතිතුමා සහ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත මාගේ ස්තුතිය පළ කරමි. පසුගිය වර්ෂය තුළදී ලබා ගන්නා ලද ප්‍රගතිය වෙනුවෙන් දක්වන ලද සහයෝගය සම්බන්ධයෙන් අපගේ සේවකයන් සහ පාර්ශවකරුවන් වෙත ද මගේ හෘදයාංගම කෘතවේදිත්වය පල කිරීමට මම කැමැත්තෙමි.

ඉදිරියේ දී මුහුණ දීමට සිදුවන අභියෝග සහ ප්‍රගතිය සඳහා බෙහෙවින් ඉඩකඩ ලබාදෙමින් ජනාධිපතිවරයාගේ දූරදර්ශී නායකත්වය මගින් ලබාගැනීමට ඉලක්ක කරන ලද ආර්ථික වර්ධනය හේතුවෙන් රටෙහි ආර්ථික පරිසරය වේගයෙන් වෙනස් වෙමින් පවතී. 2020 වර්ෂය සිදුවීම් බහුල සහ අභියෝගකාරී වර්ෂයක් වූ අතර ශ්‍රී ලංකාව ලෝකයේ ආශ්චර්ය බවට පත් කිරීමේ කාර්යය යථාර්තයක් බවට පත් කරන ආර්ථික වර්ධන ක්‍රියාවලියට අඛණ්ඩව සහාය ලබා දීමට අපි අපේක්ෂා කරමු.

ඉංජිනේරු ඩී. සජ්ජන ද සිල්වා
විද්‍යාවේදී,වරලත් ඉංජිනේරු, එම්.අයි.ඊ(ශ්‍රී ලංකා)
අධ්‍යක්ෂක ජනරාල්

කළමනාකාරිත්ව මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය
සභාපති: අනුර වල්පොල මහතා

සාමාජිකයන් :

ඒ.ආර්. වික්‍රමරත්න මහතා
ඩබ්.ඩි.එස්. සී. වැලිවත්ත මහතා
ඩබ්ලිව්. පී.ජී. විජේවර්ධන මහතා
ඩබ්ලිව්. එම්. අයි. ඩී විජේසුන්දර මහතා
අයි. සී. පතිරාජ මහතා

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

සභාපති	-	**අනුර වල්පොල මහතා**
අධ්‍යක්ෂ ජනරාල්	-	**ඉංජිනේරු ඩී. සජ්ජන ද සිල්වා මහතා**
ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ(භූ විද්‍යා)	-	**කේ. ටී. යූ. එස් ද සිල්වා මහතා**
අධ්‍යක්ෂ භූ විද්‍යා තොරතුරු හා සිතියම්	-	**එම්. එම්. ජේ. පී අජිත් ප්‍රේම මහතා**
අධ්‍යක්ෂ කැණීම් නාමකරණය	-	**කේ. ඒ. පී හේමලතා මහත්මිය**
අධ්‍යක්ෂ විද්‍යාගාර හා භෞතික පරීක්ෂා කිරීම්	-	**වයි. පී. එස්. පී සිරිවර්ධන මහත්මිය**
අධ්‍යක්ෂ පාරිසරික බලපෑම් ඇගයීම් සහ ප්‍රාදේශීය	-	**එල්. ඒ. ප්‍රනාන්දු මහතා**

අධ්‍යක්ෂ (පතල් ආරක්ෂාව)	-	**කේ. ඩී. ජේ. කේ කුමාර මහතා**
අධ්‍යක්ෂ මානව සම්පත්	-	**යූ. ජේ. පී සේනාරත්න මහතා**
අධ්‍යක්ෂ මූල්‍ය	-	**ආර්. කේ. එස්. කේ. රාහුබද්ධ මහත්මිය**

කාර්යාංශය ගැන

ශ්‍රී ලංකාවේ ඛනිජ කර්මාන්ත සඳහා මඟ පෙන්වන්නෝ අපි වෙමු.

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ සේවා සැපයීම සඳහා පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ඛනිජ සංවර්ධනය පිළිබඳ ප්‍රමුඛතම ආයතනය වන අතර ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ වගකීම මෙමගින් ඉටු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ඛනිජ සංවර්ධනය සඳහා බලයලත් ආයතනය වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මේ දක්වා ඛනිජ පිළිබඳ ගවේෂණ කටයුතු සිදු කර ඇති ආයතනය වන අතර ඒ තුළින් රට වෙත ප්‍රතිලාභ සලසා දී ඇත.

ශ්‍රී ලංකාව කුඩා රටක් වන හෙයින් එහි උප පෘෂ්ඨ ඛනිජ සම්පත ද කුඩා මට්ටමක පවති. එහෙයින් කාර්යාංශය විසින් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම දිරිගන්වන අතරම ඛනිජ අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කිරීම අවධාරණය කරනු ලැබේ. එලෙසම ඛනිජ යනු පුනර්ජනනීය නොවන සම්පතක් වන හෙයින් එය අපතේ යැවීමට එරෙහිව අනතුරු ඇඟවීම් ද සිදු කරනු ලැබේ.

ජාතියට භූ විද්‍යාත්මක ශක්‍යතාවයන් ලබා දෙන ප්‍රමුඛතමයා ලෙස, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පෘථිවියේ ඇති සම්පත් හා ඒ ආශ්‍රිත ගැටළු හා ප්‍රශ්න පිලිබඳව අවබෝධයක් ලබා දෙනු ලැබේ. බහුවිධ වූ විද්‍යාත්මක විශේෂඥ දැනුම මගින් බහු විෂයයික ගවේෂණ සිදු කිරීමට අප හට හැකියාව ලබා දෙනු ලබන අතර සම්පත් කළමනාකරුවන්, සැලසුම්කරුවන් සහ අනිකුත් පාරිභෝගිකයින් වෙත භූ විද්‍යා සිතියම් මාලාවක් ඇතුළු භූ විද්‍යා තොරතුරු අපක්ෂපාතී ලෙස ලබා දෙනු ලැබේ. පෘථිවිය පිලිබඳ තොරතුරු ලබා ගැනීම සහ අවබෝධ කර ගැනීම, ස්වාභාවික ව්‍යසන වලින් ජීවිත වලට සහ දේපලවලට සිදුවන හානි අවම කර ගැනීම, භූ විද්‍යාමය බලශක්ති සහ ඛනිජ සම්පත් කළමනාකරණය කිරීම සහ අපගේ ජීවිතවල ගුණාත්මක බව ආරක්ෂා කිරීම සහ ඉහළ නැංවීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ජාතිය වෙත සේවය සලසාලනු ලැබේ.

මූලික මෙහෙයුම් කටයුතු 4 ක් කාර්යාංශය සතුව ඇත: භූ විද්‍යා සිතියම් සැකසීම හා ඛනිජ ගවේෂණය, කැනීම් හිමිකම් සහ කැනීම් රෙගුලාසි (ප්‍රධාන කාර්යය); සේවාදායකයන් අරමුණු කරගත් කටයුතු (ඛනිජ සම්පත් ගවේෂණය, විද්‍යාගාර සේවා, භූ භෞතික හා කැනීම් කටයුතු පිළිබඳ එකඟතාවයන්) සහ භූ විද්‍යාත්මක තොරතුරු ලබා දීම (පළ කරන ලද හෝ පළ නොකරන ලද වාර්තා සඳහා ප්‍රවේශය සහ සිය පුස්තකාලය තුළ ඇති සිතියම් හා වෙනත් ලේඛන) එම කාර්යයන් වේ.

නුවර, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, මොනරාගල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කළුතර, යාපනය, මඩකලපුව, ගම්පහ සහ පොලොන්නරුව දිස්ත්‍රික්ක වල පිහිටි ප්‍රාදේශීය කාර්යාල 15 ක් සහ හසලක සහ කන්තලේ පිහිටි උප කාර්යාල 2 ක් සහිතව කැනීම් අංශය වර්තමානයේදී ක්‍රියාත්මක වේ. මෙම ප්‍රාදේශිය කාර්යාලවල ප්‍රධාන කටයුතු වන්නේ අදාල පළාත් තුළ විවිධ කැනීම් කර්මාන්තවල නිරත පාරිභෝගික ජනතාව වෙත වඩාත් හොඳ සේවාවක් ලබා දීමත් නීති විරෝධී කැනීම් කටයුතු පාලනය කිරීමත් ය.


භූ.ස.ප.කා. තම සේවා රට පුරා පුළුල් කරයි
N
W
E
S
යාපනය
ත්‍රිකුණාමලය
අනුරාධපුරය
කන්තලේ
පොලොන්නරුව
මඩකලපුව
කුරුණෑගල
අම්පාර
මහනුවර
ගම්පහ
බදුල්ල
කොළඹ
මොනරාගල
රත්නපුරය
කළුතර
හම්බන්තොට
මාතර
60000
160000
260000
450000
350000
250000
150000
25 12.5 0 25
Kilometers
Digital Cartography by Paditha Priyanga Maddumage (GSMB- Cartography Division)

කාර්යාංශය සමග සම්බන්ධ වීමට අවශ්‍ය තොරතුරු

අපගේ කාර්යාල	ලිපිනය	විද්‍යුත් තැපැල් ලිපිනය	දුරකථනය/ෆැක්ස්
ප්‍රධාන කාර්යාලය	අංක 569, එපිටමුල්ල පාර. පිටකෝට්ටේ	info@gsmb.gov.lk	11-2886289 11-2886290
අම්පාර	අංක 96 , දුටුගැමුනු මාවත , අම්පාර	ampara@gsmb.gov.lk	0632223385
අනුරාධපුරය	අංක 519/F/3 ජයන්ති පාර ,බණ්ඩාරනායක මාවත, අනුරාධපුරය	anuradhapura@gsmb.gov.lk	0252224388
බදුල්ල	අංක 117/3, මහියංගන පාර, බදුල්ල	badulla@gsmb.gov.lk	0552225210
මඩකලපුව	අංක 20/G, බෙලි ඇවනියු ,සින්න උප්පොදෙයි , මඩකලපුව	batticaloa@gsmb.gov.lk	0652222266
කොළඹ	අංක 463, කෝට්ටේ පාර, පිටකෝට්ටේ	info@gsmb.gov.lk	0112886522
හම්බන්තොට	අංක 21, ටෙරස් ඇවනියු , හම්බන්තොට	hambantota@gsmb.gov.lk	0472222477
ගම්පහ	අංක 6, වෙරළවත්ත, යක්කල	gampaha@gsmb.gov.lk	0332231430
යාපනය	අංක 170, කොලොම්පුතුරෙයි මාවත, යාපනය	jaffna@gsmb.gov.lk	042224595
කළුතර	අංක 11/ඊ, සෙනෙවිරත්න පෙදෙස, කළුතර දකුණ	kalutara@gsmb.gov.lk	0342225580
නුවර	ජනසවිගම පල්ලෙකැලේ නුවර	kandy@gsmb.gov.lk	0812421294
කුරුණෑගල	අංක 72, විලේගොඩ පාර, කුරුණෑගල	kurunegala@gsmb.gov.lk	0372230858
මාතර	අංක 224, සුනන්ධ මාවත, වල්ගම, මාතර	matara@gsmb.gov.lk	0412736765
මොනරාගල	අංක 134/4, අම්බිල හාඩ්වෙයාර් ගොඩනැගිල්ල ,නව බස් නැවතුම් පොළ , මොනරාගල	monaragala@gsmb.gov.lk	0552277392
රත්නපුරය	අංක 66, ශ්‍රී සරණංකර මාවත, හිදැල්ලන, රත්නපුරය	rathnapura@gsmb.gov.lk	0452228117
ත්‍රිකුණාමලය	අංක 272, 4 වැනි සැතපුම් කනුව,අන්දන්කුලන් ත්‍රිකුණාමලය	trinco@gsmb.gov.lk	0262052815
පොලොන්නරුව	අංක 26, රොවුන් පාර පොලොන්නරුව	polonnaruwa@gsmb.gov.lk	0272226366
වවුනියාව	අංක 45/1A යාපනය පාර ,වවුනියාව	vavniya@gsmb.gov.lk	0242229005
කෑගල්ල	**No** 102/8 , අංක 102/8 මොලමුරේ වත්ත, කෑගල්ල	kegalla@gsmb.gov.lk	0352221958
මාතලේ	අංක 80/2 අල්වලා, උකුවෙල	matale@gsmb.gov.lk	0662058585

ඓතිහාසික පසුබිම



1903 වර්ෂයේදී ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතාගේ මූලිකත්වය යටතේ ආරම්භ කරන ලද ලංකා ඛනිජ සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිට ශත වර්ෂයකට වඩා වැඩි කාලයක් තිස්සේ පැවතුණ භූ විද්‍යා දෙපාර්තමේන්තු මාලාවක සාඩම්බර අනුප්‍රාප්තිකයා ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හැඳින්විය හැකිය. රටේ ඛනිජ සම්පත් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම, ප්‍රවර්ධනය කිරීම සහ ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තු විසින් ඉතිහාසය පුරාම සුවිශේෂී වාර්තාවක් තබා ඇති අතර එකී කාර්යය වෙනුවෙන් රට තුළ දැනට ක්‍රියාත්මක වන සියළුම ඛනිජ කර්මාන්ත ණයගැති වේ.

1939දී ඛණිජ ගවේෂණ දෙපාර්තමේන්තුව ඛනිජ විද්‍යා දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලද අතර 1962 දී භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව ලෙස එය නැවත නම් කරන ලදී. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත ප්‍රකාරව 1993 මාර්තු මස 18 වැනි දින කාර්යාංශය පිහිටුවන ලද අතර එතුලින් භූ විද්‍යා සමීක්ෂණ කටයුතු සමඟ නූතන පතල් දෙපාර්තමේන්තුවක් සතු නව වගකීම් ද ඒකාබද්ධ කරන ලදී.

ඛනිජ සංවර්ධනය පිළිබඳ ප්‍රමුඛතම ආයතනය ලෙස කාර්යාංශය පිහිටුවීම තුළින් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජය සතු වගකීම් ඉටු කිරීම අවධාරණය කරනු ලැබේ. මිල අධික ආනයන සඳහා ආදේශක සැපයීම, ගොඩනැගිලි සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාණ්ඩ ලබා දීම සහ අපනයන කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලබා දීම තුළින් රට තුළ රැකියා නිර්මාණය කිරීම සහ රටට ආදායම උත්පාදනය කිරීම සඳහා ඛනිජ දායක වෙයි. ජාතික භූ විද්‍යා දත්ත පදනම පවත්වා ගැනීම සහ මෙම තොරතුරු මහජනතාවට ලබා දෙන බවට වගබලා ගැනීම උදෙසා ද කාර්යාංශය වගකීම දරයි.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයෙහි අනාගත සැලසුම්

භූ විද්‍යා අංශය සහ කැණීම් අංශය යන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක තුළ අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ප්‍රධාන කටයුතු ලෙස පහත සඳහන් අනාගත සැලසුම් සැකෙවින් දක්වනු ලැබේ.

1. PWC ආයතනය විසින් ඉදිරිපත්කරන ලද යෝජනා මත පදනම්ව රජයේ ක්‍රියාවලිය ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම
2. නවීන භූ විද්‍යා ඉංජිනේරු විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම
3. පාෂාන විද්‍යාගාර යටිතල පහසුකම් ඉහළ නැංවීම
4. විශ්ලේෂණ විද්‍යාගාර පහසුකම් ඉහළ නැංවීම
5. නවීන භූ විද්‍යා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
6. විදුම් උපකරණ ගබඩා කිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීම
7. ඉංජිනේරු සැලසුම් ඒකකයක් ස්ථාපිත කිරීම
8. පතල් වැසීමේ පුනරුත්ථාපන කටයුතු ඉහළ නැංවීම
9. පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව/ ආරම්භක පාරිසරික පරීක්ෂණ වාර්තාව පිළිබඳ කටයුතු වැඩිදියුණු කිරීම
10. වෙළෙඳපොළ වටිනාකම් පරීක්ෂණ සිදු කිරීම
11. නව ප්‍රාදේශීය කාර්යාල ස්ථාපිත කිරීම
12. ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම සඳහා ඉඩම් ලබාගැනීම
13. ප්‍රවාහන බලපත්‍ර පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම
14. G.P.R පද්ධතියක් හඳුන්වාදීම
15. 5s සහ ISO ප්‍රමිතීන් ලබා ගැනීම මගින් ක්‍රියාවලිය ප්‍රමිතිගත කිරීම
16. චාතුර්තික සිතියම් සැකසීම
17. පාංශු භූ රසායනික සිතියම් සැකසීම
18. වාර්ෂික පොත් පළ කිරීම
19. ගංගා දෝනිවල ජල ධාරා අවසාදිත පරීක්ෂණ
20. න්‍යෂ්ඨික අමුද්‍රව්‍ය පරීක්ෂණ
21. භූ චලන ප්‍රමාණීකරනය
22. ප්‍රධාන නගර ප්‍රදේශ වල උපපෘෂ්ඨ ස්ථරයන්හි භූ ඉංජිනේරුමය ලක්ෂණ, එප්පාවල පොස්පේට් නිධියෙහි සිදුකළ හැකි පුළුල් කිරීම සම්බන්ධයෙන් භූභෞතික පරීක්ෂණය

භූ විද්‍යා අංශය

2020 වර්ෂයෙහි ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ ප්‍රගතිය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

භූ විද්‍යා අංශයෙහි ප්‍රගතිය ප්‍රධාන කාණ්ඩ තුනක් යටතේ විස්තර කරනු ලැබේ.(1) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයෙහි ප්‍රතිපාදන මගින් ප්‍රධාන වශයෙන්ම මූල්‍ය සම්පාදනය කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් කටයුතු (2) සේවාදායකයන්ගේ ඉල්ලීම් මත ක්‍රියාත්මක කරනු ලබන සේවාදායක ප්‍රතිචාර ව්‍යාපෘති (3) කෙටි ක්ෂේත්‍ර සංචාර, රැස්වීම්, පුහුණුවීම් හා ප්‍රකාශන ඇතුළත් අනිකුත් කටයුතු ය.

1.1. ක්‍රියාකාරී සැලසුම් කටයුතු : භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රතිපාදන

2020 වර්ෂය තුළදී භූ විද්‍යා අංශයෙහි ක්‍රියාකාරී සැලසුම් කටයුතු ප්‍රධාන කාර්ය සාධන ක්ෂේත්‍ර හතරක් යටතේ සිදු කරන ලදී.

MPA-1 සිතියම් සැකසීම, භූ විද්‍යාත්මක තොරතුරු උත්පාදනය කිරීම සහ තොරතුරු බෙදාහැරීම

MPA-2 ඛනිජ පරීක්ෂණ, භූ භෞතික පරීක්ෂණ සහ සම්පත් ඇගයීම

MPA-3 පර්යේෂණ හා සංවර්ධන කටයුතු ,පෘථිවි ලක්ෂණ සහ භූකම්පන කටයුතු අධීක්ෂණය කිරීම

MPA-4 යටිතල පහසුකම්, විද්‍යාගාර පහසුකම් සහ විදුම් ධාරිතාවය සංවර්ධනය කිරීම

MPA - 1 සිතියම් සැකසීම, භූ විද්‍යා තොරතුරු උත්පාදනය සහ දත්ත බෙදා හැරීම

(අ) භූ විද්‍යා සිතියම් මුද්‍රනය කිරීම:

මුළු ශ්‍රී ලංකාවම ආවරණය කරනු ලබන භූ විද්‍යා සිතියම් පලකිරීම කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. ඛනිජ හා භූගත ජලය ගවේෂණය, ප්‍රධාන ඉදිකිරීම් හා සිවිල් ඉංජිනේරු කාර්යයන් සහ නායයෑම් උවදුරු සිතියම් පිලියෙල කිරීම ආදී කාර්යයන් ගණනාවක් සඳහා භූමිය පිළිබඳ භූ විද්‍යා තොරතුරු ඇතුලත් භූ විද්‍යා සිතියම් යොදා ගනු ලැබේ. මුළු රටම ආවරණය වන පරිදි භූ විද්‍යා සිතියම් (1: 100,000 පරිමාණයේ) 21ක මුද්‍රණ කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2014 වර්ෂයේදී නිම කරන ලදි. 1:25,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් සැකසීම 2019 වර්ෂයේදී ආරම්භ කරන ලදි. මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන 1:50000 පරිමානයේ ABMP සිතියම් මත පදනම්ව මෙය සිදු කරනු ලැබේ.මෙම වැඩ සටහන යටතේ පළමු සිතියම ලෙස නිලාවැලි කලාපය (අංක 23) තෝරා ගන්නා ලදි.ක්ෂේත්‍ර කටයුතු (සිතියම්ගත කිරීමේ කටයුතු) සහ විද්‍යාගාර විශ්ලේෂන කටයුතු නිම කරන ලද අතර සිතියම් සම්පාදනය කිරීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී.



1 රූප සටහන: නිලාවැලි භූ විද්‍යා සිතියම (සම්පාදනය කරනු ලබමින් පවතී)

(ආ) චාතුර්ථික සිතියම්කරණ (වෙරළබඩ කලාපීය) වැඩසටහන

භූ විද්‍යා කාල පරිමාණයට අයත් චාතුර්ථික කාල පරිච්ඡේදය අවුරුදු මිලියන 2කට පෙර අතීතයේ සිට වර්තමානය දක්වා දිව එයි. ශ්‍රී ලංකාවේ චාතුර්ථික සිතියම් සැකසීම් වෙරළබඩ අවසාදිතයන්ට හා ජලගැලිම් ඇති වන තැනිතලා ප්‍රදේශවල දියළුමය අවසාදිතයන්ට සීමා වන අතර පස් සැකසීම් ඒ තුළට ඇතුළත් වේ. එහෙත් මෙම සැකසීම් තුළ ආර්ථිකමය ලෙස වැදගත් මැටි හා වැලි නිධි, කොරල් තැන්පතු, සශ්‍රීක පස් ආවරණ සහ භූගත ජල ප්‍රභව අන්තර්ගත වන හෙයින් ඒවා අතිශයින්ම සුවිශේෂී වේ. "චාතුර්ථික භූ විද්‍යා සිතියම්කරණය" නම් ව්‍යාපෘතිය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2008 වර්ෂයේදී ආරම්භ කරන ලදී

චාතුර්ථික සිතියම්කරණ වැඩසටහනෙහි සිතියම් මුද්‍රණ කටයුතු

සිලාවතුර සහ තිස්සමහාරාම යන සිතියම් වල සම්පාදන කටයුතු වලින් 95% නිම කරන ලද අතර 2021 වර්ෂයෙහි මුල් කාර්තුව තුළ දී ඒවා මුද්‍රනය සඳහා සුදානම් කරනු ඇත.



2 රූප සටහන : බොහෝ දුරට නිම කරන ලද සිලාවතුර සිතියම

චාතුර්තික සිතියම්කරණ වැඩසටහනෙහි සිතියම් සම්පාදන කටයුතු

කල්පිටිය සහ යාල යන කලාපවල සිතියම් සම්පාදන කටයුතු ක්‍රියාත්මක කරන ලදී . මෙම කටයුතු වලින් සියයට තිහක් පමණ නිම කරන ලද අතර මෙම සිතියම් වල කටයුතු 2021 වන විට නිම කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන

පසෙහි භූ රසායනික ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා 2008 වර්ෂයේදී පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන ආරම්භ කරන ලදී. ඛනිජ ගවේෂණය, පාරිසරික අධීක්ෂණ කටයුතු, කෘෂිකාර්මික පර්යේෂණ සහ භූ සෞඛ්‍ය උවදුරු අධ්‍යයන කටයුතු සඳහා මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. 1:50,000 පරිමාණයේ පාදක සිතියම් යොදාගෙන භූ රසායනික සිතියම් කටයුතු සිදු කරනු ලබමින් පවතී.

සෑම $4km^2$ ප්‍රදේශයකම $1km^2$ පාලන ප්‍රදේශයක මතුපිට ස්ථානයකින් සහ 2 m ගැඹුරින් පිහිටි ස්ථානයකින් පස් නිදර්ශක 2 ක් ලබා ගනු ලැබේ. පරමාණුක අවශෝෂන වර්ණාවලිමානය සහ ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචක වර්ණාවලිමානය භාවිතා කරමින් රසායනික ලක්ෂණ විශ්ලේෂණය කරනු ලැබේ.

පාංශු භූ රසායනික සිතියම් වැඩසටහනෙහි ක්ෂේත්‍ර කටයුතු

සිතියම් කලාප අංක 19 (අළුත්ගම- ගාල්ල) හි ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලදී. ප්‍රසිද්ධ කරන ලද සිතියම් වල සුවිශේෂී ප්‍රදේශ අධ්‍යයනය කිරීම සඳහා සවිස්තරාත්මක භූ රසායනික සිතියම් සකස් කිරීමේ කාර්යය හඳුන්වා දෙන ලදී. හම්බන්තොට කර්මාන්ත කලාපය සඳහා සවිස්තරාත්මක සිතියම් සැකසීමේ කාර්යය මෙම වැඩසටහන යටතේ නිම කරන ලදී.



3 වන රූප සටහන: විදුම් ක්‍රමය මගින් පස් නියදි සැකසීම

පාංශු භූ රසායනික සිතියම් වැඩසටහනෙහි විද්‍යාගාර කටයුතු

සිතියම් කලාප අංක හයෙහි (වවුනියාව- ත්‍රිකුණාමලය) විශ්ලේෂණ කටයුතු නිම කරන ලදි. සිතියම් කලාප අංක 19(අළුත්ගම-ගාල්ලෙන්) ලබාගත් නියැදි වල මූලික පිළියෙළ කිරීමේ කටයුතු නිම කරන ලද අතර විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබමින් පවතී.

පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන යටතේ සිතියම් සම්පාදනය කිරීම හා මුද්‍රණය කිරීම

භූ රසායනික සිතියම් සංග්‍රහයෙහි සිතියම් කලාප අංක හය සම්පාදනය කිරීම සිදු කරන ලදි.

(ඈ) වාර්ෂික ඛනිජ ග්‍රන්ථය - 2019

2019 සහ 2020 යන වර්ෂවල වාර්ෂික ඛනිජ ග්‍රන්ථයන්හි මුද්‍රණය සඳහා සූදානම් කරන ලද පිටපත බොහෝදුරට නිම කරන ලදී.

(ඉ) පළාත් බනිජ පරීක්ෂණ සහ පළාත් බනිජ සිතියම්

උතුරු මැද පළාතෙහි සහ සබරගමුව පළාතෙහි පළාත් බනිජ සිතියම් මුද්‍රණය කිරීමේ කාර්යය නිම කරන ලද අතර මුද්‍රණය සඳහා සූදානම් කරන ලද පිටපත් 2019 වර්ෂය අවසානයේ දී මුද්‍රණය සඳහා භාර දෙන ලදී. ඌව පළාතෙහි මුද්‍රණය සඳහා සූදානම් කරන ලද පිටපත 2020 වර්ෂයෙහි පළමුවෙනි කාර්තුවේ දී ලබා දෙන ලදී. කෙසේ වුවද මෙම සිතියම් චීනයෙහි මුද්‍රණය කරනු ලබන බැවින් මුද්‍රණ කරුවන් වෙතින් එම මුද්‍රිත සිතියම් තවමත් ලැබී නොමැත. දැනට පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම ක්‍රියාවලිය ප්‍රමාද වී ඇත.

දකුණු පළාත් බනිජ පරීක්ෂණයෙහි ක්ෂේත්‍ර කටයුතු සිදු කරනු ලබමින් පවතී.



4 වන රූප සටහන: ඌව පළාත් බනිජ සිතියමෙහි මුද්‍රනය සඳහා සුදානම් පිටපත

(ඊ) සුවිශේෂී බනිජ සිතියම් /වාර්තාවන් පිළියෙල කිරීම

"තිරිවානා නිධි" සහ "බනිජ වැලි" පිළිබඳ සුවිශේෂී බනිජ වාර්තාවන්හි අවසන් වාර්තාවන් පිළියෙල කරනු ලබමින් පවතී.

MPA-2 ඛනිජ පරීක්ෂණ, භූ භෞතික පරීක්ෂණ සහ සම්පත් ඇගයීම

(අ) ගංගා ද්‍රෝණිවල ජලධාරා අවසාදිත පිළිබඳ පරීක්ෂණ

වලවේ ගඟ

රත්නපුර මැණික් ඉල්ලම් වලින් දකුණු දෙසට පිහිටා ඇති වළවේ ගංගා ද්‍රෝණිය ශ්‍රී ලංකාවේ වඩාත්ම වැදගත් ගංගා පද්ධතිවලින් එකකි. විවිධ වර්ග වලට අයත් මැණික් ගල්, දියලුම රත්රන්, සර්කෝන් සහිත සයනයිට් අඩංගු ද්‍රව්‍ය සහ ලෝහ අයනමය සර්පන්ටිනයිට්ස් වර්ග ජලාපවහන ද්‍රෝණිය තුළ හමුවීම මගින් ද්‍රෝණියෙහි භූ විද්‍යාත්මක සහ ආර්ථික වැදගත්කම ඉහළ නංවනු ලැබේ.

"වළවේ ගංගා ද්‍රෝණියෙහි ජලධාරා අවසාදිත විශ්ලේෂණය" නම් වූ මෙකී ව්‍යාපෘතියෙහි වැදගත්කම හේතුවෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි කොටසක් ලෙස 2015 වර්ෂයේ දී මෙය ක්‍රියාත්මක කරන ලදි. වලවේ ගංගාවෙහි ජලාපවාහන ද්‍රෝණියෙහි ඉහල උන්නතාංශයකින් පිහිටි ප්‍රදේශ මෙම අධ්‍යයනයෙහි පළමු අදියර සඳහා තෝරා ගන්නා ලද අතර ද්‍රෝණිය තුළ දක්නට ලැබෙන බැර ලෝහ වෙන් කිරීමට සහ විශ්ලේෂණය කිරීමට යොදා ගන්නා ලද ශිල්පීය ක්‍රම හා ක්‍රමෝපායන් සහ සිදුකරන ලද සොයා ගැනීම් සහ ඒවායේ නිගමනයන් මෙම වාර්තාව තුළ අන්තර්ගත වේ. 2019 වර්ෂයේ දී ක්ෂේත්‍ර කටයුතු සම්පූර්ණ කරන ලද අතර විද්‍යාගාර විශ්ලේෂණ කටයුතු 2020 වර්ෂයේ දී අවසන් කරන ලදි. අවසාන වාර්තාව සකස් කිරීමේ කටයුතු දැනට සිදුවෙමින් පවතී.

කිරිඳි ඔය

එකී කාර්යය සඳහාම කිරිඳිඔය ඔස්සේ ජලධාරා අවසාදිත පරීක්ෂණය 2020 වර්ෂයේ දී සිදු කරන ලදි. 2019 වර්ෂයේ දී ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලද අතර විද්‍යාගාර විශ්ලේෂණ කටයුතු 2020 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදි. අවසාන වාර්තාව සැකසීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී.

(ආ) ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයෙහි ආධාර යටතේ ක්‍රියාත්මක වන න්‍යෂ්ටික අපද්‍රව්‍ය පරීක්ෂණය හා ඊට ආනුෂාංගික කටයුතු

කාර් රථයක සිට ක්‍රියාත්මක කරනු ලබන ගැමා කිරණ වර්ණාවලීමාන පරීක්ෂණය

කාර් රථයට සිට ක්‍රියාත්මක කරනු ලබන ගැමා කිරණ වර්ණාවලීමාන පරීක්ෂනය රක්වාන තංගල්ල සිතියම් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කරන ලදි. මූලික ක්ෂේත්‍ර පර්යේෂණ සහ සවිස්තරාත්මක ක්ෂේත්‍ර පර්යේෂණ නිම කරනු ලැබ ඇත. විද්‍යාගාර කටයුතුද නිම කරනු ලැබ ඇත. මූලික පරීක්ෂණයෙහි සිතියම සම්පූර්ණ කරනු ලැබ ඇති අතර සවිස්තරාත්මක පර්යේෂණයට අදාළ අවසාන සිතියම සකස් කරනු ලබමින් පවතී.

අලුත්ගම- ගාල්ල සිතියම් ප්‍රදේශය තුළ, කාර් රථයක සිට ක්‍රියාත්මක කරන ලද ගැමා කිරණ පරීක්ෂණයට අදාල මූලික ක්ෂේත්‍ර පරීක්ෂණයෙහි සිතියම සහ සවිස්තරාත්මක පරීක්ෂණය නිම කරනු ලැබ ඇත. අවසාන සිතියම සැකසීම සහ වාර්තාව සැකසීම සිදුකරනු ලබමින් පවතී.

කොළඹ සිට කිරින්ද දක්වා වෙරළ තීරය ඔස්සේ සිදුකරන ලද න්‍යෂ්ටික අමුද්‍රව්‍ය පරීක්ෂණය

කොළඹ සිට කිරින්ද දක්වා වෙරළ තීරය ඔස්සේ සිදුකරන න්‍යෂ්ටික අමුද්‍රව්‍ය පරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලදි. මෙම පරීක්ෂණයෙහි අවසාන වාර්තාව සකස් කරනු ලබමින් පවතී.

න්‍යෂ්ටික අමුද්‍රව්‍ය පරීක්ෂණයෙහි දත්ත සම්පාදනය කිරීම

විකිරණශීලී දත්ත සැකසීම, ඛනිජ විද්‍යාත්මක විශ්ලේෂණය සහ භූ රසායනික දත්ත විශ්ලේෂණය නිම කරන ලදි. අවසන් වාර්තාව සැකසීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී.



5වන රූප සටහන: ගාල්ල අලුත්ගම ප්‍රදේශය තුළ කාර් රථයක සිට ක්‍රියාත්මක කරන ලද ගැමා කිරණ පරීක්ෂණයෙහි ප්‍රතිඵල

(ඇ) එප්පාවල පොස්පේට් නිධියෙහි උතුරු කොටස සම්බන්ධයෙන් සවිස්තරාත්මක පරීක්ෂණය

මෙම අධ්‍යනයන් මගින් යම් යම් කරුණු සම්බන්ධයෙන් නිගමනයකට පැමිණ ඇත. මෙම තත්වයන් යටතේ එප්පාවල පොස්පේට් නිධිය ආර්ථිකමය වශයෙන් ශක්‍යතාවය ඇති එකම නිධිය ලෙස පෙනී යයි. එසේ හෙයින් ශ්‍රී ලංකාවේ පොස්පේට් ඛනිජ තක්සේරු කිරීමේ කටයුතු මෙම නිධියට පමණක් සීමා වී ඇත.

භූ විද්‍යාත්මක සිතියම් සැකසීම සහ ඉඩම් පරිහරණ රටාව

භූ විද්‍යාත්මක සිතියම් සැකසීමේ කටයුතු සහ පාෂාණ නියැදි සැකසීම (ක්ෂේත්‍ර කටයුතු) 2019 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නිම කරන ලදි. පෘෂ්ඨීය සිතියම් මගින් හඳුනාගන්නා ලද ආකාරයට පොස්පේට් සහිත ප්‍රදේශයෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 2.23 කි. සිතියම් කෙටුම්පත් හා ආකෘති මෙම දත්ත උපයෝගී කර ගනිමින් පිළියෙළ කරන ලදි. භූ විද්‍යාත්මක සිතියම් සැකසීමෙහි ප්‍රතිඵලයක් ලෙස නව සම්පත් හඳුනා ගනු ලැබූ ප්‍රදේශ වල ඉඩම් පරිහරණ සිතියම සහ ඉඩම් හිමිකාරත්වය යාවත්කාලීන කිරීම සඳහා පරීක්ෂනයක් සිදු කරන ලදි.



6 වන රූප සටහන: එප්පාවල පාෂාණ පොස්පේට් නිධිය තුළ සහ අවට භූ විද්‍යාත්මක සිතියම

භූ භෞතික පරීක්ෂණය

නිදියෙහි මායිම් වෙන් කිරීම සහ උප පෘෂ්ඨ හැසිරීම තේරුම් ගැනීම සඳහා භූ භෞතික පරීක්ෂණයක් සිදු කරන ලදි. මාස 5-6 ක කාලයක් තුළ සිදු කරන ලද භූ භෞතික ගවේෂණ කටයුතු සඳහා චුම්බක සහ ප්‍රතිරෝධක ක්‍රම භාවිතා කරනු ලැබ ඇත. මෙම කාර්යය නිම කරනු ලැබ ඇත.

ඒකාබද්ධ භූ විද්‍යාත්මක සහ භූ භෞතික ප්‍රවේශය මගින් පොස්පේට් නිධියෙහි ලක්ෂණ විස්තර කරනු ලබන ආකෘතියක් නිර්මාණය කිරීමට සමත් වන ලද අතර නිර්දේශිත විදුම් මගින් එම ආකෘතිය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය භූමිය පිළිබඳ සැබෑ තත්වයන් ලබා දෙනු ඇත.







හත් වන රූප සටහන : උප පෘෂ්ඨ ප්‍රතිචාර මැනීම සඳහා උපකරණ වර්ග ගණනාවක් භූ භෞතික තාක්ෂණ ක්‍රම මගින් ලබාදෙනු ලැබේ. ඒවා අදාල ද්‍රව්‍යයට පමණක්ම සුවිශේෂී වේ. එප්පාවල පොස්පේට් නිධියෙහි පාර්ශවික සහ ගැඹුරු යන අංශ දෙකටම අයත් ප්‍රමාණය පැහැදිලි කරනු ලබන ආකෘතියක් නිර්මාණය කිරීම සඳහා හැකියාව ලබාදෙමින් එප්පාවල පොස්පේට් නිධිය සම්බන්ධයෙන් වුම්බක හා ප්‍රතිරෝධතා මිනුම් සිදු කරන ලදී. ඇපටයිට් අඩංගු පාෂාණ වල ඉහළ ප්‍රතිශතයක් මැග්නටයිට් දක්නට ලැබීම උපපෘෂ්ඨීය තුළ දක්නට ලැබෙන ඇපටයිට් හඳුනාගැනීම සඳහා උපකාරී වන ප්‍රධාන ලක්ෂණ වලින් එකක් වේ.

විදුම් කටයුතු

ප්‍රමාණාත්මක විශ්ලේෂණය සඳහා සවිස්තරාත්මක විදුම් පරීක්ෂණයක් 2020 අගෝස්තු මස අග භාගයේ සිට ක්‍රියාත්මක කරනු ලබමින් පවතී. යෝජිත වැඩවලින් සියයට හැත්තෑවක් සම්පූර්ණ කරමින් විදුම් සිදුරු 17 ක් නිම කරනු ලැබ ඇත.

නිදර්ශක සීයයක් පමණ විද්‍යාගාර විශ්ලේෂණය සඳහා ලබා දී ඇත. 2021 ජනවාරි වන විට නිම කරන ලද විදුම් සිදුරුවල සම්පූර්ණ දිග මීටර් 745 ක් පමණ වේ. දත්ත සැකසීම සහ වාර්තාව පිළියෙල කිරීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී. 2021 මාර්තු වන විට ව්‍යාපෘතිය නිම කිරීමට නියමිතව තිබේ.



8 වන රූප සටහන: විදුම් කටයුතු සිදු කරන ස්ථාන

MPA-3 : පර්යේෂණ සහ සංවර්ධන කටයුතු- පසෙහි ලක්ෂණ සහ කම්පන සිදුවීම් නිරීක්ෂණය

(අ) අක්‍රිය භූකම්පන නිරීක්ෂණ ධාරිතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයෙහි භූ කම්පන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (2019 වර්ෂයේ සිට සිදු කරනු ලබමින් පවතී)

ශ්‍රී ලංකාවෙහි නැගෙනහිර ප්‍රදේශයෙහි එනම් අම්පාර බුද්ධන්ගල ප්‍රදේශයෙහි භූ කම්පන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම 2019 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. උපකරණ මිලදී ගැනීමේ කටයුතු වලින් සියයට සීයක්ම සහ ආරක්ෂිතාගාරයෙහි ඉදිකිරීම් කටයුතු වලින් ආසන්න වශයෙන් 60%ක් 2019 වර්ෂයේදී නිම කරන ලද අතර ඉතිරි කොටස 2020 වර්ෂයේ දී සිදු කරන ලදී. ඉදිකිරීම් කටයුතු සහ සංවේදක සවි කිරීම මාර්තු මස මුල අවදියේ දී සිදුකරන ලද අතර බල්ක් භූ කම්පන මධ්‍යස්ථානය විසින් දත්ත පරිග්‍රහණය කිරීම 2020 මාර්තු 04 වන දින ආරම්භ කරන ලදී.

භූ කම්පන මධ්‍යස්ථාන හතරක් සහ භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

භූ කම්පන මධ්‍යස්ථාන තුන සතුව දත්ත පැවතීම වර්ෂය තුළදී සතුටුදායක මට්ටමක පැවති අතර භූ චලන, භූ ස්ඵන්දන සහ අනාගතයේ සිදුවන භූමිකම්පා සම්බන්ධයෙන් මහජනතාව විසින් සිදුකරනු ලබන පැමිණිලි සඳහා දත්ත මධ්‍යස්ථානය විසින් සාර්ථකව ප්‍රතිචාර දක්වා ඇත.

භූ කම්පන කලාප සිතියම සකස් කිරීම

කිසියම් ප්‍රදේශයක සිදුවිය හැකි භූමිකම්පා ආශ්‍රිත උවදුරු භූමිකම්පා උවදුරු ලෙස හඳුන්වනු ලබන අතර විවිධ ප්‍රදේශවල සිදුවන සාපේක්ෂ උවදුරු භූ කම්පන උවදුරු සිතියම මගින් පෙන්වනු ලැබේ. භූකම්පන උවදුරු මගින් ඇති කරන අවදානම් තත්ත්වයන් තේරුම් ගැනීමට සහ උවදුරු අඩු කිරීම සඳහා උපකාරී වන වැදගත් තොරතුරු ඒවා මගින් සපයනු ලබන අතර ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම, උවදුරු අඩුකිරීම සහ හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා ඒවා යොදාගත හැකිය.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය, එක්සත් ජනපදයෙහි භූ විද්‍යා පරීක්ෂණ ආයතනය, ජාත්‍යන්තර භූ කම්පන මධ්‍යස්ථානය යන ආයතනවල දත්ත පදනම් කරගෙන ඓතිහාසික වාර්තා සහ පර්යේෂණ පත්‍රිකා තුලින් ලබා ගන්නා ලද දත්ත උපයෝගී කරගනිමින් භූකම්පන නාමාවලිය පිළියෙළ කරනු ලැබ ඇත. ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රදේශයේ සිට කිලෝ මීටර් 500ක අරයක වපසරිය තුළ පිහිටා ඇති ප්‍රදේශ තුළ අතීතයේ සිදු වූ භූ කම්පන සිද්ධි එමගින් ආවරණය කරනු ලැබේ. ශාස්ත්‍රීය සමාලෝචන පදනම් කරගනිමින් ශ්‍රී ලංකාව තුළ සහ අවට භූ විද්‍යාත්මක ව්‍යුහයන් පිළිබඳ දත්ත නැවත ඇගයීමට ලක් කරනු ලැබේ. මෙම වැඩසටහන ලබන වසරේදී ද ක්‍රියාත්මක කරනු ඇත.



බුද්දංගල පිහිටි නව භූ කම්පන මධ්‍යස්ථානය

(ආ) පාරිසරික, දේශගුණික සහ පෘථිවි කබොල ආශ්‍රිත අධ්‍යයනයන් පිළිබඳ පර්යේෂණාමය අධ්‍යනයන්

කළුතර දිස්ත්‍රික්කයේ බෝල මැටි සහ කෙඔලින් නිධි පිළිබඳ පූර්ණ පරීක්ෂණය

බෝල මැටි සහ කෙඔලින් නිධි තිබිය හැකි ස්ථාන හඳුනා ගැනීම සහ එකී නිධි වල සංචිත ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මැටි තිබිය හැකි ස්ථාන හතක් හඳුනා ගන්නා ලද අතර එයින් ස්ථාන තුනක සංචිත ඇස්තමේන්තු කිරීම සිදු කරන ලදී. ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද නියැදි පූර්ණ විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා ලංකා සෙරමික්ස් විද්‍යාගාරය වෙත ලබා දෙන ලද අතර වැඩිදුර අධ්‍යයනයන් සිදු කිරීම සඳහා එකී විශ්ලේෂණයෙහි ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටිනු ලැබේ.

- වන්නි සංකීර්ණය සහ ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ මයෝසීන සැකසීම් අතර මායිම සලකුණු කිරීම

මෙම ශිලා භූකාරක අනුබෙදුම් අතර මායිම් තවමත් විවාදාපන්න වන අතර භූ භෞතික ක්‍රම යොදාගනිමින් විපරීත සහ අවසාදිත ප්‍රභව ස්ථානයන් අතර මායිම ඇගයීමට ලක් කිරීමට මෙම පර්යේෂණය මගින් අදහස් කරනු ලබන අතර වයඹ ප්‍රදේශයෙහි චාතුර්තික සිතියම් සැකසීම පිළිබඳව කර ගෙන යනු ලබන අධ්‍යයනයන් සම්පූර්ණ කිරීමට මෙම පර්යේෂණය මගින් අදහස් කරනු ලැබේ.

ක්ෂේත්‍ර දත්ත ලබාගැනීම නිම කරනු ලැබ ඇති අතර දත්ත සැකසීම සහ වාර්තාව සැකසීම සිදු කරනු ලබමින් පවතී.

- අක්‍රිය භූ කම්පන සහ අනිකුත් භූ භෞතික ක්‍රමවේදයන් භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ ගිනිකොණ දිග කොටසෙහි සහ ගල්ඔය ද්‍රෝණිය පාමුල පාංශු ව්‍යුහය අවබෝධ කර ගැනීම.

රටෙහි නැගෙනහිර සහ ගිණිකොණ දිග කොටසෙහි පාංශු ගතික හැසිරීම් කෙරෙහි බොහෝසෙයින්ම මූලික වශයෙන්ම බලපාන ගල්ඔය ද්‍රෝණිය පාමුල පස කෙරෙහි ගැඹුරු අධ්‍යයනයක් කිරීම සඳහා පර්යේෂණය ආරම්භ කරන ලදි. ප්‍රදේශය අවට භූ චලන ඇති විය හැකි කලාපය හඳුනා ගැනීම සහ සුදුසු ව්‍යසන කළමනාකරණ සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා මෙම ප්‍රදේශයෙහි පාංශු ව්‍යුහය අවබෝධ කර ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ශාස්ත්‍රීය පර්යේෂණයන් සහ දත්ත පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කරනු ලබමින් පවතින අතර මූලික ක්ෂේත්‍ර පර්යේෂණ ආරම්භ කරනු ලැබ ඇත. ව්‍යාපෘතිය 2022 වර්ෂයේ දී නිම කිරීමට සැලසුම් කරනු ලැබ ඇත.

- කළු ගඟ පිටාර යන තැනිතලා ප්‍රදේශය තුළ බෝල මැටි තැන්පත්වීම් වල ඛනිජ විද්‍යාව, භූ රසායනය, පිඟන් මැටි ලක්ෂණ සහ අවකාශීය ව්‍යාප්තිය

මෙම පර්යේෂණයෙහි අරමුණ වනුයේ පිඟන් මැටි තැන්පත්වීම් වල ඛනිජ විද්‍යාත්මක ලක්ෂණ, භූ රසායනික ලක්ෂණ සහ පිඟන් මැටි ලක්ෂණ විස්තර කරනු ලබන රසායනික අර්ථ නිරූපණයක් සහ සංසන්දනයක් සිදු කිරීමයි. එලෙසම බෝල මැටි තැන්පතු වල අවකාශීය ව්‍යාප්තිය පිළිබඳ සිතියමක් සැකසීමට සහ ඒ පිළබඳ අධ්‍යයනයන්ගේ කාර්මික වැදගත්කම පිළිබඳ සාකච්ඡාවක් සිදු කිරීමට ද අපේක්ෂා කරනු ලැබේ.

ශාස්ත්‍රීය පර්යේෂණය සහ දැනට පවතින දත්ත සමාලෝචනය කිරීමේ කටයුතු නිම කරනු ලැබ ඇති අතර ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු සිදු කරනු ලබමින් පවතී. මෙම අධ්‍යයනය 2021 වර්ෂය තුළ ද අඛන්ඩව සිදු කරනු ඇත.

- ශ්‍රී ලංකාවේ නිරිතදිග උස්බිම් සංකීර්ණය තුළ පෙග්මටයිට් සහිත මොනසයිට්හි පාෂාණ විද්‍යාත්මක , භූ රසායනික, විකිරණ මිනික ලක්ෂණ සහ උත්පාදනය

ශාස්ත්‍රීය පර්යේෂණ සහ මූලික ක්ෂේත්‍ර පර්යේෂණ නිම කරනු ලැබ ඇත. මෙම අධ්‍යයනය 2021 වර්ශයේද අඛණ්ඩව සිදුවනු ඇත.

- ශ්‍රී ලංකාවේ ප්‍රුරාසික් අවසාදිත සැකැස්මෙහි විශාලත්වය සලකුණු කිරීම: තබ්බෝව,ආඩිගම සහ පල්ලම

චුම්බක මිනුම් සහිතව තබ්බෝව ජලාශ පතුලෙහි මායිම ලකුණු කිරීම සඳහා මෙම පරීක්ෂණය සැලසුම් කරන ලදි. වන්නි ප්‍රදේශයේ ප්‍රොටෙරොසොනික් පාෂාණ හා සසඳා බැලීමේදී ප්‍රුරාසික් අවසාදිත සතුව අඩු චුම්බක ක ලක්ෂණ පවතින හෙයින් අධ්‍යයනය සඳහා චුම්බක ශිල්පීය ක්‍රමය සලකා බලනු ලැබේ. ආරම්භක ව හරස් ඡේදනයන් හතරක් සම්පූර්ණ කිරීමට සැලසුම් කරන ලද අතර මෙම හරස් ඡේදනයන් හතරෙන් දෙකක් නිම කරනු ලැබ ඇත. එහි ප්‍රතිඵල විශ්වසනීය සහ උනන්දුවක් ඇති කරනු ලබන ඒවා වේ.

- කන්දරගම -මල්වතු ඔය පතුලෙහි වැලි තැන්පතු පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් සඳහා ප්‍රතිචාරය

පහල මල්වතු ඔය ව්‍යාපෘතියෙහි ජල ගැලීමට යටවන ප්‍රදේශය පුරා ප්‍රතිරෝධතාවය පිළිබඳ වාර්තාවක් සැකසීමේ කටයුතු නිම කරනු ලැබ ඇති අතර අදාළ පර්යේෂණය සඳහා දැනට පවතින දත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සහ බලධාරීන් වෙතින් ලැබුණු දත්ත වේ. අවසන් වාර්තාවෙන් කොටසක් නිම කරන ලද අතර 2 D ප්‍රතිරෝධතාවය පිළිබඳ තොරතුරු පිළියෙල කිරීම අවසාන වාර්තාව නිකුත් කිරීම 2021 වර්ෂයේ දි සිදු කිරීමට සැලසුම් කර ඇත.

(ඇ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි පුස්තකාලය නවීකරණය කිරීම

01. පුස්තකාල දත්ත කළමනාකරණය සඳහා කොහා මෘදුකාංගය ස්ථාපිත කිරීම.

විද්‍යාත්මක සඟරා සඳහා දත්ත ඇතුලත් කිරීම නිම කරනු ලැබ ඇත(2020 වර්ෂය සඳහා සැලසුම් කරන ලද වැඩ කටයුතු නිම කරනු ලැබ ඇත)

2. පුස්තකාල ලේඛන ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම-99%

ආරක්ෂා කළ යුතු වන පුස්තකාල ලේඛන තෝරා ගන්නා ලද අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව මෙම කාර්යය ඉටු කිරීම සඳහා ජයවර්ධන මධ්‍යස්ථානය වෙත භාර දෙන ලදී.

3. සඟරා බැඳීම -60%

බැඳීම සිදු කළ යුතු විද්‍යාත්මක සඟරා තෝරා ගන්නා ලදි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව මෙම කාර්යය 2021 වර්ෂයේ දී නිම කර භාරදීමට නියමිත වේ.

(ඈ) කෞතුකාගාරය නවීකරණය කිරීම

නව විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකළ පසු ඒ තුල කෞතුකාගාරය ස්ථානගත කිරීමට නියමිත හෙයින් එය නිම කරන තුරු මෙම වැඩසටහන කල් දමන ලදී .

MPA-4: යටිතල පහසුකම්, විද්‍යාගාර පහසුකම් සහ විදුම් ධාරිතාවය සංවර්ධනය කිරීම

පාෂාණ විද්‍යා විද්‍යාගාරය

පාෂාණ විද්‍යා විද්‍යාගාරය මගින් උපයන ලද ආදායම

	විස්තරය	**වටිනාකම**
1.	බාහිර සේවා දායකයන් සඳහා සිදුකරන ලද විශ්ලේෂණයන් (නිදර්ශක 365) වැලි නිදර්ශක සඳහා ඛනිජ විද්‍යාත්මක විශ්ලේෂණය- නිදර්ශක 173 තුනී කඩ පිළියෙල කිරීම සහ පාෂාණ විද්‍යාත්මක විශ්ලේෂණය නිදර්ශක 15 වෙනත් (ඛනිජ හඳුනාගැනීම, ඛනිජ අංශු ප්‍රමාණ විශ්ලේෂකය) නිදර්ශක 177	1,706,806.00
2.	සේවාදායකයන්ගේ ඉල්ලීම සඳහා ප්‍රතිචාර ලෙස ක්‍රියාත්මක කරන ව්‍යාපෘති තුනී කඩ පිළියෙල කිරීම (පාෂාණ) නිදර්ශක- විසි හතරයි	144,000.00
3.	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම මත, ව්‍යාපෘති සහ ක්ෂේත්‍ර කටයුතු සඳහා සිදුකරන ලද අනිකුත් විශ්ලේෂණයන් :නිදර්ශක 142	599,400.00
4.	මහේස්ත්‍රාත් අධිකරණ සහ ශ්‍රී ලංකා රේගුව සඳහා සිදු කරන ලද අනිකුත් විශ්ලේෂණයන්	175,500.00

ක්‍රියාකාරී සැලසුම් කටයුතු හා අදාළ ව සිදු කරන ලද කාර්යයන්

කාර්යය	**ඉල්ලීම කරන ලද තැනැත්තා**	**විශ්ලේෂණ වර්ගය**	**නිදර්ශකයේ ස්වභාවය**	**නිදර්ශක සංඛ්‍යාව**
දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද බැර ඛනිජවැලි පරීක්ෂණය	සී එන් බී විජයරත්න මහත්මිය	පූර්ණ ඛනිජ විද්‍යාත්මක විශ්ලේෂණය	වැලි	25
ඛනිජ ගවේෂණ සඳහා කිරිඳිඔයෙහි සිදුකරන ලද ජලධාරා අවසාදිත පරීක්ෂණය	ඒ එස් ජයකොඩි මහතා	පූර්ණ ඛනිජ විද්‍යාත්මක පරීක්ෂණය	අවසාදිතය	25

(ආ) විශ්ලේෂණ විද්‍යාගාරය

විශ්ලේෂණ විද්‍යාගාරය මගින් උපදවන ලද ආදායම

	විස්තරය	**ආදායම වටිනාකම රුපියල්**
1.	බාහිර සේවා දායකයන් සඳහා - නිදර්ශක 493 විවිධ ආයතන සහ තැනැත්තන් විසින් කරන ලද ඉල්ලීම් මත හුණුගල්, තිරුවානා, ඩොලමයිට්, මිනිරන්, ෆෙල්ඩ්ස්පාර්, පස්, වැලි, සිමෙන්ති, මයිකා, බනිජ වැලි, මැටි, වතුර, දිරාගිය පාෂාණ සහ ගඩොල් සහ පිඟන් මැටි භාණ්ඩ මිශ්‍රණයන් සහ අනිකුත් මිශ්‍ර ලෝහ අන්තර්ගතවන නිදර්ශක 493 ක විශ්ලේශනය	2,170,700.00 බදු නොමැතිව
2.	භූ විද්‍යා අංශය විසින් ක්‍රියාත්මක කිරීමට භාර ගන්නා ලද ව්‍යාපෘති ටෝකියෝ සිමෙන්ති විදුම් ව්‍යාපෘතිය - හුණුගල් විශ්ලේෂණය -නිදර්ශක 53	477,000.00
3.	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම මත ඔවුන්ගේ ව්‍යාපෘති /පර්යේෂණ සඳහා- නිදර්ශක 96	1,020,000.00
4.	නියාමන කටයුතු සඳහා සහ විශේෂ ඉල්ලීම් මත නොමිලයේ සිදු කරන ලද විශ්ලේශනයන්- නිදර්ශක 15	102,000.00

ක්‍රියාකාරී සැලැස්ම කටයුතු සඳහා සිදුකරන ලද රසායනික විශ්ලේෂණය

ක්‍රියාකාරී සැලසුම් කටයුත්ත	**නිදර්ශකවල ස්වභාවය සහ සංඛ්‍යාව**
පාද රේඛා වටිනාකම් සොයා අනාවරණය කර ගැනීම සඳහා හම්බන්තොට කාර්මික කලාපයෙහි සිදු කරන ලද පූර්ණ පස් පරීක්ෂණය	100/ mi
පිත්තල කර්මාන්තය හේතුවෙන් සිදුවන පස් අපවිත්‍ර වීම පිළිබඳව පරීක්ෂණ කිරීම සඳහා පිළිමතලාව ප්‍රදේශයේ සිදුකරන ලද පස් පරීක්ෂණය	32/ mi

භූ රසායනික සිතියම් පිළියෙල කිරීම

(i) කලාප අංක 6 : වවුනියාව ත්‍රිකුණාමලය: මැදවච්චිය, පුත්තලම, හොරොව්පතාන, ත්‍රිකුණාමලය, වව්නියාව සහ නිලාවැලි යන 1:50 000 කලාපවලින් එකතු කරන ලද නිදර්ශක 1042ක විශ්ලේෂණ කටයුතු නිම කරන ලද අතර වවුනියාව- ත්‍රිකුණාමලය කලාප අංක 06හි භූ විද්‍යාත්මක සිතියම් පිළියෙල කිරීම සඳහා දත්ත භාර දෙන ලදී.

(ii) කලාප අංක 19- අලුත්ගම-ගාල්ල: අම්බලන්ගොඩ ගාල්ල 1:50,000 කලාප වලින් එකතු කරගන්න ලද පස් නිදර්ශක 356ක නියැදි සැකසීමේ කටයුතු නිම කරන ලදී. බලපිටිය සහ අලුත්ගම 1:50,000 කලාපවලින් එකතු කර ගන්නා ලද පස් නිදර්ශක වලින් මූලික පස් නිදර්ශක පිළියෙල කිරීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී. ප්‍රේරිත ප්ලාස්මා යුග්ම වර්ණාවලිමානය ක්‍රියාවිරහිත වී ඇති හෙයින් ජීර්ණ කටයුතු සහ විශ්ලේෂණ කටයුතු තවමත් ආරම්භ කරනු ලැබ නොමැත.

විද්‍යාගාර ප්‍රතීතන කටයුතු - ISO 17025

තිරිවානා, ඩොලමයිට් සහ ජලය පිළිබඳ රසායනික විශ්ලේෂණය හේතුවෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙහි **ISO/IEC** 170 25: 2005 යන ප්‍රතීතනය 2019 වර්ෂයේ දී විශ්ලේෂණ විද්‍යාගාරය වෙත ප්‍රදානය කරන ලදී.

170 25: 2018 යටතේ ප්‍රතීතනය අලුත් කිරීම සඳහා නැවත ඇගැයීම් කටයුතු 2020 සැප්තැම්බර් 22 සහ 23 යන දිනවලදී සිදු කරන ලදී.

නව විද්‍යාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම

මහල් 6කින් යුතු විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු 2019 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර 2020 වර්ෂය අවසන් වන විට එම කටයුතු නිම කිරීමට අපේක්ෂා කරන ලදි. එසේ වුවද වසංගත තත්වය හේතුවෙන් 2021 වර්ෂය දක්වා එය තවදුරටත් සිදු කිරීමට සිදුවිය.

1.2 සේවාදායකයන්ගේ ඉල්ලීම් සඳහා ප්‍රතිචාර ලෙස ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති - දිගුකාලීන ව්‍යාපෘති

ව්‍යාපෘතිය	සමාගමෙහි නම	කාල පරිච්ඡේදය		භාරව කටයුතු කරන ලබන නිලධාරීන්	ආදායම
		සිට	දක්වා		රු.මිලි
බෝවතැන්න දෙවන උමග- විදුම් කටයුතු සහ වාර්තාව පිළියෙල කිරීම	මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන	2020.01.01	2020.02.10	ඒ.එස්.ජයකොඩි	10.9
සිමෙන්ති කර්මාන්තය සඳහා හුණුගල් පරීක්ෂණය විදුම් කටයුතු සහ වාර්තා පිළියෙල කිරීම	ටෝකියෝ සිමෙන්ති	29.06.2020	30.11.2020	ඒ.එස් ජයකොඩි	1.9
දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ මිනිරම් පරීක්ෂණයක් සඳහා විදුම් කටයුතු වැඩසටහන සහ වාර්තා පිළියෙල කිරීම	එල් ඕ එල් සී ජියෝ ටෙක්නොලොජීස්	22.06.2020	25.10.2020	ඒ.එස් ජයකොඩි	5.9
නාවලපිටිය ප්‍රදේශයේ තිරුවානා ඉල්ලම සහ දුර්ලභ පෘථිවි මූල ද්‍රව්‍ය පරීක්ෂණය	මැච් හිට්	21.01.2020	23.10.2020	ඒ.එස් ජයකොඩි	7.9

මුලතිව් චලෙයි ප්‍රදේශයේ ඛනිජවැලි පරීක්ෂණය	වර්ටිකල් ගෘප් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්	17/06/2020	17/08/2020	එච් පී එම් ද සිල්වා	1.8
මුලතිව් අලම්පිලි ප්‍රදේශයේ ඛනිජ වැලි පරීක්ෂණය	ඩොරිස් ලංකා	17/08/2020	31/08/2020	එච් පී එම් ද සිල්වා	1.8
මුලතිවු අලම්පිලි ප්‍රදේශයේ ඛනිජවැලි පරීක්ෂණය	වර්ටිකල් ගෘප් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්	08/08/2020	07/09/2020	එන් එච් එම් සී නවරත්න	4.1
මන්නාරම තුනුක්කායි ප්‍රදේශයේ ඛනිජ වැලි පරීක්ෂණය	වර්ටිකල් ගෘප් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්	29/06/2020	07/08/2020	එන් එච් එම් සී නවරත්න	1.8
සාම්පූර් ප්‍රදේශයේ ඛනිජ වැලි පරීක්ෂණය	ඩොරිස් ලංකා	5/10/2020	7/10/2020	එච් පී එම් ද සිල්වා එම් එල් ජී එන් ටී ජයතිලක	2.3
ගාල්ල ප්‍රදේශයේ මිනිරන් පරීක්ෂණය	වර්ටිකල් ගෘප් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්	04.09.2020	-	එච් ඒ ඩී එන් සංජීව පේ ඒ සී එම් ජයසූරිය	1.1
ගාල්ල ප්‍රදේශයේ මිනිරන් පරීක්ෂණය	වර්ටිකල් ගෘප් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්	-	23.10.2020	එච් ඒ ඩී එන් සංජීව පේ ඒ සී එම් ජයසූරිය	1.9
මඩකලපුව ප්‍රදේශයේ ඛනිජ වැලි පරීක්ෂණය (EL/388)	ඩොරිස් ලංකා	24.06.2020	-	පේ එල් ජී එස් ජයවර්ධන ඩබ් එම් ආර් ආර් වික්‍රමසිංහ	2.1
මඩකලපුව ප්‍රදේශයේ ඛනිජ වැලි පරීක්ෂණය (EL/390)	ඩොරිස් ලංකා		26.08.2020	පේ එල් ජී එස් ජයවර්ධන ඩබ් එම් ආර් ආර් වික්‍රමසිංහ	4.0

සේවා දායකයන්ගේ ඉල්ලීම් සඳහා ප්‍රතිචාරයක් ලෙස ආරම්භ කරන ලද ව්‍යාපෘති - කෙටිකාලීන

ව්‍යාපෘතිය	සේවාදායකයා	කාල පරිච්ඡේදය		සම්බන්ධ වූ නිලධාරියා	ආධායම (VAT සහිතව%)
		සිට	දක්වා		
පනාගොඩ යුධ හමුදා කඳවුරේ අත්තිවාරම පරීක්ෂා කිරීම	ශ්‍රී ලංකා යුධ හමුදාව	30.06.2020	8.07.2020	ඒ එස් ජයකොඩි	CSR ව්‍යාපෘතියකි.
මැටි පරීක්ෂණය	ඩබ්ලිව් ඒ අයි එස් ප්‍රනාන්දු මහතා			ඩී එම් එස් දිසානායක	34,020.00
නාය යාමක්	සී එස් ද කොස්තා මහතා			එච් එස් ලසන්ත	37,584.00
ගල් පතලක් පරීක්ෂා කිරීම	ධර්මසේන මහතා				52,920.00
ඛනිජ වැලි පරීක්ෂණ මන්නාරම, පුනරින් සහ කල්පිටිය යන ප්‍රදේශ	වර්ටිකල් ගෘප් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්				144,720.00
ඛනිජවැලි පරීක්ෂණය කොස්ගුලාන	කේ එස් එස් කුමාර	18/02/2020	18/02/2020	එච් පී එම් ද සිල්වා ටී පී මධුශංක	27,540.00
මැටි පරීක්ෂණය දංකොටුව	ලියනගේ අරෝෂන් ලසන්ත මහතා				34,560.00
ඛනිජ වැලි පරීක්ෂණ වාර්තාව - කොස්ගුලාන	කේ ටී ප්‍රේමචන්ද්‍ර මහතා	18/02/2020	18/02/2020	එච් පී එම් ද සිල්වා ටී පී මධුශංක	14,040.00
භූ විද්‍යා වාර්තාව කොළඹ	කේ ජී හසාන් සිල්වා මහතා				18,630.00
භූ විද්‍යා වාර්තාව හම්බන්තොට	සීමාසහිත ලංකා ලුණු සංස්ථාව				42,120.00
භූ විද්‍යා වාර්තාව දංකොටුව	ඩී ආර් ඒ එන් පෙරේරා මහතා			ආචාර්ය ස්ටෙරින් ප්‍රනාන්දු	34,020.00
පස් කැපීම හා ඉවත් කිරීම - පිලියන්දල	මධුශාන් නදුෂ මහතා				47,250.00
මැටි පරීක්ෂණය අරියවෙල දංකොටුව	ඩබ් ඒ අයි එස් ප්‍රනාන්දු මහතා	2020.01.13		ඩී එම් එස් දිසානායක	34,560.00
මැටි පරීක්ෂණය ගොඩකුරුව නාරම්මල	එන් ඩබ් අයි සුරංග මහතා	2020.02.12		ඩී එම් එස් දිසානායක	36,936.00

මැටි පරීක්ෂණය හිම්බුඩාව පන්නල	පී එස් ඩී අප්පුහාමි මහතා	2020.02.14	ඩී එම් එස් දිසානායක	35,100.00
මැටි පරීක්ෂණය දික්වෙල, දංකොටුව	ජේ එම් ජේ හිල්ඩා මහත්මිය	2020.07.10	ඩී එම් එස් දිසානායක	39,420.00
මැටි පරීක්ෂණය තඹරවිල , වෙන්නප්පුව	ජේ එම් ජේ හිල්ඩා මහත්මිය	2020.07.10	ඩී එම් එස් දිසානායක	
කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි දල්තර බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයෙහි යෝජිත පස් කැනීම් ව්‍යාපෘතියක් පිළිබඳ මූලික භූ විද්‍යා සමීක්ෂණ වාර්තාව	ඩබ් ධනපාල බොතේජු මහතා	2020.06.17	පී එම් වික්‍රමසිංහ	47,250.00
කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි පුවක්පිටිය ප්‍රදේශයෙහි අයි එම් එල් / සී / එන් / 2020/0160 යන බලපත්‍රය යටතේ යෝජිත කැනීම් ව්‍යාපෘතිය පිළිබඳ මූලික පරීක්ෂණ වාර්තාව - එම් එස් / සී / 93/2020	එච් ඒ මොරිස් පෙරේරා	2020.07.31	පී එම් වික්‍රමසිංහ	42,660.00
දංකොටුව ප්‍රදේශයේ බොරලු කැනීම සඳහා යෝජිත ප්‍රදේශයන් පිළිබඳ පරීක්ෂණ වාර්තාව	ඒ එන් එස් කේ ප්‍රනාන්දු මහතා	17/11/2020	ධරණි විජේසුන්දර	39,420.00
භූ විද්‍යා වාර්තාව දංකොටුව	එල් සමන්ත මහතා			25,650.00
භූ විද්‍යා වාර්තාව දංකොටුව	එල් සමන්ත මහතා			25,650.00
29.08.2020 දින නුවර ප්‍රදේශයේ සිදු වූ භූමිකම්පාව පිළිබඳ වාර්තාව	පීපල්ස් ඉන්ෂුවරන්ස			

නුවර මහියංගන පාරේ ගල් වැටීම් වලින් ආරක්ෂාවීම සඳහා ආරක්ෂණ ක්‍රමෝපායන් සැලසුම් කිරීම සහ ඒ පිලිබඳ ඉදිකිරීම් කටයුතු -භූමි කම්පාව පිලිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීම	එල්ක් නිට්ටොක් එස් ජේ වී				
පුඩාවකට්ටු සහ පුල්මුඩේ ප්‍රදේශයේ ඉඩම් හතරක බනිජ වැලි පැවතීම	ආර් ක්‍රිශාන් මහතා	2020/10/21	2020/10/21	එච් පී එම් ද සිල්වා	8100.00
පුනරින් කවුඩුමුනරි ප්‍රදේශයේ වැලි කඳු සහිත ඉඩමක සංචිත ඇස්තමේන්තු කිරීම.	අජිත් තෙන්නකෝන් මහතා	21.09.2020	22.09.2020	ඒ එම් ඩී යු අබේසිංහ ඩබ් කේ ජී වී වැලිගේපොල	105,840.00
ගල්කඩවල අඹරන ලද ගල් නිපදවනු ලබන ගල් පතල් ස්ථානයක් පිළිබඳ මූලික ක්ෂේත්‍ර පරීක්ෂණය	ලාල් ෆොන්සේකා මහතා			ඒ ඒ සී ප්‍රියන්ත	25,650.00
අම්බලන්තොට ඩ්‍රෝනා පරීක්ෂණය	ඩී එච් සාලිය මහතා	02/06/2020	02/06/2020	ඒ එම් ඩී යු අබේසිංහ ඩබ් කේ ජී වී වැලිගෙපොල	108,270.00
නායයාම් සිද්ධියක් පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම	දයානන්ද වික්‍රමසිංහ මහතා	2020/12/02	2020/12/02	එච් පී එම් ද සිල්වා	19,980.00
වැලි තැන්පත්වීම් පිළිබඳ පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම	එච් ඩී ඥානරත්න මහතා	2020/10/14	2020/10/14	එච් පී එම් ද සිල්වා	25,920.00
වැලි තැන්පත්වීම් පිළිබඳ පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම	කේ ඩබ් ආර් ඩබ් කුඩාවිතාරණ මහතා				36,720.00
වැලි පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම	ඒ එච් එන් එච් ද සිල්වා මහතා	15/12/2020	15/12/2020	ඒ එම් ඩී යු අබේසිංහ ඩබ් කේ ජී වී වැලිගේපොල	87,480.00
ජනවසම ඉඩම් වල කැනීම් කළ හැකි මුළු පරිමාව ඇස්තමේන්තු කිරීම සඳහා මූලික සංචාරය	ජනතා වතු සංවර්ධන මණ්ඩලය :ජනවසම*	09.01.2020	10.01.2020	ඩී ටී කේ කුඩාගම එස් බී හරන්කහව	81,540.00

හම්බන්තොට ලේවාය ඉදි කිරීමේදී කනින ලද පස් පරිමාව ඇස්තමේන්තු කිරීම	ලංකා ලුණු සංස්ථාව	10.03.2020	10.03.2020	එම් එම් පේ පී අජිත් ප්‍රේම ඩී ටී කේ කුඩාගම	42,120.00
හංවැල්ල දොම්පේ ප්‍රදේශයේ ගල් පතලක කැනිය හැකි මුළු පරිමාව ඇස්තමේන්තු කිරීම	රෝඩ්කෙම් ප්‍රයිවට් ලිමිටඩ්	21.07.2020	21.07.2020	කේ ටී යූ එස් ද සිල්වා ඩී ටී කේ කුඩාගම	47,250.00
කැනිය හැකි පස් පරිමාව දළ වශයෙන් ඇස්තමේන්තු කිරීම බටපොල අම්බලන්ගොඩ	ලංකා ලුණු හම්බන්තොට	28.07.2020	28.07.2020	ඩී ටී කේ කුඩාගම ඩබ් කේ ජී වී වැලිගේපොල	1,42,560.00
හංවැල්ල දොම්පේ ප්‍රදේශයේ ගල් පතලක කැනිය හැකි මුළු පරිමාව ඇස්තමේන්තු කිරීම	රෝඩ්කෙම් ප්‍රයිවට් ලිමිටඩ්	29.07.2020	29.07.2020	ඩී ටී කේ කුඩාගම ඩබ් කේ ජී වී වැලිගේපොල	91,800.00
කැනිය හැකි පස් පරිමාව දළ වශයෙන් ඇස්තමේන්තු කිරීම බටපොල අම්බලන්ගොඩ	ලංකා සෙරමික්ස් පීඑල්සී	09.09.2020	19.09.2020	ඩී ටී කේ කුඩාගම ඩබ් කේ ජී වී වැලිගේපොල	102,600.00
මැටිවල ඝනත්වය පරීක්ෂා කිරීම සහ වාර්තාවක් ලබාගැනීම				ආචාර්ය ස්ටෙරින් ප්‍රනාන්දු	29,916.00
බලන්ගොඩ, කල්තෙට ප්‍රදේශයේ අත්හැර දමන ලද තිරිවානා පතලක කැනිය හැකි පරිමාව ඇස්තමේන්තු කිරීම සඳහා මූලික සංචාරය	එන් යූ චන්ද්‍රසේකර	06.10.2020	06.10.2020	ඩී ටී කේ කුඩාගම	34,776.00

අපනයන අනුමත කිරීම් ලිපි නිකුත් කිරීම

අනුරාධපුරය	ඉංජිනේරු සී.කේ කරුණානන්ද , ඉංජිනේරු එස්. ඒ.ජේ කුමාරසිරි, ඉංජිනේරු ආර්.ආර් කුලස්
බදුල්ල	ඉංජිනේරු ඩබ්.ඒ.එස් රූපවංශ, ඉංජිනේරු ඊ.එම්. කේ. බී. ඒකනායක
මඩකලපුව	ඉංජිනේරුඑම්.ආර්.එම් ෆාරිස්, ඉංජිනේරු පී. පවිත්‍රා
කොළඹ	ඉංජිනේරු ඩබ්.ඩී.එම්. පෙරේරා ඉංජිනේරු එන්.ඩබ්.සි.පී. ලංකා
ගම්පහ	ඉංජිනේරු ආර්.එම්.ඩී. රත්නායක ඉංජිනේරු ඩබ්. ගජසිංහ
හම්බන්තොට	ඉංජිනේරු යූ.එච්.ටී. ප්‍රියන්ත , ඉංජිනේරු එස්.පි.කේ පතිරණ
යාපනය	ඉංජිනේරු ඩී. මයුරන්, ඉංජිනේරු සි. ජයරූපන්, ඉංජිනේරු එස්. ක්‍රිෂ්ණකුමාර්,ඉංජීනේරු එස් සිවලිංගම්

කෑගල්ල	ඉංජිනේරු කේ.ජී.ජී කුඹුරුහේන, ඉංජිනේරු ඩබ්. ජී.එස් . කෝකිලා
කළුතර	ඉංජිනේරු ඩබ්.ඒ.ඒ.සී වන්නිආරච්චි, ඉංජිනේරු යූ.එල්.එච් චතුරානි
මහනුවර	ඉංජිනේරු ඒ.පී. විමලසේන , ඉංජිනේරු ජී.වී.ඒ.ඩී ගොඩගම
කුරුනෑගල	ඉංජිනේරු කේ.එන්.ඩබ්.කේ විමලරත්න, ඉංජිනේරු ඩබ්.එම්.එන්.ටී වර්නසූරිය, ඉංජිනේරු කේ චියවර්නන්
මාතලේ	ඉංජිනේරු ඒ.එම්.එච්.වී අධිකාරි. ඉංජිනේරු ඊ.එම්.සී. කේ ඒකනායක
මාතර	ඉංජිනේරු ඩී.එල්.පී.එම් ඩග්ලස්
මොනරාගල	ඉංජිනේරු ටී.එම්.ඩබ්. බණ්ඩාර, ඉංජිනේරු එස්.එස් ලංකා
පොළොන්නරුව	ඉංජිනේරු ඩබ්.එම්.ටී. යූ ජයසිංහ
රත්නපුරය	ඉංජිනේරු ටී.එස්. කුමාර, ඉංජිනේරු එස්.අබේසිංහ
ත්‍රිකුනාමලය	ඉංජිනේරු පීඒ.එස් කුමාරසිංහ, ඉංජිනේරු කේ. විග්නේෂමූර්ති
වවුනියාව	ඉංජිනේරු ජේ.එම්.ඊ.පී.කේ. ජයසේකර

මූල්‍ය සමාලෝචනය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ 2020 වර්ෂයේදී වාර්තා කල ආදායම හා වියදම 2019 වර්ෂයට සාපේක්ෂව පහළ අගයක් පෙන්නුම් කරයි. ඒ සඳහා රටේ පැවති වසංගත තත්ත්වය බෙහෙවින්ම බලපා ඇත. ඒ අනුව 2020 වර්ෂයේදී කාර්යංශය වාර්තා කල ආදායම රු.මිලියන 2246 ක් වන අතර එය 2019 වසරට වඩා 19.7% ක පහත වැටීමකි. එසේම ආයතනයේ 2020 වසරේ වියදම වශයෙන් රු.මිලියන 1472 වාර්තා කර ඇත. එය 2019 වසරට සාපේක්ෂව 44.2 %කි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වසරේ ශුද්ධ ලාභය රු.මිලියන 773.6 ක් වූ අතර එහි වර්ධනය 388 % කි.

2020 වසරේ කාර්යංශයේ සමස්ත ආදායම සඳහා පුරස්කාර ආදායම රු.මිලියන 1602 ක්, බලපත්‍ර ගාස්තු රු.මිලියන 143 ක්, පරීක්ෂා කිරීමේ ගාස්තු රු.මිලියන 252 ක්, විද්‍යාගාර ආදායම රු.මිලියන 3.6 ක්, ව්‍යාපෘති ආදායම රු.මිලියන 24.09 ක්, පොළී ආදායම රු.මිලියන 143.08 ක් සහ අනෙකුත් විවිධ ආදායම් වශයෙන් රු.මිලියන 77.6 ක දායකත්වයක් ලබා දී ඇත.

2017 වසරේ සිට 2020 දක්වා කාර්යංශයේ ආදායම පහත පරිදි විශ්ලේෂණය කල හැකි අතර ඒ අනුව ආයතනයේ ආදායම ක්‍රමක්‍රමයෙන් පහළ අගයක් ගෙන තිබුණි.




ආදයම් වර්ග විශ්ලේෂණය 2017-2020
5000
4500
4000
3500
3000
2500
2000
1500
1000
500
0
රාජ්‍ය භාග ආදයම
බලපත්‍ර ආදයම
පරීක්ෂණ ගාස්තු ආදයම
විද්‍යාගාර ආදයම
වෘත්තීය ආදයම
පොලී ආදයම
වෙනත් ආදයම්
2017
2018
2019
2020

නීති අංශය

■ නීති අංශයෙහි ධූරාවලිය

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දෙන පරිදි)



- **නීති අංශයෙහි වර්තමාන කාර්ය මණ්ඩලය**

1. **කාංචනා ප්‍රනාන්දු මහත්මිය - අධ්‍යක්ෂ (නීති) කාර්ය නියුක්ත**
2. **රංජිත් ප්‍රියන්ත මහතා - සහකාර අධ්‍යක්ෂ (නීති)**
3. **සුරක්ෂිකා ද ෆොන්සේකා මහත්මිය - සහකාර නීති නිලධාරී (කොන්ත්‍රාත් පදනම)**
4. **එච් සී පී පියුමි මෙනවිය - සහකාර නීති නිලධාරී (කොන්ත්‍රාත් පදනම)**
5. **නර්මදා ප්‍රනාන්දු මහත්මිය - සහකාර නීති නිලධාරී (කොන්ත්‍රාත් පදනම)**
6. **තිළිණ විජේසූරිය මහතා - නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී**
7. **ඈන් පද්මිණී මහත්මිය - කළමනාකරණ සහායක**
8. **උදේනිකා ප්‍රේමමාලි මහත්මිය - කළමනාකරණ සහායක**
9. **විනීතා විජයලක්ෂ්මි මහත්මිය - කළමනාකරණ සහායක**
10. **ඉසුරි නදීෂා මෙනවිය - කළමනාකරණ සහායක**
11. **ධම්මික පුෂ්පකුමාර මහතා - කාර්යාල සහායක**

නීති අංශයෙහි කාර්යයන්

- කොන්දේසි උල්ලංඝනය කිරීම් වලට සහ නීති විරෝධී කැනීම් කටයුතු වලට එරෙහිව අලුතින් නඩු පැවරීම / එන්තරවාසි යැවීම - 03

(රටෙහි පවතින වසංගත තත්ත්වය හේතුවෙන් නඩු පවරනු ලැබ නොමැත)

- නීති අංශය විසින් මෙහෙයවන ලද සම්පූර්ණ නඩු සංඛ්‍යාව- 59

ශ්‍රේෂ්ඨාධිකරණය	-	නඩු 10
අභියාචනාධිකරණය	-	නඩු 10
සිවිල් අභියාචනා මහාධිකරණය	-	නඩු 01
මහාධිකරණය	-	නඩු 05
දිස්ත්‍රික් අධිකරණය	-	නඩු 01
මහේස්ත්‍රාත් අධිකරණය	-	නඩු 27
කම්කරු විනිශ්චය සභාව	-	නඩු 02
මානව හිමිකම් කොමිසම	-	නඩු 03

» අධිකරණයේ පෙනී සිටීම - දින 187

» නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් වැටලීම් සිදු කිරීමෙන් අනතුරුව අලුතින් නඩු පැවරීම - 33

ජනවාරි	- 02	ජූලි	- 08
පෙබරවාරි	- 01	අගෝස්තු	- 03
මාර්තු	- -	සැප්තැම්බර්	- 01
අප්‍රේල්	- 01	ඔක්තෝබර්	- 02
මැයි	- 05	නොවැම්බර්	- 07
ජූනි	- 02	දෙසැම්බර්	- 01

» නීති අංශය විසින් මෙහෙයවනු ලබන නඩු සම්බන්ධයෙන් නීතිමය මතය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමග සිදු කරන ලද සාකච්ඡා- 18

» නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් සිදු කරන ලද විමර්ශන සහ වැටලීම්



» විමර්ශන, වැටලීම් සහ නඩු තුළින් රජය වෙත දඩ මුදල් ලෙස එකතු කර දෙන ලද මුළු මුදල - රු. 895,000.00
කාර්යාංශය වෙත ලැබුණු පැමිණිලි මත සිදු කරන ලද වැටලීම් මගින් රජය වෙත අය කර දෙන ලද දඩ මුදල් - රු 785,000.00

නඩු තුළින් රජයට අය කර දෙන ලද දඩ මුදල් - රු 110,000.00

» එන්තරවාසි යැවීම සහ අධිකරණයෙහි නඩු පැවරීම තුළ රාජ්‍ය භාගය ලෙස අය කර ගන්නා ලද මුළු මුදල- රු. 5,247,953.03
එන්තරවාසි යැවීම තුළින් රාජ්‍ය භාගය ලෙස රු. 645,796.07 නඩු පැවරීම / එන්තරවාසි යැවීම තුලින් රු. 4,602,156.96

» නීති උපදෙස් ලබා ගැනීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත ලැබුණු ලිපි - 1579

» පොලිස් ස්ථාන, අධිකරණ, රජයේ බලධාරීන්, යටත් නිලධාරීන්, බලපත්‍රලාභීන් / අයදුම්කරුවන් සහ වෙනත් පිරිස් යැවීම සඳහා ලිපි වාර්තා සිහි කැඳවීම් පිලියෙල කිරීම - 512

» නීති උපදෙස් ලබා දීම සඳහා නීති අංශය විසින් පවත්වාගෙන යනු ලබන ගොනු සංඛ්‍යාව - 677

» නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් සකස් කරන ලද ලිපි සංඛ්‍යාව - 284

» පොලිස් නිලධාරීන් සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සඳහා නීති අංශය විසින් පතල් හා ඛනිජ පනත සම්බන්ධයෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්.

දිස්ත්‍රික්කය	දිනය
කටාන (පොලිස් විද්‍යාලය)	22.01.2020
මන්නාරම	06.03.2020

» භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පිලියෙල කරන ගිවිසුම් - 29

කල්බදු ගිවිසුම්	- 08	ව්‍යාපෘති ගිවිසුම්	- 12
සේවා ගිවිසුම්	- 05	අවබෝධතා ගිවිසුම් (MoU)	- 04

» යක්කල ප්‍රදේශයේ වෙන් කරන ලද ඉඩම් වල හිමිකාරිත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

» පහත සඳහන් සංශෝධන

- අනිකුත් අංශ වල අදහස් ලබා ගැනීම සඳහා පෙබරවාරි, ජුලි, සැප්තැම්බර්, ඔක්තෝබර් සහ දෙසැම්බර් යන මාස වලදී අභ්‍යයන්තර රැස්වීම් පවත්වන ලදී (රැස්වීම් 6 ක් පවත්වන ලදී)
- සංශෝධනය කළ යුතු වැදගත් ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී
- පුනරුත්ථාපනය, කොන්දේසි උල්ලංඝනය කිරීම හා සම්බන්ධ වැරදි සහ නීති විරෝධී ලෙස කනින ලද ඛනිජ සහ ඒ සඳහා යොදා ගත් උපකරණ රාජසන්තක කිරීම සම්බන්ධයෙන් කළ යුතු සංශෝධන හඳුනා ගැනීම
- පහත සංශෝධනය සඳහා අදාළ යෝජනා පිළිබඳ කටයුතු 2020 දෙසැම්බර් මාසයේදී නිම කරන ලදී.

» සම්පූර්ණ රැස්වීම් සංඛ්‍යාව - 75

- කළමනාකාරිත්ව මණ්ඩල රැස්වීම් - 03
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් - 03
- නීති අංශය නියෝජනය වන අනිකුත් අභ්‍යන්තර රැස්වීම් - 60 (අභ්‍යන්තර සාකච්ඡා /අංශ ප්‍රධානී රැස්වීම් / ඉදිරිපත් කිරීම් ආදිය)
- පරිසර අමාත්‍යාංශයේදී අභියාචනා විභාග කිරීම - 05
- පරීක්ෂා කිරීම් - 04

ක්ෂණික ඇමතුම් අංකය - 1921



සාරාංශය

- නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් සිදු කරන ලද වැටලීම්වලින් අනතුරුව කරන ලද අළුතින් නඩු පැවරීම්- 33
- කොන්දේසි උල්ලංඝනය කිරීම සහ නීති විරෝධී කැනීම් කටයුතු සම්බන්ධයෙන් අළුතින් නඩු පැවරීම් - 01
- නීති අංශය විසින් මෙහෙයවන ලද මුළු නඩු සංඛ්‍යාව - 56
- අධිකරණයේ පෙනී සිටීම් - 187
- නීති අංශය විසින් මෙහෙයවන ලද නඩු සම්බන්ධයෙන් නීතිමය උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමග පවත්වන ලද සාකච්ඡා - 18
- නීති උපදෙස් ලබා ගැනීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත ලැබුණු ලිපි- 1579
- නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් සිදු කරන ලද විමර්ශන හා වැටලීම් - 107
- විමර්ශන සහ වැටලීම් තුලින් රජය වෙත දඩ මුදල් ලෙස අය කර දෙන ලද මුළු මුදල- රු 1,160,000
- පොලිස් ස්ථාන, අධිකරණ, රජයේ බලධාරීන්, යටත් නිලධාරීන්, බලපත්‍ර ලාභීන් / අයදුම්කරුවන් සහ අනිකුත් තැනැත්තන් වෙත යැම සඳහා ලිපි වාර්තා සිහි කැඳවීම් පිලියෙල කිරීම - 512
- නීති උපදෙස් ලබා දීම සඳහා නීති අංශය විසින් පවත්වාගෙන යන ලද කැනීම් ලිපි ගොනු - 677

- නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් යවන ලද ලිපි සහ ලිපි ගොනු - 284
- පොලිස් නිලධාරීන් සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් - 02
- අනෙකුත් දැනුවත් කිරීමේ වැඩසටහන් - -
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙනුවෙන් ගිවිසුම් - 29
- රැස්වීම් - 75
- 1921 ක්ෂණික ඇමතුම් අංකය වෙත ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව - 338
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ලබා දෙන ලද මුළු ඉපැයීම්- (රාජ්‍ය භාගය ලෙස සහ එන්තරවාසි සහ අධිකරණයේ නඩු පැවරීම තුලින් උපයන ලද) රු. 5,247,953.03

මානව සම්පත් අංශය

දැක්ම

"මානව සම්පත උපරිම ලෙස භාවිතා කිරීම මගින් කාර්යාංශයෙහි අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ කාර්යයේදී කාර්යාංශයෙහි වඩාත්ම අත්‍යවශ්‍ය ක්‍රමෝපායික ව්‍යාපාරික පාර්ශ්වකරු බවට පත්වීම"

මානව සම්පත් සාරාංශය සහ විශ්ලේෂණය - 2020

සේවා නියුක්තිකයන්ගේ විශ්ලේෂණය

ස්ථිර	600
කොන්ත්‍රාත් පදනම මත	36
පැවරුම් පදනම මත	09
පී එස් එම් බී තාක්ෂණික සේවා සමාගම	55
අභ්‍යාසලාභීන්	89
මුළු සංඛ්‍යාව	789



සේවා ස්ථානය අනුව විශ්ලේෂණය (ස්ථිර සේවක සංඛ්‍යාව)

ප්‍රධාන කාර්යාලය	271
ප්‍රාදේශීය කාර්යාල	329
මුළු සංඛ්‍යාව	600



ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව විශ්ලේෂණය (ස්ථිර සේවක සංඛ්‍යාව)

පුරුෂ	363
කාන්තා	237
මුළු සංඛ්‍යාව	600



කළමනාකාරිත්ව මට්ටම් අනුව විශ්ලේෂණය (ස්ථිර සේවක සංඛ්‍යාව

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	118
කනිෂ්ඨ කළමනාකාරිත්වය	33
කළමනාකරණ සහායකයන්	335
ප්‍රාථමික මට්ටම	114
මුළු සංඛ්‍යාව	600



2020 වර්ෂය තුළ සේවක සුභසාධනය

1. පුද්ගල අනතුරු, සේවක වන්දි සම්බන්ධයෙන් සේවකයන් හට රක්ෂණ සැලසුම් ලබා දීම
2. රක්ෂණ සැලසුමක් තුලින් සේවකයන් හට සැත්කම් සඳහා රෝහල් ගත වීමේදී වැය වූ වියදම් ප්‍රතිපූරණය කිරීම
3. සේවකයන් හට සම්පූර්ණ ශරීර පරීක්ෂාවන් සිදු කර ගැනීම සඳහා අවස්ථාවක් ලබා දීම
4. සේවකයන් හට බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබා ගැනීමේදී වැය වූ වියදම් රු. 40000 ක උපරිමයක් දක්වා ප්‍රතිපූරණය කිරීම
5. කාර්යාංශයෙහි අවුරුදු 20කට වඩා සහ අවුරුදු 25කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් හට රන් පවුම් ප්‍රදානය කිරීම
6. වර්ෂය තුළ විශ්‍රාම ලැබූ හෝ සේවයෙන් අස් වූ සේවකයන් හට ත්‍යාග ලබා දීම

7. සේවකයන්ගේ දුක් ගැනවිලි සඳහා වියදම් ලබා දීමට දුක් ගැනවිලි කමිටුවක් ස්ථාපිත කිරීම
8. සේවකයන් විසින් මූල්‍ය ආයතනවලින් ලබා ගන්නා ලද නිවාස ණය මුදල්වල පොලී මුදලින් 66% ක ප්‍රමාණයක් ප්‍රතිපූරණය කිරීම
9. සේවකයන් හට මාස 10 ක වැටුපට සමාන මුදලක් ආපදා ණය පහසුකමක් ලෙස ලබා දීම
10. සේවකයන් හට දේශීය සහ විදේශීය පුහුණු වැඩ සටහන් මගින් පුහුණුව ලබා දීම
11. බරපතල රෝග අරමුදල තුළින් සේවකයන් හට මූල්‍ය ආධාර ලබාදීම
12. සේවකයන් විසින් සේවයට වාර්තා කිරීමේ විධිමත්භාවය ඉහළ නැංවීම සඳහා සේවකයන් හට ආහාර දීමනාවක් ලබා දීම
13. ප්‍රාථමික මට්ටමේ සේවකයන් හට නිල ඇඳුම් ලබා දීම
14. සාහිත්‍ය මාසය තුළදී පොත් මිලදී ගැනීම සඳහා වැය වූ මුදල් ප්‍රතිපූරණය කිරීම
15. දරු උපතකදී හෝ මරණයකදී සේවකයන් හට මූල්‍ය ආධාර ලබා දීම
16. තම දරුවන් සඳහා පාසල් පොත්, පාවහන් සහ නිල ඇඳුම් මිලදී ගැනීමට සේවකයන් හට මූල්‍ය ආධාර ලබා දීම
17. සේවකයන්ගේ ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. (සා පෙ) අ.පො.ස. (උ. පෙ) විභාගය සමත් දරුවන් හට ත්‍යාග ලබා දීම
18. සේවකයන්ගේ, විශ්ව විද්‍යාලයට ඇතුලත්ව සිටින දරුවන් සඳහා මාසික දීමනාවක් ලබා දීම

2021 වර්ෂය සඳහා සැලසුම්

1. උපරිම සේවක සංඛ්‍යාව අවශ්‍යතාවය තහවුරු කරමින් සහ බඳවා ගැනීම් පටිපාටිය හා ගලපමින් සහ නිවැරදි කරමින් නව සේවක සංඛ්‍යා සැලැස්මක් පිළියෙළ කිරීම සහ අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම
2. සේවකයන්ගේ ඵලදායිත්වය සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා සේවකයන් සඳහා අඛණ්ඩව පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම
3. කොවිඩ් 19 වසංගතය රට පුරා පැතිර යාමේ තත්ත්වය සලකා බලමින් සේවකයන් එකී රෝගයෙන් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂණ පියවර ගැනීම
4. සේවක සුභසාධනය සඳහා කටයුතු කිරීම සහ සේවකයන් වෙත රැකියා තෘප්තිමත්භාවය සැලසීම තුළින් ඵලදායී ප්‍රතිඵලයක් ලබා ගැනීම

ආයතනික පාලනය

ආයතනික යහපාලනය යනු ආයතනයක තරඟකාරිත්වය, වර්ධනය හා තිරසාරත්වය සඳහා මූලික වන සාධකයක් බව ලොව පුරා පිළිගනු ලැබේ. ආයතනික යහපාලනය සඳහා වන සිය කැපවීම තහවුරු කිරීම සඳහා ඉහළ සදාචාරාත්මක වටිනාකම් සහ වගවීමක් සහිතව තම කටයුතු කිරීම කෙරෙහි කළමනාකාරිත්ව මණ්ඩලයෙහි අවධානය යොමු වී ඇත.

අපගේ කාර්යාංශය දිගුකාලින වශයෙන් සාර්ථක වීම සඳහා සහ සිය සේවා දායකයන් සඳහා වටිනා සේවාවක් ලබා දීම සඳහා සමාජීය වශයෙන් වටිනාකමක් සහිත ආයතනයක් බවට පත් විය යුතු වේ. මෙලෙස වටිනාකමක් සහිත ආයතනයක් බවට පත්වීම සඳහා වන අපගේ ප්‍රවේශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකසන ලද ප්‍රබල ප්‍රතිපත්ති හා වටිනාකම් සමුදායක් මත ගොඩනැගී ඇත. නීතිමය නියමයන් සහ යහපත් ක්‍රියාපිළිවෙත් හා අනුකූලව අපගේ පාලනය නිරන්තරවම සමාලෝචනය කිරීමට අපි කටයුතු කරමු.

කාර්යාංශයෙහි වටිනාකම්වල සහ එහි දිගුකාලින දැක්මෙහි භාරකරු වන්නේ කළමනාකාරිත්ව මණ්ඩලයයි. කාර්යාංශය වෙත ක්‍රමෝපායන්, විධානයන් සහ මගපෙන්වීම ලබා දෙනු ලබන්නේ කළමනාකාරිත්ව මණ්ඩලය විසිනි.

ආයතනයෙහි ප්‍රධාන කටයුතු, මූල්‍ය, නීතිමය සහ සේවා දායක කටයුතු ඇතුළු කරුණු ගණනාවක් සම්බන්ධයෙන් යාවත්කාලින තොරතුරු කළමනාකාරිත්ව මණ්ඩලය විසින් ලබා ගනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී රැස්වීම් කටයුතු අතරතුරදී පවා මෙකී තොරතුරු ලබා ගනු ලැබේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පාලනය කරනු ලබන්නේ කළමනාකාරිත්ව මණ්ඩලය විසිනි. පතල් හා ඛනිජ පනතෙහි නියමයන් ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් කළමනාකාරිත්ව මණ්ඩලයෙහි සාමාජිකයන් පත් කරනු ලැබේ. කළමනාකාරිත්ව මණ්ඩලය සාමාජිකයන් 07 දෙනෙකුගෙන් සමන්විත වන අතර එකී සාමාජිකයන් පහත සඳහන් වේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නීති නිලධාරියා කළමනාකාරිත්ව මණ්ඩලයෙහි ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

- කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු
- පරිසරය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු
- භූ විද්‍යාව, කැනිම්, ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය හා නීතිය යන ක්ෂේත්‍ර වල ප්‍රායෝගික අත්දැකීම් ලබා ඇති බවට සහ ඒ ක්ෂේත්‍ර පිළිබඳව දැනුම ලබා ඇති බවට අමාත්‍යාංශයට පෙනී යන සාමාජිකයන් තිදෙනෙකු
- මුදල් විෂය භාර අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙකු
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අධ්‍යක්ෂ ජනරාල් වරයා

කළමනාකාරිත්ව මණ්ඩලයෙහි රැස්වීම්

කළමනාකාරිත්ව මණ්ඩලය මාසිකව රැස් වෙන අතර කළමනාකාරිත්ව මණ්ඩලය විසින් අවශ්‍ය යැයි සිතෙන අවස්ථා වලදි සහ අවශ්‍ය ආකාරයට අමතර රැස්වීම් පවත්වනු ලැබේ. 2020 මූල්‍ය වර්ෂය තුළදී කළමනාකාරිත්ව මණ්ඩල රැස්වීම් 05 ක් පවත්වන ලදී. එළඹෙන ලද තීරණ, මතු කරන ලද ගැටලු සහ ප්‍රකාශ කරනලද විසම්මුතික අදහස් පිළිබඳ තොරතුරු ඇතුලත් කරන ලද කළමනාකාරිත්ව රැස්වීම්වල කාර්ය සටහන් සහ න්‍යාය පත්‍රය කළමනාකාරිත්ව මණ්ඩලයෙහි ලේකම්වරයා විසින් පිළියෙල කරනු ලැබ කළමනාකාරිත්ව මණ්ඩල රස්වීම් පැවැත්වීමට නියමිත දිනයට වැඩ කරන දින තුනකට පෙර සියළුම සාමාජිකයන් වෙත ලබා දීම මගින් ඒ පිළිබඳව තම අදහස් ප්‍රකාශ කිරීමට සාමාජිකයන් වෙත අවස්ථාව ලබා දෙනු ලැබේ. මෙලෙස නිතිපතා පැවැත්වෙන කළමනාකාරිත්ව මණ්ඩල රැස්වීම් වලදී කාර්යාංශයෙහි අංශ ප්‍රධානීන් විසින් කාර්යාංශයෙහි කාර්යසාධනය, මූල්‍ය කාර්යසාධනය ආදිය ඇතුළු විවිධ පැතිකඩ පිළිබඳව තම අදහස් කළමනාකාරිත්ව මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.තම වෘත්තිය අදහස් ඉදිරිපත් කිරීම සහ සාකච්ඡා සඳහා සක්‍රිය ලෙස සහභාගි වීම ඇතුළුව කාර්යාංශයෙහි රැස්වීම්වලට අදාල කටයුතු වලදී සක්‍රියමය කාර්යභාරයක් කළමනාකාරිත්ව මණ්ඩලය විසින් ඉටු කරනු ලැබේ.

මූල්‍ය වාර්තා

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 සාමාන්‍ය ප්‍රතිපත්තී

1.1.1 ආයතනය පිළිබඳව වාර්තා කිරීම

1992 අංක 33 දරන පතල් හා බනිජ පනත ප්‍රකාරව ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හැඳින්විය හැකිය. මෙහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ යන ස්ථානයේ පිහිටා ඇත. නුවර, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, මොනරාගල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කළුතර, යාපනය, මඩකලපුව, ගම්පහ, පොළොන්නරුව, මන්නාරම,වවුනියාව,මාතලේ සහ කොළඹ යන නගරවල පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාල 19ක් මගින් භූ. ස. ප. කා. වර්තමානයේදී ක්‍රියාත්මක වේ.

1.1.2 පරිපාලිත සහ උප පරිපාලිත සමාගම්

සී/ස ජී. එස්. එම්. බී තාක්ෂණික සේවා පුද්ගලික සමාගමෙහි නිකුත්ව ඇති කොටස්වලින් 66% ක (කොටස් 400,000) කාර්යාංශය විසින් ආයෝජනය කරනු ලැබ ඇත. එහි ලියාපදිංචි කාර්යාලය අංක 190/ඒ, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ යන ස්ථානයේ පිහිටා ඇත.

සී/ස ජී. එස්. එම්. බී තාක්ෂණික සේවා පුද්ගලික සමාගමෙහි ප්‍රධාන කටයුතු වන්නේ වෙළෙඳපොලහි වැලි මිල පාලනය කිරීම සහ නියාමනය කිරීම සඳහා වෙළෙඳ කටයුතු සහ වෙළෙඳපොල වෙළඳ කටයුතු ක්‍රියාත්මක කිරීමයි. ප්‍රධාන වශයෙන්ම ඉදි කිරීම් අංශය සඳහා සහාය වීම සඳහා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස මෙම සමාගම විසින් සහනදායී මිලට වැලි අලෙවි කිරීම සිදු කරනු ලබන අතර වෙළෙඳ කටයුතු සඳහා ස්ථාන සමාගම විසින් ස්ථාපිත කරනු ලැබ ඇත. එලෙසම පුද්ගලික සමාගම විසින් සේවාදායකයන් සඳහා තාක්ෂණික සහාය සේවා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මිනිස් බලය ලබා දීම වැනි සේවා සහ තාක්ෂණික විශේෂඥ දැනුම ආශ්‍රිත කටයුතු සිදු කරනු ලබන අතර ඒවා භූ. ස. ප. කා. හි බලතල යටතට අයත් නොවේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සභාපතිවරයා සී/ස ජී. එස්. එම්. බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගමෙහිද සභාපතිවරයා වන අතර භූ. ස. ප. කා. හි වෙනත් කිසිදු අධ්‍යක්ෂවරයකු / අධ්‍යක්ෂවරුන් හෝ සේවකයන් පරිපාලිත සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු නොලැබේ.

1.1.3 ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම

පරිපාලිත සමාගමෙහි ගිණුම් වර්ෂය මව් සමාගම වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ගිණුම් වර්ෂයට වඩා වෙනස් වන හෙයින් ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කිරීමට හැකි වනු පිණිස භූ. ස. ප. කා. හි ගිණුම් වර්ෂය හා ගැලපෙන ලෙස තම ගිණුම් කාල පරිච්ඡේදය නිත්‍යානුකූල ලෙස වෙනස් කිරීමට පරිපාලිත සමාගම විසින් පියවර ගනු ලැබ ඇත. මව් සමාගම වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ පරිපාලිත සමාගම වන සී/ස ජී. එස්. එම්. බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගම යන ආයතන දෙකෙහිම විගණකවරුන් වන්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුව වන හෙයින් පරිපාලිත සමාගමෙහි ගිණුම්කරණ කාල පරිච්ඡේදය නිත්‍යානුකූල ලෙස වෙනස් කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ සහ බදු දෙපාර්තමේන්තුවෙහි නිෂ්කාශනය ලද වහාම ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම සිදු කරනු ඇත.

1.14 නිකුත් කිරීම සඳහා බලය ලබා දීමේ දිනය

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2021 පෙබරවාරි මස 24 දින දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය ලබා දෙන ලදී.

1.1.5 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

ශ්‍රී ලංකාව ක්‍රමානුකූල ලෙස භූ විද්‍යා සිතියම්ගත කිරීම සහ භූ විද්‍යා සිතියම් පිළියෙල කිරීම සඳහා කටයුතු කිරීම, ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, එවැනි ඛනිජ කැනීම, සැකසීම සහ අපනයනය සඳහා වාණිජමය ශක්‍යතාවය ඇගයීමට ලක් කිරීම, බලපත්‍ර නිකුත් කිරීම මගින් ඛනිජ ගවේෂණය හා කැනීම, ඛනිජ සැකසීම, වෙළඳාම් කිරීම සහ අපනයනය කිරීම නියාමනය කිරීම, වාණිජමය පදනමකින් ඛනිජ නිස්සාරණය කිරීම සහ නිෂ්පාදනය කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම, පනත යටතේ කාර්යයන් ඉටු කිරීමේදී ලබා ගන්නා තොරතුරු හා දත්ත සුදුසු ජනමාධ්‍යයන් තුළ ප්‍රචාරය කිරීම, ඉංජිනේරු භූ විද්‍යාව හා සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට භාර ගැනීම සහ භූ උවදුරු සහ ව්‍යසන සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සහ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

1.1.6 පිළියෙල කිරීමේ පදනම

(අ) අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්කම් වීමේ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මූල්‍ය ප්‍රකාශන තුළ අඩංගු වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූල වන ලෙස මෙම ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇත.

(ආ) ඇගයීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකමට අදාළව යෝග්‍ය අනාවරණයන් සිදු කරනු ලබන අවස්ථාවලදී හැර ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇත.

(ඇ) මූල්‍යමය සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි භාවිතා වන සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරන ලද සියලුම මූල්‍යමය තොරතුරු, අන් ආකාරයකින් සඳහන් කරනු ලැබ නොමැති නම්, ආසන්නතම රුපියලට වටයනු ලැබ ඇත.

(ඈ) ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම මගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් සහ ඇස්තමේන්තු ප්‍රමාණයන් යෙදවීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහිත උපකල්පන සිදු කිරීම සඳහා කළමනාකාරිත්වයට නියම කරනු ලැබේ. භාවිතා කරන ලද මෙම ඇස්තමේන්තු සහ නිගමන වලින් තථ්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛන්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන එම කාලසීමාවට පමණක් බලපාන්නේ නම් හෝ අනාගත කාලපරිච්ඡේද සඳහා ද බලපාන්නේ නම් හෝ එම සංශෝධනයන් ප්‍රතිශෝධනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලැබූ මුදල් ප්‍රමාණයන් වෙත වඩාත්ම සුවිශේෂී බලපෑම් ඇති කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම හා සම්බන්ධ වැදගත් විනිශ්චයන්, අස්ථාවර තත්ත්වයන් හා සුවිශේෂී ඇස්තමේන්තු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් තුළ ඇතුළත් කරනු ලැබේ.

1.1.7 මූල්‍ය ප්‍රකාශන තුළ අයවැය තොරතුරු ඉදිරිපත් කිරීම

වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූලිකව අනුමත කරන ලද අයවැය, එකී අයවැය තුළ නැවත ප්‍රතිපාදන වෙන් කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් සහ යම් යම් අවස්ථාවලදී කාර්යාංශයේ කටයුතු ඉටු කිරීම සඳහා ගන්නා ලද තීරණ හේතුවෙන් සංශෝධනය කරන ලදී.

1.2 වත්කම් සහ එකී වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.2.1 දේපල, පිරියත හා උපකරණ

(අ) හඳුනා ගැනීම සහ ඇගයීම

දේපල, පිරියත හා උපකරණ ඒවායේ සමුච්චිත ක්ෂය ප්‍රමාණයන් හා හානිකරන අලාභයන් අඩු කර ඒවායේ පිරිවැය හෝ සාධාරණ වටිනාකම මත සඳහන් කරනු ලැබේ.

ශේෂ පත්‍රය තුළ පෙන්නුම් කරන ලද බත්තරමුල්ල සහ ඔරුගොඩවත්ත දේපළ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ගිණුම්කරණ වර්ෂය තුළදී ගලපන ලදී.

එලෙසම පිරියත, යන්ත්‍රෝපකරණ, යටතේ විදුම් අමතර කොටස් සහ ක්ෂේත්‍ර උපකරණ විදුම් සහ අනිකුත් පාරිභෝජ්‍ය භාණ්ඩ මීට කලින් පෙන්නුම් කරනු ලැබීම වර්ගීකරණය පිළිබඳ දෝෂයක් වන අතර වර්තමාන මූල්‍ය වර්ෂය තුළදී ජංගම වත්කම් යටතේ 'විදුම් සහ අනිකුත් පාරිභෝජ්‍ය භාණ්ඩ' නැවත වර්ගීකරණය කරනු ලැබ ඇත.

ස්ථාවර වත්කම් වල අවම වටිනාකම රු. 5000 ලෙස භූ. ස. ප. කා. විසින් සලකනු ලබන අතර දේපල, පිරියත හා උපකරණ යටතේ අඩංගු සියලුම භාණ්ඩ සමුච්චිත ක්ෂය කිරීම් හෝ හානිකරණ අලාභ අඩු කර පිරිවැය මත මූලිකව සටහන් කරනු ලැබේ. වත්කමක සුවිශේෂී සංරචක හඳුනාගෙන වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. යම් කාල ප්‍රාන්තර තුළදී දේපලක, පිරියතක හා උපකරණයක සුවිශේෂී කොටස් ප්‍රතිස්ථාපනය කරනු ලැබීම අවශ්‍ය විට දී, ආයතනය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස පිළිගැනීම නවතා අළුතින් එක් කරන ලද කොටස එහි ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂය කිරීම් සහිතව පිළිගනු ලැබේ. අනිකුත් සියළුම ප්‍රතිසංස්කරණ සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද ආකාරය අනුව ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ.

(ආ) පිරිවැය

දේපලක, පිරියතක හා උපකරණයක පිරිවැය තුළ එය මිලදී ගනු ලැබූ වටිනාකම සහ එකී වත්කම එමගින් අපේක්ෂිත ප්‍රයෝජනය ලබා ගත හැකි තත්ත්වයට පත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි කිසියම් වූ පිරිවැය ඇතුළත් වේ.

වත්කම් වල ඉපැයීම් ශක්‍යතාවය අඛණ්ඩව පවත්වාගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන ද්විතියික වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

දේපලක, පිරියතක සහ උපකරණයක අඩංගු සංරචකයක අනාගත ආර්ථික ප්‍රතිලාභ භූ. ස. ප. කා. වෙත ගලා යනු ලැබේ නම් එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් පමණක් ප්‍රධාන පරීක්ෂා කිරීමේ හා ප්‍රතිසංස්කරණ වියදම් ඇතුළුව වෙනම ගිණුම්ගත කරනු ලබන එකී සංරචකය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වැය වන වියදම ප්‍රාග්ධනීගත කරනු ලැබේ.

(ඇ) ප්‍රතිස්ථාපන පිරිවැය

මූලිකව තක්සේරු කරන ලද කාර්යසාධන තත්ත්වයකින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිස්ථාපනය කිරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව සඳහා දරනු ලබන වියදම දරනු ලබන අවස්ථාවේදී වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

(ඈ) යම් යම් තෝරාගත් වත්කම් කාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම

යම් යම් තෝරා ගත් කාණ්ඩවලට අයත් ස්ථාවර වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කිරීමට කාර්යාංශය විසින් තීරණය කරන ලද අතර ආරම්භකව තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු විසින් ක්ෂේත්‍ර උපකරණ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ පමණක් ප්‍රත්‍යාගණනය කරන ලදී.

කෙසේ වුවද, තක්සේරු කරන ලද භාණ්ඩවල ප්‍රභේදනයක් අප වෙත එවන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අප විසින් දන්වන ලද අතර මෙම ගිණුම් වර්ෂය අවසානයේදී භූ. ස. ප. කා. වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ සාරාංශයක් පමණක් වන හෙයින් එකී තොරතුරු ලැබුණු විට පමණක් ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් හා සම්බන්ධ සටහන් ගිණුම් පොත්වල ඇතුළත් කළ හැකිය.

ඉදිරියේදී එවැනි වත්කම් සෑම අවුරුදු 5කට වරක් ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රතිපත්තියක් ලෙස භූ. ස. ප. කා. විසින් අනුගමනය කරනු ලබන අතර මීළඟ මූල්‍ය වර්ෂය අවසානයේදී මෝටර් වාහන සහ සන්නිවේදන උපකරණ ප්‍රත්‍යාගණනය කරනු ඇත.

(ඉ) ක්ෂය කිරීම්

සියලුම දේපොළ, පිරියත සහ උපකරණ අදළ පිරිවැය ලියා හැරීමේදී සරල මාර්ග ක්ෂය ප්‍රතිපත්තිය අනුව විස්තීරණ ආදායම් ප්‍රකාශයට ක්ෂය කිරීම ගලපන අතර ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත සින්නක්කර අයිතිය හිමි ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්කමක් ප්‍රයෝජනයට ගැනීමට පහසුකම් සලස්වන අවස්ථාවේදී එහි ක්ෂය කිරීම් ආරම්භ කරනු ලබන අතර වත්කම් විකිණීම සඳහා ඇති වත්කමක් බවට නියම කරනු ලබන දිනය සහ වත්කමක් සටහන් තුළ හඳුනාගැනීම නතර කරනු ලබන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයේදී ක්ෂය කිරීම නතර කරනු ලැබේ.

කිසියම් දේපලක්,පිරියතක් සහ උපකරණයක් බැහැර කරනු ලැබීමේ දී හෝ එය භාවිතා කිරීම තුළින්, කිසිදු අනාගත ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන විටක දී එකී දේපල, පිරියත, සහ උපකරණය හඳුනාගැනීම නතර කරනු ලැබේ. වත්කමක් සටහන් තුළ හඳුනාගැනීම නතර කරනු ලැබීම මත සිදුවන කිසියම් ලාභයක් හෝ අලාභයක් වත්කම හඳුනාගැනීම නතර කරනු ලබන වර්ෂයෙහි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

ප්‍රධාන වාර්ෂික අනුපාතයන් පහත දැක්වෙන පරිදි වේ.

වත්කම් ප්‍රභේදය	ප්‍රයෝජනවත් ආයු කාලය	ක්ෂය කිරීම් අනුපාතය
ගොඩනැගිලි	අවුරුදු 20	5%
පිරියත හා යන්ත්‍රෝපකරණ	අවුරුදු 08	12.5%
විද්‍යාගාර උපකරණ	අවුරුදු 05	20%
මෝටර් වාහන	අවුරුදු 05	20%
ගෘහභාණ්ඩ හා උපාංග	අවුරුදු 10	10%
කාර්යාල උපකරණ	අවුරුදු 05	20%
ක්ෂේත්‍ර උපකරණ	අවුරුදු 05	20%
සිතියම් උපකරණ	අවුරුදු 05	20%
සන්නිවේදන උපකරණ	අවුරුදු 08	12.5%
විද්‍යාගාර පොත්පත් හා සිතියම්	අවුරුදු 20	5%

1.2.2 කෙරීගෙන යන වැඩ

වැරැල්ලවත්ත වැඩ බිමෙහි ,පිටකෝට්ටේ විද්‍යාගාර ගොඩනැගිල්ලෙහි සහ අනුරාධපුරය, රත්නපුරය, සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාලවල ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ නොමැත.

එසේ හෙයින් ගිණුම් වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් නිම කිරීමේ ප්‍රතිශතය සහ වටිනාකම තහවුරු කරන සහතිකයක් සුදුසුකම් ලත් සිවිල් ඉංජිනේරුවරයෙකු වන කේ. ඒ. මුණසිංහ (වරලත් ඉංජිනේරු) වෙතින් අප විසින් ලබා ගෙන ඇත. කුරුණෑගල සහ අම්පාර බුද්ධංගල සුනාමි පී.එෆ්.ඉසඩ් මධ්‍යස්ථානවල මූලික ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලදි.

1.2.3 භාණ්ඩ ලේඛනය

පිරිවැය සහ ශුද්ධ උපලබ්ධිගත වටිනාකම යන දෙකෙන් අඩු අගය මත භාණ්ඩ ලේඛන සඳහන් කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධිගත වටිනාකම යනු ඇස්තමේන්තු කළ නිම කිරීම් පිරිවැය සහ විකුණුම් වියදම් අඩු කරන ලද, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ ඇස්තමේන්තු කළ විකුණුම් මිලයි. යල් පැන ගිය සහ සෙමින් භාවිතා කරනු ලබන භාණ්ඩවල හානිය අඩු කරන ලද, භාණ්ඩ අත්පත් කර ගැනීම සහ ඒවා දැනට පවතින ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා වැය කරනු ලබන වියදම පිරිවැයට ඇතුළත් වේ. තොග නිකුත් කිරීමේදී පළමුව ලැබෙන භාණ්ඩය පළමුව නිකුත් කිරීමේ ක්‍රමවේදය භූ. ස. ප. කා. විසින් භාවිතා කරනු ලැබේ.

යම් යම් විදුම් සහ පාරිභෝජ්‍ය භාණ්ඩ පසුගිය වර්ෂය තුළදී 'පාරිභෝජ්‍ය භාණ්ඩ' යටතේ දෝෂ සහගත ලෙස වර්ගීකරණය කරන ලද බවට අනාවරණය වූ අතර එම වර්ගීකරණ දෝෂය මේ වන විට නිවැරදි කරනු ලැබ ඇත.

1.2.4. වත්කම් හානිය.

කිසියම් හානියක් පිළිබඳව වාර්තා කරනු ලැබ තිබේද යන්න තීරණය කිරීම සඳහා එක් එක් වත්කම පිළිබඳව වාර්තා කරනු ලබන දිනයේදීම වත්කම්වල ධාරණ වටිනාකම සමාලෝචනය කරනු ලැබේ. එවැනි කිසියම් හානියක් පිළිබඳව වාර්තා වේ නම් වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ වත්කම් ඒකකයක ධාරණ වටිනාකම එහි අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යයි නම් හානිකරණ අලාභයක් හඳුනාගනු ලැබේ. අය කර ගත හැකි වටිනාකම තීරණය කිරීම සඳහා භාවිතා කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇති නම් හානිකරන අලාභයන් ප්‍රතිවර්තනය කරනු ලැබේ.

1.2.5 මූල්‍ය වත්කම්

වටිනාකම් පියවීම සඳහා භූ . ස. ප. කා. සතුව නීතිමය හිමිකමක් ඇති සහ වත්කම උපලබ්ධි කර වගකීම පියවීම එකවර සිදු කිරීම හෝ ශුද්ධ පදනමක් මත පියවීම යන කාර්යයන් දෙකෙන් එකක් සිදු කිරීමට අදහස් කරන අවස්ථාවකදී, සහ එවැනි අවස්ථාවකදී පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මූල්‍ය වත්කම් සහ වගකීම් පියවා ශුද්ධ වටිනාකම ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ.

භූ . ස. ප. කා. හි මූල්‍ය වත්කම් තුළට මුදල් සහ කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනිකුත් ලැබිය යුතු දෑ ඇතුළත් ය.

(අ) ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ තුළට වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, අනිකුත් ලැබිය යුතු දෑ සහ මුදල් හා මුදල් තුල්‍යයන් ඇතුළත් වේ.

ගිවිසුම්ගත වටිනාකම් මත ඇති සේවක ණය වාර්තා කිරීමට සහ ඉදිරිපත් කිරීමට භූ . ස. ප. කා. විසින් අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

(ආ) කල් පිරෙන තෙක් රඳවා ගත් ආයෝජන

ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් මත ස්ථාවර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල් පිරෙන තෙක් රඳවා ගැනීමට භූ . ස. ප. කා. හට නිශ්චිත චේතනාවක් හා හැකියාවක් පවතින විටදී කල් පිරෙන තෙක් රඳවා ගත් දෑ ලෙසට වර්ගීකරණය කරනු ලැබේ. රජයේ සුරැකුම්පත් සහ ස්ථිර තැන්පතු තුළ සිදු කර ඇති ආයෝජන කල් පිරෙන තෙක් රඳවා ගත් ආයෝජන යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇත.

1.2.6 මූල්‍ය වත්කම්වල හානිය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානියට ලක් වී තිබේද යන්න පිළිබඳව විෂය මූලික සාක්ෂි තිබේද යන්න එක් එක් වාර්තාකරණ දිනයේදී භූ . ස. ප. කා. විසින් තක්සේරු කරනු ලබන අතර එවැනි හානියක් සිදු වී ඇත්නම්, වත්කමෙහි ධාරන වටිනාකම සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගැලීම්වල වර්තමාන වටිනාකම අතර වෙනස සැලකිල්ලට ගනිමින් හානි වූ වටිනාකම ගණනය කරනු ලැබේ.

1.2.7 මුදල් හා මුදල් තුල්‍යයන්

අත ඇති මුදල් සහ බැංකුවෙහි ඇති තැන්පතු මුදල් හා මුදල් තුල්‍යයන්ට ඇතුළත් වේ.

1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත්තේ ඉල්ලීමක් කළ හැකි අවස්ථාවකදී හෝ වාර්තා කරන දිනයේ සිට අවුරුද්දක කාලයක් තුළ ගෙවිය යුතු වන වගකීම් ය. ජංගම නොවන වගකීම් වනුයේ වාර්තා කරන දිනයේ සිට අවුරුද්දක කාලයකට පසුව ගෙවිය යුතු වන ශේෂයන් ය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී එම සියළුම දැනුවත් වගකීම් ගිණුම්ගත කර ඇත. අතීත සිදුවීමක් හේතුවෙන් භූ . ස. ප. කා. සතුව නීතිමය හෝ අනුමිත වගකීමක් ඇති සහ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වන අවස්ථාවකදී ප්‍රතිපාදන සහ වගකීම් හඳුනාගනු ලැබේ.

1.3.1 බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන

ණය ගනුදෙනු කලින් අත්සන් කරන ලද ගිවිසුම් මත භාරගනු ලබන ව්‍යාපෘති කටයුතු සඳහා එළඹීම කාර්යාංශය විසින් සීමා කරනු ලැබ තිබුණද එවැනි ගිවිසුම් මත කාර්යාංශය වෙත දිගු කාලයක් තිස්සේ අය විය යුතුව තිබෙන යම් යම් මුදල් ප්‍රමාණයන් ඇති අතර පහත සඳහන් නිර්ණායක යොදා ගනිමින් එවැනි නොගෙවා ඇති මුදල් ප්‍රමාණයන් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබ ඇත.

ණයකරුවන් විසින් නොගෙවා ඇති මුදල් ප්‍රමාණය	වර්ෂයකට අඩු කාලයක් තිස්සේ නොගෙවා තිබෙන	අවුරුද්දකට වඩා වැඩි සහ අවුරුද්ද දෙකකට වඩා අඩු කාලය-ක් තිස්සේ නොගෙවා තිබෙන	අවුරුදු දෙකකට වඩා වැඩි අවුරුදු තුනකට වඩා අඩු කාලයක් තිස්සේ නොගෙවා ඇති	අවුරුදු තුනකට වඩා වැඩි සහ අවුරුදු හතරකට වඩා අඩු කාලයක් තිස්සේ නොගෙවා තිබෙන	අවුරුදු පහකට වඩා වැඩි කාලයක් තිස්සේ නොගෙවා තිබෙන
ප්‍රතිපාදන ප්‍රමාණය	ප්‍රතිපාදන නොමැත	ණයකරවැන් ගෙවිය යුතු මුදලින් 40%	ණයකරුවන් ගෙවිය යුතු මුදලින් 50%	ණයකරුවන් ගෙවිය යුතු මුදලින් 60%	100% ක ප්‍රතිපාදන

1.3.2 ප්‍රදානයන්

1.3.2.1 ප්‍රදානයන් ගිණුම්ගත කිරීම

භූ. ස. ප. කා. විසින් දරන ලද වියදම් හානිපූරණය කරනු ලබන ප්‍රදානයන් එකී වියදම් හඳුනාගනු ලබන කාල පරිච්ඡේදය තුළදීම විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. වත්කමක් සඳහා භූ. ස. ප. කා. විසින් දරන ලද පිරිවැය හානිපූරණය කරනු ලබන ප්‍රදානයන් එකී වත්කමෙහි ප්‍රයෝජනවත් ආයු කාලය තුළ දී , ක්‍රමානුකූල පදනමක් මත, විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

1.3.3 සේවක ප්‍රතිලාභ

(අ) විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

සියළුම සුදුසුකම් ලත් සේවකයන් සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව නියම කර ඇති ප්‍රතිලාභ සැලැස්ම භූ . ස. ප. කා. විසින් සම්මත කර ඇත. ප්‍රතිලාභ සැලැස්ම සඳහා මූල්‍ය සම්පාදනය කරනු නොලැබේ. රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - සේවක ප්‍රතිලාභ යන ප්‍රමිතිය සැලකිල්ලට ගනිමින් භූ . ස. ප. කා. විසින් පාරිතේෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සාමාන්‍යයෙන් වයස, සේවය කළ හා වන්දි ලබා දුන් අවුරුදු ගණන යන සාධක වලින් එකක් හෝ කිහිපයක් මත පදනම් වෙමින් සේවකයෙකු හට විශ්‍රාම ලැබීමේ දී ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් ඇස්තමේන්තු කරනු ලැබේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් රැකියා සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනය විසින් ස්ථාවර දායකත්ව මුදලක් වෙනම ආයතනයක් වෙතට ගෙවනු ලබන අතර ඊට අමතරව වැඩිදුර මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා නීතිමය හෝ සාධනීය වගකීමක් ඇති නොවේ. නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්ව මුදල් ගෙවීම සඳහා වන වගකීම් එකී වගකීම් ඇති වන පරිදි සහ ඇති වන විට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

(ඇ) සේවක අර්ථසාදක අරමුදල

භූ . ස. ප. කා. විසින් සහ එහි සේවකයන් විසින් එක් එක් සේවකයාගේ වැටුපෙන් පිළිවෙලින් 15% සහ 10% ප්‍රමාණයක් සේවක අර්ථසාදක අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

කෙසේ වුවද සේවක දායකත්ව මුදල්වලින් නිවැරදි අනුපාතය පවත්වාගෙන යාම සඳහා භූ . ස. ප. කා. විසින් කම්කරු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාවක් පවත්වා ඇත.

(ඈ) සේවකයන්ගේ භාර අරමුදල

එක් එක් සේවකයාගේ වැටුපෙන් 3% ප්‍රමාණයක් භූ . ස. ප. කා. විසින් සේවකයන්ගේ භාර අරමුදල වෙත දායක කරනු ලැබේ.

1.3.4 වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැය මත සඳහන් කරනු ලැබේ.

1.3.5 බදුකරණය

2016 අංක 10 දරණ දේශීය ආදායම් පනත සහ 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනත ප්‍රකාරව බදුකරණ කාර්යයන් සඳහා ගැලපීම් සිදු කරන ලද පරිදි වර්ෂය තුළ ලාභය මත පදනම්ව බදුකරණය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. 2018.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තම මුළු ඉපැයීම් මත පදනම්ව කාර්යාංශය විසින් බදු ගෙවීමට යටත් වන අතර ක්‍රියාත්මක වන දිනෙන් පසුව ඉපැයීම් සඳහා 24%ක අනුපාතයකට බදු ගණනය කරනු ලැබේ.

වගකීමට ලක් වන ආදායම මත ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වේ. ආර්ථික සේවා ගාස්තු යටතේ ගෙවීමට වගකීමක් ඇති සියළුම මුදල් භූ . ස. ප. කා. විසින් ගෙවා ඇත.. ආර්ථික සේවා ගාස්තු ආදායම් බදු වගකීම් සමග හිලව් කරනු ලැබේ

භූ . ස. ප. කා. විසින් එකතු කළ අගය මත බද්ද ගෙවීමට වගකීමට ලක් වන අතර එකතු කළ අගය මත බදු පනතෙහි විධිවිධාන හා අනුකූලව කටයුතු කරනු ලැබ ඇත. ගෙවිය යුතු එකතු කළ අගය මත බදු සහ / හෝ අයකරගත හැකි ප්‍රමාණයන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ දක්වනු ලැබේ.

1.1.1 විලම්භිත බදුකරණය

ශේෂ පත්‍ර දිනයට විලම්භිත බදු වගකීම රු.60,253,441.35 වේ.

1.3.7 විදේශ මුදල් ගනුදෙනු

ගනුදෙනු සිදු කරන ලද අවස්ථාවේදී බලපැවැත්වූ විනිමය අනුපාත මත සියළුම විදේශ විනිමය ගනුදෙනු, වාර්තාකරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ'

1.3.8 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

අසම්භාව්‍ය වගකීම් යනු පැවතීමට ඉඩකඩ ඇති වගකීම් වන අතර ඒවායේ පැවතීම සනාථ කරනු ලබන්නේ අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් මගින් පමණි. එහිදී ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු විය නොහැකි හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි හෝ වේ. භූ . ස. ප. කා. හි ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් පහත සඳහන් කරනු ලැබ ඇති ආකාරයට අනාවරණය කරනු ලැබේ.

01. පසුගිය වර්ෂවල බදු ප්‍රමාද කිරීම් / එකතු කළ අගය මත බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් තක්සේරු / දැනුම්දීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇත. කෙසේ වුවද මෙම කාරණය සම්බන්ධයෙන් භූ . ස. ප. කා. විසින් අභියාචනා ඉදිරිපත් කරනු ලැබ ඇත. මෙය තවමත් සාකච්ඡා කරනු ලබමින් පවතින හෙයින් නිශ්චිත ප්‍රමාණය තක්සේරු කිරීමට අපට හැකියාවක් නොමැත.

02. බදුල්ල ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රය 2010- 2011 කාල පරිච්ඡේදය තුළදී භූ . ස. ප. කා. විසින් කුලියට ගෙන තිබූ අතර එහි ගින්නක් ඇති වී තිබුණි. භූ . ස. ප. කා. පාර්ශ්වයෙහි නොසැලකිල්ල හේතුවෙන් ගින්න හට ගෙන ඇති බව ඉඩම් හිමියාගේ අදහස වන අතර අලාභ වශයෙන් රු. 1,136,348 ක මුදලක් ඉල්ලා සිටිමින් නඩු අංක එච් 7523 යටතේ ඔහු විසින් බදුල්ල දිසා අධිකරණයෙහි නඩුවක් පවරා ඇත. කෙසේ වුවද ගින්න හේතුවෙන් ගොඩනැගිල්ලට සිදුවූ අලාභය සම්බන්ධයෙන් භූ . ස. ප. කා. වගකිව යුතු නොවන බව නීතිපතිවරයාගේ අදහස වන අතර මෙම නඩු තවමත් විභාග වෙමින් පවතින හෙයින් ගිණුම් පොත්වල ප්‍රතිපාදන වෙන් කර නොමැත.

1.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

1.4.1 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ භූ . ස.ප. කා. වෙත ගලා යාමට සහ එය විශ්වසනීය ලෙස මැනීමට හැකියාව ඇති ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු හැර ලැබී ඇති හෝ ලැබිය යුතු ප්‍රතිඵලයෙහි සාධාරණ අගය මත ආදායම මනිනු ලැබේ. ආදායම හඳුනාගැනීමේ කාර්යය සඳහා පහත සඳහන් විශේෂිත නිර්ණායක භාවිතා කරනු ලැබේ.

(ආ) පොළී ආදායම

වත්කම් මත සඵල ආදායම සැලකිල්ලට ගනු ලබන කල අනුමාන පදනමක් මත පොළී ආදායම හඳුනාගනු ලැබේ.

(ඇ) අනෙකුත් ආදායම

උපචිත පදනම මත අනිකුත් ආදායම හඳුනාගනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ සහ අනිකුත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමේදී ඇතිවන ආදායමක ස්වභාවය ඇති ශුද්ධ ලාභ හෝ අලාභ ඒවා බැහැර කිරීමේදී ලැබෙන මුදලින් වත්කමෙහි ධාරණ වටිනාකම හා අදාළ විකුණුම් වියදම් අඩු කර ගිණුම්වල සටහන් කර ඇත.

(ඈ) රජයේ ප්‍රදානයන්

ආදායම සහ විලම්භිත ආදායම ස්වභාවයට අයත් ලෙස සැලකිය හැකි සංවර්ධන කටයුතු වලට අදාළ රජයේ ප්‍රදානයන් ආදායම් ප්‍රවේශය යටතේ ගිණුම්ගත කරනු ලැබේ.

(ඉ) රාජ්‍යභාග ආදායම

වරාය නගර රාජ්‍යභාගය මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය සහ මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය අතර පොත් සටහන් යෙදීමක් වන අතර සමාලෝචිත ගිණුම්කරණ වර්ෂය තුළදී මේ සම්බන්ධයෙන් ද්‍රවශීල මුදල් ගනුදෙනු කිසිවක් සිදු වී නොමැත.

(ඊ) ආයෝජන ආදායම

පරිපාලිත සමාගම වෙතින් මේ දක්වා ලාභාංශ ලෙස ආදායමක් ලැබී නොමැත. කෙසේ වුවද, 2021 වර්ෂය තුළදී මෙම ලාභාංශ ආදායම ලැබෙනු ඇත

1.4.2 වියදම

දරන ලද වියදම සහ විශේෂිත ආදායම් අංග ඉපැයීම අතර සෘජු සම්බන්ධයෙහි පදනම මත ආදායම් ප්‍රකාශනය තුළ වියදම් හඳුනාගනු ලැබේ. වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේදී කාර්යක්ෂම තත්ත්වයකින් ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීම සඳහා දරන ලද සියළුම වියදම් ආදායමට ගලපා ඇත.

1.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිලියෙල කරනු ලැබ ඇත.

ගෙවන ලද පොළිය මෙහෙයුම් මුදල් ප්‍රවාහය ලෙස වර්ගීකරණය කරනු ලබන අතර ලැබෙන පොලිය ආයෝජන මුදල් ප්‍රවාහය ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

1.6 වාර්තාකරණ දිනයට පසුව සිදුවන සිදුවීම්

වාර්තාකරණ දිනයට පසුව සිදුවන සිදුවීම් සලකා බලනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී යෝග්‍ය ගැලපීම් ගිණුම් තුළ සිදු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය කරනු ලබන තත්ත්වයන් කිසිවක් වාර්තා කරන දින සිට ඇති වී නොමැත.

1.7 සම්බන්ධිත පාර්ශ්ව වල ගනුදෙනු

වාර්තා කරන දිනයට කාර්යාංශය සමග බලපැවැත්වෙන ගිවිසුම් සහ / හෝ යෝජිත ගිවිසුම් කිසිවකට කිසිදු අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ වී නොමැත. කෙසේ වුවද භූ . ස. ප. කා. හි සභාපතිවරයා පරිපාලිත සමාගමෙහි ද (සී/ස ජී. එස්. එම්. බී. තාක්ෂණික සේවා සමාගම) සභාපතිවරයා වේ. භූ . ස. ප. කා. හි ජ්‍යෙෂ්ඨ කැනීම් ඉංජිනේරුවරයා SLRDC හි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සාමාජිකයෙකි. (රාජ්‍ය ආයතන)

1.7.1 සාධාරණ වටිනාකම හෝ ප්‍රත්‍යාගනණය ආදේශක පිරිවැය ලෙස

පිරිවැය ආකෘතිය යොදා ගනිමින් ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පිලියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ සින්නක්කර දේපල, පිරියත සහ උපකරණ දක්වනු ලැබේ. ආදේශක පිරිවැය ලෙස සාධාරණ වටිනාකම භාවිතා කිරීමට භූ . ස. ප. කා. විසින් තෝරා ගෙන නොමැත.

1.7.2 සුවිශේෂී ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වර්ෂය තුළ දී නිකුත් කරන ලද සහ ක්‍රියාත්මක ප්‍රමිතිය භූ . ස. ප. කා. විසින් අනුගමනය කරනු ලැබ ඇත.

මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශනය

තූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
2020 දෙසැම්බර් මස 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2020 තථ්‍ය රු.	2019 තථ්‍ය රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	**1**	462,909,037.77	505,085,887.83
කෞරිගෙන යන වැඩ	**2**	159,045,550.73	109,560,762.69
මුළු ජංගම නොවන වත්කම්		621,954,588.50	614,646,650.52
ආයෝජන	**3**	4,000,000.00	4,000,000.00
විලම්භිත බදු වත්කම්	**4**	51,370,579.86	56,288,829.24
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛනය	**5**	32,115,617.45	33,314,238.45
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දේ	**6**	216,611,783.78	1,450,677,688.17
ස්ථිර තැන්පතු	**7**	3,119,309,526.23	1,951,654,429.53
මුදල් හා මුදල් තුල්‍යයන්	**8**	84,772,023.54	53,067,690.15
මුළු ජංගම වත්කම්		3,452,808,951.00	3,488,714,046.30
මුළු වත්කම්		**4,130,134,119.36**	**4,163,649,526.06**
කොටස් හා වගකීම්			
කොටස්			
මහ භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද ප්‍රාග්ධනය (ඒකාබද්ධ)	**9**	27,652,883.05	27,652,883.05
මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද ප්‍රාග්ධනය (දෙපාර්තමේන්තු)	**10**	1,746,725.68	1,746,725.68
මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද ප්‍රාග්ධනය (ප්‍රාග්ධන)	**11**	68,916,655.00	68,916,655.00
ප්‍රත්‍යාගණන සංචිත	**12**	305,782,596.11	305,782,596.11
රඳවා ගත් ඉපයීම්	**13**	2,208,333,238.05	2,638,577,845.96
මුළු කොටස්		**2,612,432,097.89**	**3,042,676,705.80**
ලැබුණු ප්‍රේෂණ (විදේශ)	**14**	4,135,177.57	7,411,670.41
ආපදා සහ සේවක ප්‍රතිලාභ ගිණුම	**15**	35,750,158.73	32,317,940.17
ජංගම නොවන වත්කම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**16**	197,213,230.00	159,753,034.00
ගෙවිය යුතු කල් බදු (වාහන)	**17**	25,457,825.58	33,598,296.07
විලම්භිත බදු වගකීම		60,253,441.35	76,398,943.90
ජංගම වගකීම්			
ණයහිමියන් සහ ගෙවිය යුතු දේ	**18**	581,786,072.00	291,572,233.79
වෙනත් ගෙවිය යුතු දේ	**19**	613,106,116.24	519,920,701.92
		1,194,892,188.24	811,492,935.71
මුළු කොටස් හා වගකීම්		**4,130,134,119.36**	**4,163,649,526.06**

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ
ප්‍රකාශනය

තෑ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

	සටහන්	2020 තථ්‍ය රු.	2019 තථ්‍ය රු.
ආදායම	**20**	2,025,438,786.66	2,476,349,148.61
වෙනත් ආදායම	**21**	77,637,587.48	92,919,595.76
මෙහෙයුම් වියදම්	**22**	(650,901,098.79)	(1,960,220,410.39)
පරිපාලන වියදම්	**23**	(517,266,954.78)	(592,145,945.15)
මෙහෙයුම් ලාභය		**934,908,320.57**	**16,902,388.83**
මූල්‍ය පිරිවැය	**24**	(5,525,422.37)	(5,032,021.49)
ශුද්ධ මූල්‍ය ආදායම	**25**	143,082,793.80	228,233,719.36
බදුවලට පෙර ලාභය		**1,072,465,692.00**	**240,104,086.70**
ආදායම් බදු වියදම්	**26**	298,780,511.83	81,837,768.73
වර්ෂය තුළ ලාභය		**773,685,180.17**	**158,266,317.97**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන් 01
දේපල, පිරියත හා උපකරණ

	2020-01-01 දිනට ශේෂය	වර්ෂය තුළ එකතු කිරීම්	ගැලපීම්	2020-12-31 දිනට ශේෂය
	රු	රු	රු	රු
පිරිවැය මත				
ඉඩමවටා වැට බැඳීම	639,713.50	1,242,500.00		1,882,213.50
ගොඩනැගිලි	26,395,538.31	18,951,671.28		45,347,209.59
ගොඩනැගිලි කොටස් කිරීම	35,994,815.69	10,337,876.70		46,332,692.39
පිරියත හා යන්ත්‍රෝපකරණ	47,593,046.15	4,670,270.00		52,263,316.15
මෝටර් වාහන	340,065,299.00			340,065,299.00
සිතියම් උපකරණ	9,103,384.44			9,103,384.44
විදුම් අමතර කොටස්	128,002,731.27	3,073,377.37		131,076,108.64
විද්‍යාගාර උපකරණ	226,108,463.39	4,654,260.00		230,762,723.39
ක්ෂේත්‍ර උපකරණ	12,967,776.45	134,356.00		13,102,132.45
කාර්යාල උපකරණ	187,680,306.59	11,315,011.60	(85,459,936.03)	113,535,382.16
සන්නිවේදන උපකරණ	14,650,874.52	890,490.00		15,541,364.52
ගෘහභාණ්ඩ හා උපාංග	42,102,907.60	3,546,351.00	(325,422.06)	45,323,836.54
සිතියම්	475,824.75			475,824.75
පුස්තකාල පොත්	29,706,866.47	818,406.39		30,525,272.86
කෞතුකාගාර භාණ්ඩ	1,337,055.87			1,337,055.87
මෘදුකාංග සහ උපාංග	10,504,638.00			10,504,638.00
යක්කල වැරැල්ලවත්ත පිහිටි සම ගබඩාව	27,207,663.15			27,207,663.15
ගම්පහ ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල	19,251,356.42			19,251,356.42
පරිගණක හා උපාංග	0.00	1,694,100.00	85,444,336.03	87,138,436.03
ඉඩම - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	28,000,000.00			28,000,000.00
නුවර ප්‍රාදේශීය කාර්යාලය	1,745,685.00			1,745,685.00
රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය	13,687,290.79			13,687,290.79
ජර්මන් පර්යේෂණ මධ්‍යස්ථානය - මහකනදරාව	2,670,527.14			2,670,527.14
ජර්මන් පර්යේෂණ මධ්‍යස්ථානය - හක්මන	2,794,651.26			2,794,651.26
	1,208,686,415.76	**61,328,670.34**	**(341,022.06)**	**1,269,674,064.04**

ක්ෂයවීම්	2020-01-01 දිනට ශේෂය	අය කිරීම්	වර්ෂය තුළ ගැලපීම්	2020-12-31 දිනට ශේෂය
	රු	රු	රු	රු
ඉඩම වටා වැට බැඳීම	639,711.50	237,143.78		876,855.28
ගොඩනැගිලි	12,941,457.27	1,401,990.00		14,343,447.27
ගොඩනැගිලි කොටස් කිරීම	19,159,104.37	5,346,283.32		24,505,387.69
පිරියත සහ යන්ත්‍රෝපකරණ	3,771,380.66	6,513,680.97		10,285,061.63
මෝටර් වාහන	238,203,767.26	27,668,155.76		265,871,923.02
සිතියම් උපකරණ	8,939,914.68	163,401.92		9,103,316.60
විදුම් අමතර කොටස්	7,243,223.11	16,115,005.86		23,358,228.98
විද්‍යාගාර උපකරණ	191,708,458.51	15,848,626.05		207,557,084.56
ක්ෂේත්‍ර උපකරණ	4,561,026.98	1,861,854.88		6,422,881.86
කාර්යාල උපකරණ	123,448,331.81	16,460,871.56	(52,241,606.71)	87,667,596.66
සන්නිවේදන උපකරණ	6,299,668.93	1,580,764.89		7,880,433.82
ගෘහභාණ්ඩ සහ උපාංග	15,618,347.22	3,888,867.89	(325,422.06)	19,181,793.05
සිතියම්	336,171.95	23,791.20		359,963.15
පුස්තකාල පොත්	16,495,974.26	1,172,873.94		17,668,848.20
මෘදුකාංග සහ උපකරණ	10,387,133.16	35,464.54		10,422,597.70
යක්කල වැරැල්ලවත්තේ පිහිටි සම ගබඩාව	27,100,482.72	8,088.96		27,108,571.68
ගම්පහ ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල	16,746,373.34	962,567.76		17,708,941.10
පරිගණක හා උපාංග		4,216,087.31	52,226,006.71	56,442,094.02
				-
	703,600,527.73	**103,505,520.59**	**(341,022.06)**	**806,765,026.27**
ශුද්ධ පොත් අගය	**505,085,888.03**			**462,909,037.77**

සටහන් 02
කෙරී ගෙන යන වැඩ

	2020	2019
	තථ්‍ය	තථ්‍ය
	රු	රු
වැරැල්ලවත්තේ පිහිටි යෝජිත ගබඩා සංකීර්ණය	17,583,072.53	16,394,284.99
යක්කල ප්‍රාදේශීය කාර්යාලයෙහි යෝජිත ගොඩනැගිල්ල	2,807,165.00	1,889,165.00
යෝජිත ජී. පී. ආර් / ඊ ආර් පී පද්ධතිය	503,540.00	503,540.00
පිටකෝට්ටේ පිහිටි, විද්‍යාගාරය සඳහා යෝජිත ගොඩනැගිල්ල	130,011,350.98	72,773,592.12
යෝජිත ගොඩනැගිල්ල - අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය	-	9,787,712.86
යෝජිත ගොඩනැගිල්ල - රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය	3,976,250.40	3,976,250.40
යෝජිත ප්‍රාදේශීය කාර්යාලය - පොළොන්නරුව	2,563,888.88	2,431,754.38
යෝජිත ගොඩනැගිල්ල අම්පාර	366,000.00	366,000.00
යෝජිත ගොඩනැගිල්ල කුරුණෑගල	182,510.00	0.00
අම්පාර බුද්ධංගල ප්‍රදේශයේ යෝජිත භූ විද්‍යා සඳහා වන ජර්මන් පර්යේෂණ මධ්‍යස්ථානය	1,051,772.94	1,438,462.94
කෙරීගෙන යන වැඩ	159,045,550.73	109,560,762.69

සටහන් 3
ආයෝජන

ආයෝජනය	4,000,000.00	4,000,000.00
	4,000,000.00	4,000,000.00

සටහන් 4

විලම්බිත බදු	විලම්බිත වත්කම්	විලම්බිත වගකීම්
	රු	රු
2020.01.01 දිනට ආරම්භක ශේෂය	56,288,829.24	76,398,943.90
ගැලපීම	4,918,249.38	16,145,502.55
2020.12.31 දිනට අවසන් ශේෂය	**51,370,579.86**	**60,253,441.35**

	2020	2019
සටහන් 05	තථ්‍ය	තථ්‍ය
භාණ්ඩ ලේඛනය	රු	රු
ලිපිද්‍රව්‍ය	4,010,110.07	4,791,550.06
පරිභෝජනය කළ හැකි ද්‍රව්‍ය	10,481,747.42	12,412,023.64
බලපත්‍ර පොත්	2,428,865.00	585,838.40
පුස්තකාල පොත්	635,303.24	635,303.24
සිතියම්	30,224.06	33,224.06
විදුම් සහ අනිකුත් පරිභෝජනය කළ හැකි ද්‍රව්‍ය	14,529,367.66	14,856,299.05
භාණ්ඩ ලේඛනය	**32,115,617.45**	**33,314,238.45**

සටහන් 6
වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ

කුලී අත්තිකාරම් - ගොඩනැගිලි	5,682,041.71	4,386,760.43
අත්තිකාරම් සහ ණය - (බී අත්තිකාරම)	208,775.26	208,775.26
ගොඩනැගිලි තැන්පතු	366,000.00	366,000.00
දේශීය මිලදී ගැනීම් සඳහා ගෙවන ලද අත්තිකාරම්	28,421,027.14	24,064,053.15
ක්ෂේත්‍ර නිලධාරීන්ට ගෙවන ලද අත්තිකාරම්	3,555,312.88	4,139,112.88
විශේෂ අත්තිකාරම්	45,400.00	5,400.00
උත්සව අත්තිකාරම්	450,900.00	46,950.00
අනෙකුත් සේවකයන්ට ගෙවන ලද අත්තිකාරම්	2,584,588.26	4,461,731.70
විදේශ සඟරා සඳහා ගෙවන ලද අත්තිකාරම්	46,076.00	46,076.00
ණයකරුවන් - ව්‍යාපෘති	7,142,124.35	15,200,157.75
ණයකරුවන් - රසායනික විශ්ලේෂණය	149,917.50	149,917.50
ණයකරුවන් - චෙක්පත් ආපසු එවීම	2,049,158.31	1,974,857.23
විවිධ ණයකරුවන්	28,010,036.16	33,366,495.87
අය කර ගත හැකි භාණ්ඩ හා සේවා බදු	973,143.00	973,143.00
ණයකරුවන් - රක්ෂණ හිමිකම්	73,340.34	517,748.45
වත්කම් බැහැර කිරීම	0.00	(0.00)
ණයකරුවන් - එවි ඇන්ඩ් එස් රක්ෂණ හිමිකම්	593,757.35	392,432.35
ණයකරුවන් - හර සටහන්	90,796.80	90,796.80
අරමුදල මාරු කිරීම	0.00	(0.00)
සරල වීකතු කළ අගය මත බදු ගනුදෙනුකරුවන්	24,573,239.89	9,280,383.07
බැංකුවෙන් ලැබිය යුතු රැඳවුම් බදු	0.00	(0.00)
ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු	0.00	22,474,354.00
පුරස්කාර මත රැඳවුම් බදු (කැණීම)	0.00	33,307,741.94
සේවක ආපදා ණය	72,767,054.43	57,257,475.16
සුනාමි ණය	0.00	33,082.76
ජලය සඳහා තැන්පතු	8,500.00	8,500.00
ඉන්ධන සඳහා තැන්පතු	348,000.00	348,000.00
විවිධ තැන්පතු	87,500.00	86,500.00
ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි සඳහා තැන්පතු	840,000.00	840,000.00
ස්ථිර තැන්පතු මත ලැබිය යුතු පොළිය- ලංකා බැංකුව	11,968,710.08	17,757,911.69
ස්ථිර තැන්පතු මත ලැබිය යුතු පොළිය සම්පත් බැංකුව	0.00	0.00
ස්ථිර තැන්පතු මත ලැබිය යුතු පොළිය - මහජන බැංකුව	2,670,589.29	4,108,268.80
භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොලිය	2,136,931.09	3,185,955.37
ලැබිය යුතු පොලිය, PPLS බැංකු ගාලු පාර	12,614,424.62	13,227,578.73
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ ආපදා අරමුදල සඳහා ලැබිය යුතු පොලිය	0.00	15,467.13
විවිධ වියදම් සඳහා කරන ලද පූර්ව ගෙවීම්	8,154,439.32	1,198,356,061.16
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට ලැබිය යුතු පොළිය		-
	216,611,783.78	**1,450,677,688.17**

සටහන් 7
ස්ථාවර තැන්පතු

ස්ථාවර තැන්පතු ලංකා බැංකුව	852,163,556.17	808,659,513.90
භාණ්ඩාගාර බිල්පත්	350,552,740.04	327,385,616.58
ස්ථාවර තැන්පතු, මහජන බැංකුව, ගාලුපාර, දෙහිවල	1,401,203,327.30	373,633,309.07
රාජ්‍ය ආයතන, තාවකාලික අතිරික්ත භාරය	0.00	8,440,912.87
ස්ථාවර තැන්පතු, මහජන බැංකුව, පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	241,593,123.43	173,091,764.20
ස්ථාවර තැන්පතු, මහජන බැංකුව ගාලුපාර - ගෝලීය භූ කම්පන ජාල ගිණුම	9,982,898.68	9,280,054.66
ස්ථාවර තැන්පතු - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් - මහජන කාර්යාංශය ආපදා අරමුදල	30,182,746.68	34,726,689.71
ස්ථාවර තැන්පතු - සාමාන්‍ය - මහජන බැංකුව පිටකෝට්ටේ	233,631,133.93	216,436,568.54
(ඉ) මහකනදරාව හා හක්මන සුනාමි මධ්‍යස්ථානවල ගොඩනැඟිලි පිළිවෙලින් රු.2,670,527 ක් හා රු.2,794,651 ක් ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණද ඊට අදාළ ක්ෂය ගණනය කර ගිණුම්වල දක්වා නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මෙම වත්කම් ඉදිකළ දිනයන් තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 15 ඡේදය ප්‍රකාරව ඉතිරි තොග වටිනාකම, ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය යන දෙකෙන් වඩා අඩු අගයට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වුවද, තොග වල ශුද්ධ උපලබ්ධි අගය හඳුනාගැනීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය, රු.32,115,617 ක් වූ එහි පිරිවැය වටිනාකම් මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39(අ) ඡේදය ප්‍රකාරව, රාජ්‍යභාග ආදායම හඳුනා ගැනීම සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණු රු. මිලියන 1,602 ක් වූ රාජ්‍යභාග ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 12 ප්‍රකාරව මූල්‍ය කල්බදු පදනම මත ලබාගෙන තිබුණු මෝටර් වාහන 10 කට අදාල අවම කල්බදු ගෙවීම් වටිනාකම වට්ටම් කර වර්තමාන අගය ගිණුම්ගත කරනු වෙනුවට වට්ටම් නොකරන ලද රු.102,600,000 ක් වූ වටිනාකම ගිණුම්ගත කර තිබුණි. තවද කල්බදු ණයහිමි ශේෂය ජංගම හා ජංගම නොවන වශයෙන් නිවැරදි ලෙස වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(එ) බදු බැඳියාවක් නොමැති අයිතම 4 ක් මත රු.6,662,408 ක් වූ විලම්භිත බදු වගකීමක් හඳුනාගැනීම් හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ආදායම් බදු වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඒ) ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 66 ක එනම්, රු.255,682,009 ක් වූ සමාගමේ මුළු ශුද්ධ වත්කම් වලින් රු.188,750,125 ක හිමිකමක් කාර්යාංශය සතු වුවද සමාගමේ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ අඩමාන්‍ය ණය ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණු අතර ඉකුත් වර්ෂයේ අඩමාණ ණය වෙන්කිරීම් රු.5,097,526 ක් වෙළඳ ණය ගැනියන් හා ලැබිය යුතු අගයන්ගෙන් අඩුකර දක්වනු වෙනුවට, ණය හිමියන් සහ ගෙවිය යුතු අගයන් ලෙස වගකීම් යටතේ මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල හා එය පිහිටි ඉඩම මිලදී ගැනීමේ පිරිවැය වූ රු.28,000,000 ක මුදල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වශයෙන් වෙන වෙනම හඳුනාගෙන ගිණුම්ගත කරනු වෙනුවට මුළු පිරිවැය වටිනාකම ඉඩම් යටතේ ගිණුම්ගත කර තිබුණි. තවද, එම ගොඩනැගිල්ල සඳහා ක්ෂය වෙන් කිරීමටද කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කාර්යාංශයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කාර්යාංශයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයන්ට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාංශය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2(ආ), (ඊ), (උ), (ඌ) සහ (ඒ) ඡේදවල සඳහන් නිරීක්ෂණ සම්බන්ධව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ද නිවැරදි කර නොතිබුණි.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට, කාර්යාංශය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධිවිධානවල යොමුව	විස්තරය
(අ) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට්පත්‍රය මගින් සංශෝධිත 33(4) වැනි පතල් කැණීම් නියෝගය	පතල් නිෂ්පාදනවල නිශ්චය කල වෙළඳ වටිනාකම, ඉඩදිය හැකි අඩු කිරීම් හා රාජ්‍යභාග ගෙවීම් වැඩපිළිවෙල සඳහා ලේකම්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කර කාර්යයන් සම්බන්ධව කාලීන සංශෝධනයන් සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි.
(ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 6.2(ඇ) වගන්තිය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ජූලි 05 දිනැති අංක 02/09/01/අමප/2018 දරන ලිපිය	පනත ප්‍රකාරව මාස ½ ක වැටුප පදනම් කරගෙන පාරිතෝෂික ගෙවිය යුතු වුවත් සම්පූර්ණ මාසයක වැටුප පදනම් කර ගැනීම නිසා 2016- 2019 කාලය තුල සේවයෙන් ඉවත් වූ සේවකයන් 21 කට රු.8,352,114 ක් වැඩිපුර ගෙවා තිබූ අතර පාරිතෝෂික ගෙවීම සඳහා සම්පූර්ණ මාසයක වැටුප මත පදනම්ව රු.159,753,034 ක් ප්‍රතිපාදනය කර තිබුණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික ආපසු අයකර ගන්නා ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් 2018 මැයි 10 දින දන්වා තිබුණ ද එම මුදල් ආපසු අයකරගෙනද නොතිබුණි.
(ඇ) 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 V වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යවරයා නිකුත් කල 1993 ජුනි 24 දිනැති අංක 772/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය	පතල් හා ඛනිජ නිස්සාරණයේදී සමුච්චිත ප්‍රදේශය හෙක්ටයාර 10 ඉක්මවා පොළොව මතුපිට පතල් කැණීම් සිදු නොකල යුතු වුවද ඊට පටහැනිව හෙක්ටයාර 18 ක ප්‍රදේශයක ඛනිජ වැලි කැණීම සඳහා අංක IML/A/HO/1623 දරන කැණීම් බලපත්‍රය නිකුත් කර තිබුණි.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 365(1)	නියමිත මුදල් වර්ෂය තුල අනුදත් ගෙවීම සඳහා පමණක් අත්තිකාරම් ලබාදිය යුතු නමුත් වර්ෂ 1 සිට වර්ෂ 5 ට වැඩි කාලය තුල දේශීය මිලදී ගැනීම් සඳහා ලබාදී නොපියවී ඇති අතතිකාරම් ශේෂ වටිනාකම රු.7,608,105 ක් විය.
	(ii) මුදල් රෙගුලාසි 371(5)	ලබාදෙන අත්තිකාරම් මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකල යුතු වුවත් වසර 1 සිට 5 ට වැඩි කාලය තුල නිලධාරීන්ට ලබාදී ඇති අත්තිකාරම් වලින් නොපිය වී ඇති ශේෂය රු.6,329,943 ක් විය.
	(iii) මුදල් රෙගුලාසි 757(2) හා 507 (3)	පිරිවැය රු.1,208,686,416 ක් වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයට අදාලව සමීක්ෂණය කටයුතු සම්පූර්ණ කර සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31.11 හා 31.15 වගන්ති	සාපරාධී චෝදනා යටතේ 2017 අගෝස්තු 17 දින සිට වැඩ තහනමට ලක් කර තිබුණු කැණීම් ඉංජිනේරුවරයෙකුට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කර තිබුණද වැඩ තහනම් කළ කාලසීමාවට අදාලව රු.954,521 ක අඩ වැටුප් හා රු.369,171 ක දිරිදීමනා හා ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. විනය පරීක්ෂණ නියෝගයක් රහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2019 අගෝස්තු 15 දින සිට එම නිලධාරිය නැවත සේවයේ පිහිටුවා තිබුණි.
(ඊ)	2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය	2017, 2018 හා 2019 වර්ෂවල වාර්ෂික වාර්තා 2020 ජූනි 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(උ)	2002 අප්‍රේල් 19 දිනැති අංක 1232/14 දරන සහ 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන අති විශේෂ ගැසට් පත්‍රවල සඳහන් විදේශ විනිමය නියෝග	ශ්‍රී ලංකාව තුල පතල් කැණීම් සිදුකරන සමාගමක මුළු කොටස් අයිතියෙන් විදේශීය අයිතිය සියයට 40 ක ප්‍රතිශතයක් දක්වා විය යුතු අතර එම සීමාව ඉක්මවා විදේශීය අයිතිය පවතී නම් ලංකා ආයෝජන මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබාගත යුතු විය. නමුත්, ශ්‍රී ලංකාව තුල මිනිරන් කැණීම් සිදුකරන බෝගල ග්‍රැපයිට් සමාගමේ මුළු කොටස් අයිතියෙන් සියයට 89.91 ක්ම විදේශීය සමාගම් 02 කට අයත් වූ අතර මෙම සමාගම ලංකා ආයෝජන මණ්ඩලයෙන් එලෙස අනුමැතියක් ලබාගෙන හෝ එම මණ්ඩලය සමඟ ආයෝජන ගිවිසුමකට එළඹ නොතිබුණි. නමුත් මේ පිළිබඳ නොසලකා මෙම සමාගමට මිනිරන් කැණීම් සඳහා කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර 02 ක් නිකුත් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත 52(2) වගන්තිය හා 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට්පත්‍රය මගින් සංශෝධිත 21(අ) වැනි පතල් හා කැණීම් නියෝගය ප්‍රකාරව කැණීම්වලින් අනතුරුව ඉඩම් පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතු වුවද මාස 2 සිට වසර 09 ක් දක්වා කාලයක් ගතවී තිබුණද. කාර්මික කැණීම් බලපත්‍රලාභීන් 874 දෙනෙකු ලවා එම කාර්ය ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඉහත බලපත්‍රලාභීන්ගෙන් ලබාගෙන තිබූ වටිනාකම රු.156,275,430 ක් වූ බැංකු ඇපකර මුදල් කරගෙන තිබුණද එම මුදල් භූමි පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

(අ) අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ 02 වන මහල රු.11,545,178 ක වියදමින් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 ප්‍රකාරව තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියක්ද නොමැතිව අධයක්ෂ මණ්ඩල අනුමැතියක් මත ශ්‍රී ලංකා නාවික හමුදාවට පවරා තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව උපදේශකවරයෙකු මෙම ඉදිකිරීම් කාර්යය සඳහා පත්කර රු.579,995 ක මුදලක් ගෙවා තිබූ අතර අදාල උපදේශකවරයා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.3.1(ආ) හි සඳහන් නියමයන්ට පටහැනිව මෙම කාර්ය සඳහා පත්කල තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපති ලෙසටද පත්කර තිබුණි.

(ආ) වාහන 51 ක් සඳහා රු.408,000 ක් වැයකර GPS Tracking System සවිකර තිබූ අතර මෙයට අදාල ඇස්තමේන්තු, අනුමැතිය, සැපයුම්කරු තෝරාගත් ආකාරය, අදාල කොන්ත්‍රාත් ගිවිසුම සහ මෙයට අදාල ගෙවීම් ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

3. වෙනත් කරුණු

(අ) පිටකෝට්ටේ පිහිටි භූමියේ රු.585,147,480 ක වියදමින් භූ කම්පන සහ සුනාමි නිරීක්ෂණ මධ්‍යස්ථානය සහ විද්‍යාගාර ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතුනද ඊට අදාළ ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් සඳහා වැයවන රු.383,193,671 ක් සඳහා පමණක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර කොන්ත්‍රාත්තුවේ හදිසි අවශ්‍යතා සහ වෙනත් වැය සඳහා දැරිය යුතු එකතු වටිනාකම වූ රු.201,953,810 ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) බෝගල ග්‍රැපයිට් සමාගම වෙත කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර නිකුත් කිරීම

(i) මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ප්‍රකාශනයක් ලෙස 2018 වර්ෂයේදී නිකුත් කරන ලද "ආර්ථිකය සරිකල හැකි ලාංකීය ඛනිජ සම්පත්" නැමැති ග්‍රන්ථයේ සඳහන් ආකාරයට වර්තමානයේදී ශ්‍රී ලංකාවට නැනෝ තාක්ෂණය හඳුන්වාදී ඇති බවත් මෙම නැනෝ තාක්ෂණය තුලින් මිනිරන් සඳහා අපරිමිත වටිනාකමක් ලබා දිය හැකි බවත් එහි සඳහන් වේ. එහි සඳහන් වන ආකාරයට නැනෝ තාක්ෂණය උපයෝගී කරගෙන සැකසූ ග්‍රැපීන් ග්‍රෑම් 01 ක් රු.150,000 ක (කි.ග්‍රෑම්. 1 ක වටිනාකම රු.මි.150) තරම් ඉහල මිලක පවතින අතර සමාගම විසින් කැණීම් කරන මිනිරන් නිමි හෝ අර්ධ නිමි නිෂ්පාදනයක් බවට පත් නොකර අමුද්‍රව්‍ය තත්ත්වයෙන් අපනයනය කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වෙමින් පැවතුණි. සමාගම මගින් 2017-2019 අගෝස්තු කාලය තුල කැණීම් කරන ලද මිනිරන් මෙ.ටො. 6,460.68 ක් අපනයනය කිරීමෙන් රු.මිලියන 1,747.21 ක ආදායමක් ලබා තිබුණි. ඒ අනුව අගය එකතු කිරීමෙන් තොරව අමුද්‍රව්‍ය ලෙස මිනිරන් කිලෝ ග්‍රෑම් 01 ක් රු.270 ක් වූ ඉතා අඩු මිලකට අපනයනය කර ඒ මත රාජ්‍යභාග ගෙවා තිබූ අතර මෙම අපනයන මිල හා අමුද්‍රව්‍ය මිල අතර සියයට 55555556 ක තරම් අගය අහිමි වීමක් විය.

(ii) මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදාල සමාගම වෙත වර්ෂයක කාලයක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කරන අතර එය වසරින් වසර දීර්ඝ කරනු ලැබේ. ඊට අමතරව පුරා විද්‍යා දෙපාර්මේන්තුව විසින් ගලිගමුව ප්‍රාදේශිය ලේකම් වෙත අදාළ සමාගමට කැණීම් කිරීම සඳහා වාර්ෂිකව අළුත් කිරීමේ පදනම මත සිය නිර්දේශ ඉදිරිපත් කරන අතර ප්‍රාදේශීය ලේකම් විසින්ද කැණීම් බලපත්‍රය වසරකින් දීර්ඝ කිරීමට හූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත සිය නිර්දේශ ඉදිරිපත් කරයි. ඒ අනුව කැණීම් බලපත්‍රයද වාර්ෂිකව අළුත් කල යුතු වුවත් සමාගම විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත කැණීම් බලපත්‍රයේ වළංගු කාල සීමාව 2018 නොවැම්බර් 02 සිට 2028 නොවැම්බර් 01 දක්වා වර්ෂ 10 කට දීර්ඝ කිරීම මතභේදයට තුඩු දී තිබුණි.

(ඇ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොඩවැලි කැණීම සඳහා ලබාදුන් බලපත්‍ර 13 ක් පිළිබඳව කාර්යාංශයේ අධ්‍යක්ෂ (පතල් සුරක්ෂිතතා) විසින් සිදුකල පරීක්ෂාවේදී සියළුම බලපත්‍රවල සඳහන් කැණීම් ප්‍රදේශ, ගැඹුර ඉක්මවා කැණීම් කර ඇති බවත් කාර්යාංශයට රාජ්‍යභාග ආදායම අඩුවෙන් අයව ඇති බවත් බලපත්‍ර සඳහා අයකර ගන්නා බැංකු ඇපකර ප්‍රමාණවත් නොවන බැවින් එය ඉහල දැමිය යුතු බවටත් නිරීක්ෂණය කර තිබුණද ඒ පිළිබඳව

ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ දිනය දක්වාම ගෙන නොතිබුණි. තවද හම්බන්තොට දිස්ත්‍රික්කයේ හා රත්නපුර දිස්ත්‍රික්කයේ බලපත්‍රය යටතේ වැලි කැනීම් කල භූමි පුනරුත්ථාපනය කර නොතිබුණු අතර අනාරක්ෂිත වලවල් ජලයෙන් පිරී තිබුණි. වැලි කැණීම් කළ භූමිය පුනරුත්ථාපනයට ලබා ගන්නා ලද ඇපකරයට වඩා මුදලක් පුනරුත්ථාපනයට වැය වීම හේතුවෙන් එම ඇපකරය ලබා ගැනීමෙන් තොරව හා භූමි පුනරුත්ථාපනය කිරීමෙන් තොරව අතහැර දමා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ සාදන ලද පස් කැණීම් සඳහා බලපත්‍ර දීමේ නියෝගයන්හි 33 වගන්තිය ප්‍රකාරව ලබාදී තිබුණු බලපත්‍ර 2 ක් යටතේ සිදුකර තිබුණු කැණීම් වලින් පස් කියුබ් 10,382 ක් වෙනුවෙන් රු.287,010 ක රාජ්‍ය භාග ආදායම හා දඩ මුදල් අයකරගෙන නොතිබුණි. බලපත්‍ර සීමාවෙන් ඔබ්බට පස් කියුබ් 2,201 ක අනවසරෙන් කැණීම් කර තිබුණි. එසේම කැණීම් බලපත්‍රවල සඳහන් කොන්දේසි 7 ක් සහ ගිවිසුම් කොන්දේසි 2 ක් කඩකර තිබුණද, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු නමුත් ඊට අදාළ රු. 600,000 ක බැංකු ඇපකරය නිදහස් කර තිබුණි. බලපත්‍රයේ කොන්දේසි අනුව, නායයාම් වළක්වා ගැනීම සඳහා ආනති ක්‍රම පවත්වාගෙන යාම, පාංශු බාදනය වැළැක්වීමට පියවර ගැනීම, ඉඩමේ මායිම වටා මීටර් 05 ක බිම් තීරුවක් කැණීමෙන් තොරව අත්හැරීම, කැණීම් කටයුතු සම්මත මෙට්‍රික් ග්‍රිඩ් සීමාව තුළ පවත්වාගෙන යාම හා කැණීම් සිදුකල ඉඩම පුනරුත්ථාපනය කිරීම සිදුකල යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

(ඉ) අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ට අයත් ඉඩමක් විධිමත්ව පවරා ගැනීමකින් තොරව කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලය ඉදිකිරීම සඳහා 2014 සහ 2020 වර්ෂවල පිළිවෙලින් රු.3,914,563 ක් හා රු.12,225,173 ක් වැයකර තිබුණි.

(ඊ) 2019 වර්ෂයේදී එක් වාහනයකට රු.8000 බැගින් වාහන 51 කට රු.408,000 ක් වැයකර සවිකර තිබුණු GPS Tracking System උපකරණ වලින් වාහන 14 කට සවිකල අදාල උපකරණ අක්‍රිය තත්ත්වයේ පැවති අතර කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ වෙන්කල වාහනය සඳහා සවිකල මෙම උපකරණය ගලවා වැඩිපුර ධාවනය නොවන ත්‍රිරෝද රථයකට සවිකර තිබුණි. මෙම සවිකල නව පද්ධතිය මගින් වාහන පරිපාලන කටයුතු, වාහනවල ආරක්ෂාව, රියදුරන්ගේ කටයුතු පරිපාලනය, නඩත්තු ආදී විවිධ සේවාවන් මෙම පද්ධතිය මගින් ලබාගත හැකි බව ව්‍යාපෘතින්ට අදාල වාර්තාවේ දැක්වෙන නමුත් ප්‍රවාහන අංශයේ කටයුතු පරිපාලනය කර ගැනීම සඳහා මෙම පද්ධතිය නිසි ලෙස භාවිතා කිරීමක් සිදුකර නොතිබුණි.

(උ) 2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම් දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනිමට විගණන දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඌ) කළුගල් කැණීම් ප්‍රමාණය හඳුනා ගැනිමට විද්‍යාත්මක ක්‍රමවේදයක් මෙතෙක් අනුගමනය කර නොතිබුණු අතර කළුගල් කැණීම සඳහා යොදා ගන්නා පුපුරන ද්‍රව්‍ය මෙන් දෙගුණයක් කැණීම් කළ කියුබ් ප්‍රමාණය ලෙස සලකා රාජ්‍යභාග අයකර ගනිමින් පැවතුණි.

(එ) යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා භාවිත කල පස් කියුබ් 1,343,810 ක් වැලි කියුබ් 3397 ක් සඳහා පිළිවෙලින් ලැබිය යුතු රු. 26,876, 200 ක් සහ රු.543,490 ක් බැගින් වූ එකතුව රු.27,419,690 ක රාජ්‍යභාගය සමාලෝචිත වර්ෂය තුලද කොන්ත්‍රාත් සමාගමෙන් අයකරගෙන නොතිබුණි.

(ඒ) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28(4) වගන්තිය ප්‍රකාරව කළුගල් නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. අදාල විධිවිධානයට පටහැනිව 2019 දෙසැම්බර් 13 දිනැති අංක 19/විවිධ(064) දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වැලි, පස් හා මැටි ප්‍රවාහනය සඳහා 2019 දෙසැම්බර් 4 දින සිට 2020 මාර්තු 16 දක්වා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම නවතා දමා තිබුණි. එම ඛනිජ සඳහා රාජ්‍යභාගය ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේදී ගාස්තු අයකර ගනිමින් පැවති නමුත්, ප්‍රවාහන බලපත්‍ර අහෝසි කිරීමේදී කැණීම්කරුවන්ගෙන් රාජ්‍යභාග අයකර ගැනීමට විකල්ප ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(ඔ) 2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනතේ 2(ඉ) වගන්තිය ප්‍රකාරව ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර කාර්යාංශය විසින් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් කැණීම් කරන මිනිරන්, ඛනිජ වැලි හා තිරුවානා ඛනිජ සඳහා අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස අපනයනය කෙරෙමින් පැවතුණි.

(ඕ) කාර්යාංශය විසින් 2014 සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල අයකර තිබුණු රු.මිලියන 8488 ක රාජ්‍යභාග ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපති වාර්තාව හා පිළිතුරු

2021.10.21
ඔබේ අංකය - අයිඊඑන්/ඩී/ජීඑස්එබ්බී/1/2020
මගේ අංකය - එෆ් එන්/ ඒකිවු/2020

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක.306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව හා සම්බන්ධ කාර්යංශයේ පැහැදිලි කිරීම

1. මූල්‍ය ප්‍රකාශන

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) හි නියමයන්ට අනුව අයිතම හතර වන තොග, වෙළඳ හා ලැබීම්, දිගුකාලීන වගකීම් හා කල්බදු පොළී නියමිත ආකාරයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කිරීමට ඉදිරියේදී අවශ්‍ය පියවර ගන්නෙමු. ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපිය යුතු අයිතම තුන ගිණුම්කරණ ප්‍රමිති අංක 02 (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) ට අනුව නිවැරදිව ගැලපීමට ඉදිරියේ දී කටයුතු කරන්නෙමු.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 54 ඡේදය ප්‍රකාරව පූර්ව කාලපරිච්ඡේද ගැලපුම් අතීතානුයෝගීව ගලපා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමටත්, හෙලිදරව් කිරීමටත් කටයුතු කරන්නෙමු.

(ඇ) 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ක්ෂය ගැලපීම නිවැරදි ලෙස ගලපා තිබුණ ද ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ 1.2.1 - ෑ යටතේ අයිතම 04 ක් ක්ෂය කිරීමේ ප්‍රතිශත හෙලිදරව් කර නොතිබුණි. එය විගණනය පෙන්වා ඇති පරිදි ඉදිරියේ දී හෙලිදරව් කිරීමට කටයුතු කරන්නෙමු.

(ඈ) කාර්යාංශය මගින් වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කරනු ලබන්නේ වසර 05 කට වරක් වේ. ඒ අනුව මෙම ක්‍රියාදාමය 2018 වර්ෂයේ අගෝස්තු මාසයේ දී සිදු කරන ලදී. එම අවස්ථාවේ දී කාර්යාංශයේ මුළු වත්කම් පන්තියම සඳහා ප්‍රතණාගණනය සිදු කර ඇත. ඒ අනුව නැවත ප්‍රත්‍යාගණනය සිදු කල යුතු වන්නේ 2023 වසරේදීය. නමුත් මෙම වසරේ දී කාර්යාංශය විසින් ඉඩම් ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනයක් සිදු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ලිපියක් යොමු කර ඇත.

(ඉ) 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ක්ෂය ගණනය කිරීමේ දී මහකනදරාව හා හක්මන සුනාමි මධ්‍යස්ථාන වල ක්ෂය කිරීම සිදු කර නොමැති බැවින් විගණනය පෙන්වා ඇති පරිදි කටයුතු කරන්නෙමු.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 හි 15 ඡේදයෙහි සඳහන් වන්නේ, හුවමාරු නොවන ගනුදෙනුවක් මාර්ගයෙන් අත්පත් කර ගත් ගන්නා අවස්ථාවලදී හැර අනෙකුත් අවස්ථාවලදී අත්පත් කර ගන්නා තොග සම්බන්ධයෙනි. නමුත් කාර්යාංශයෙහි තොග අත්පත් කර ගනු ලබන්නේ හුවමාරු නොවන ගනුදෙනු මාර්ගයෙනි.

(උ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 794/23 - 1993 නොවැම්බර් 26 වැනි සිකුරාදා දින නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ ඇ වන කොටසට අනුව රාජ්‍ය භාග හඳුනා ගැනීම සිදු කල යුතුය. නමුත් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මේ සම්බන්ධව හෙලිදරව් කර නොතිබීම නිසා ඉදිරියේදී

එය නිවැරදි කරන්නෙමු.

(ඌ) මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන 10ක් ලබා ගැනීම ගිණුම් ගත කිරීම නිවැරදි බව මීට පෙර කාර්යාංශය භාරව කටයුතු කල රජයේ විගණන නිලධාරි සමඟ සිදු කල සාකච්ජාවේ දී තහවුරු විය. ඒ අනුව මෝටර් වාහන කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීම ගිණුම් ගත කිරීම නිවැරදි වේ. නමුත්, කල්බදු ණය හිමි ශේෂය ජංගම හා ජංගම නොවන සේ නිවැරදිව වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට ඉදිරියේදී කටයුතු කරන්නෙමු.

(එ) 2020 වර්ෂයේ දී ආදායම් බදු ගණනය කිරීමේ දී බදු බැදියාවක් නොමැති අයිතම අදාල කර ගැනිම නිවැරදි කර ගැනීමටත් ඉදිරියේ දී නිවැරදිව ආදායම් බද්ද ගණනය කිරීමටත් කටයුතු කරන්නෙමු.

(ඒ) GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගමේ 2003 වර්ෂයේදී කරන ලද ආයෝජනයක් බැවින් වසර 17 ක් පුරා මූල්‍ය තොරතුරු විශ්ලේෂණය කර ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම සිදු කල යුතුව ඇති බැවින් ඒ සඳහා සාධාරණ කාලයක් අවශය වේ. 2020 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට වැඩිදුරටත් කාලය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ලිපියක් විගණකාධිපතිතුමා වෙත මේ වන විටත් යවා ඇත. තවද මෙම කාර්යය වසර 17ක් පුරාවට සිදුකළ යුතු බැවින් කාර්යාංශ කටයුතු සමඟ මෙය සිදුකිරීම අපහසු කාර්යයක් වන බැවින් ඒ සඳහා බාහිර සම්පත් දායකත්වයක් මගින් එය ඉටු කර ගැනිමට අවශ්‍ය කටයුතු එනම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා යොමු කර ඇත.

(ඔ) ඉදිරියේදී අඩමාණ ණය වෙන් කිරීම වෙළෙඳ ණයගැතියන්ගෙන් අඩුකර නිවැරදි ආකාරයට ගිණුම්වල පෙන්වීමට කටයුතු කරන්නෙමු.

(ඕ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල හා ගොඩනැගිලි යටතේ සහ ඉඩම වෙන වෙනම හඳුනාගෙන ගිණුම් පොත් වල පෙන්වීමටත් අදාළ ක්ෂය වෙන්කිරීම් සඳහා ගැළපීම් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

නීතිරීති/විධානයට යොමුව

(අ) 1992 අංක 33 දරණ පතල් හා බනිජ ද්‍රව්‍ය පනත යටතේ 1997 ජනවාරි 10 වන දිනැති අංක 958 දරණ ගැසට්පත්‍රය මගින් සංශෝධිත 33 (4) නියෝග වලට අනුව ලේකම්වරයා විසින් බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග 10 හි සඳහන් පරිදි ආයෝජන ගිවිසුමක ඇතුලත් කළ යුතු අවස්ථා වල දී එවැනි සංශෝධනයන්ය යොමු කිරීමටය දැනටමත් නීති පසුබිම සැකසී ඇති බැවින්, ආයෝජන ගිවිසුම් වලට ඇතුලත් කර ඇත.

(ආ) කාර්යාංශය පාරිතෝෂික පනත ප්‍රකාරව කටයුතු කර ඇති අතර, ඒ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව මඟින්ද තහවුරු කර ඇත. ඒ අනුව වැඩිපුර ගෙවීමක් සිදුව නැති බැවින් අයකර ගැනීමක් කළ යුතුව නැත. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ජා වූ පරිදි මේ වන විට අදාළ සියලු අනුමැතීන් භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.

(ඇ) පනත හා රෙගුලාසි යටතේ කාර්මික බනිජ සඳහා හෙක්ටයාර් 10 ක් ඉක්ම වූ ප්‍රදේශයක කැනීම් බලපත්‍ර නිකුත් කිරීමේ දී, කැනීම් බලපත්‍ර සඳහා අයදුම් කිරීමට ප්‍රථම ගවේෂණ බලපත්‍රයක් ලබා ගත යුතු වීමත්, ගවේෂණ බලපත්‍රයේ ඇති තාක්ෂණික වාර්තා පදනම් කරගෙන කැනීම් සඳහා අයදුම් කිරීමටත් නෛතික පසුබිම සැකසී ඇත. ඒ අනුව, කාර්යාංශය විසින් කැනීම් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

එහෙත්, ලංකා බනිජ වැලි සමාගම විසින් ඉහත කී පනත හා රෙගුලාසි නිකුත් කිරීමට පෙර කාර්මික ක්‍රමවේදයට අනුව කැනීම් කටයුතු සිදු කරමින් පැවති බැවින්, 1993.11.26 දිනැති අංක 794/23 ගැසට්පත්‍රයට අනුකූලව එතෙක් පැවති කාර්මික ක්‍රමයට සිදු කරන ලද කැනීම් බලපත්‍රව 1994 අප්‍රේල් 23 වන දිනට ප්‍රථම කාර්යාංශයේ කාර්මික කැනීම් බලපත්‍ර යටතේ ලියාපදිංචි කිරීමට නෛතික පසුබිම සකසා තිබූ බැවින්, ගවේෂණ බලපත්‍රයකින් තොරව පැවති කැනීම් බලපත්‍රය නව ක්‍රමවේදයට අනුගත කිරීමට නීතිමය හැකියාවක් ලැබී ඇත.

(අෑ)

(i) මෙහි **GPRS System** සඳහා රු. 1,927,810/50ක මුදලක් ගෙවා ඇත. එහෙත් මෙම **System** එක සම්පූර්ණ කර නොමැති බැවින් වත්කම් ලෙස ගෙන නොමැති බැවින් මෙම අත්තිකාරම් ගිණුමේ පවතී. ෑඅසි **Solution** (**Pvt**) **Ltd** ආයතනය සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල ද එම ක්‍රියාවලිය සම්පූර්ණ කර නොමැති නිසා අත්තිකාරම් ගිණුමේ පෙන්නුම් කෙරේ. අනෙක් අත්තිකාරම් සඳහා අදාල අංශ වෙත අදාල අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරන ලෙස දන්වා ලිපි නිකුත් කර ඇත.

(ii) විගණනය දක්වා ඇති පරිදි එක් නිලධාරියෙකුට ලබා දී ඇති අත්තිකාරම් මුදල ලෙස රු.1,500,000/= මුදලක් ලබා දී ඇති අතර එය වර්ෂ 05කට වැඩි කාලයක් ගතවී ඇත. මේ සම්බන්ධව නීතිමය පියවර ගැනීම සඳහා යොමුකර ඇත.

ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිළධාරීන්ට ලබාදී ඇති අත්තිකාරම් මුදලින් රු. 4,090/88ක් 1994 හා 1996 සිට පවතී. ඒ හේතුවෙන් මෙම අත්තිකාරම් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර ඇති අතර, රු. 260,000/= මුදල මේ වනවිට පියවා ඇත. 1,047,822/= මුදල අයකර ගැනීම සඳහා අදාල අංශ වෙත ලිපි යොමුකර ඇති බවද දන්වා සිටිමි.

(iii) ස්ථාවර වත්කම් භාණ්ඩ සමීක්ෂණ කටයුතු කාර්යාංශය තුල සිදු කරගෙන යනු ලබන කාල සීමාව තුල රටේ උද්ගත වූ හදිසි කොරෝනා ආපදා තත්වය මත එය තාවකාලිකව නවතා දැමීමට සිදු විය. ඉදිරි වර්ෂයේදී වාර්ෂික තොග ගණනයන් සිදු කර අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු යොදන බව දන්වා සිටිමු.

(ෘ) මින් එක් නිළධාරියකු මෙම සියළු චෝදනා වලින් නිදොස් කොට නිදහස් වී ඇති අතර, අනෙක් නිලධාරියා සම්බන්ධව විධිමත් විනය පරීක්ෂණය මේවනවිට ද පැවැත්වෙන අතර ඔහු වෙතින් කාර්යාංශයට අයවිය යුතුව ඇති මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

(ී) 2017, 2018 හා 2019 වර්ෂ වල වාර්ෂික වාර්තා මේ වන විට පාර්ලිමේන්තු සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.

(ෙ) බෝගල ග්‍රැෆයිට් සමාගම රජයට අයත්ව පැවති අතර, රජයේ තීන්දුවකට අනුකූලව විදේශීය සමාගමකට කොටස් විකිණීමක් සිදු කර ඇත. එම විකිණීම 2012 වර්ෂයට ප්‍රථම සිදුවූවක් බව දන්වමු.

2.2.3.

කාර්යාංශය විසින් කැනීම් බලපත්‍ර නිකුත් කිරීමේ දී කැනීම් කිරීමෙන් අනතුරුව භූමිය පුනරුත්ථාපනය කිරීම සඳහා පුනරුත්ථාපන බැඳුම්කරයක් කාර්යාංශය විසින් ලබා ගනු ලැබේ.

පුනරුත්ථාපනයෙන් අනතුරුව කාර්යාංශය විසින් එම පුනරුත්ථාපන කටයුතු පිළිබඳව සෑහීමකට පත්වන්නේ නම් පමණක් එම බැඳුම්කරය බලපත්‍රලාභියා වෙත මුදාහරිනු ලැබේ.

විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි පුනරුත්ථාපනය නොකරන ලද හා පුනරුත්ථාපනය කර බැඳුම්කරය ආපසු ලබා නොගත්, බැංකු ඇපකරයේ වලංගු කාලය ඉක්මවූ ඇපකර කාර්යාංශය විසින් අත්පත් කර ගන්නා අතර, පුනරුත්ථාපනය කළ බවට තහවුරු වන අවස්ථා වල දී කාර්යාංශය විසින් අත්පත් කර ගත් ඇපකර ආපසු බලපත්‍රලාභීන් වෙත මුදා හැරීමට කටයුතු කරනු ඇත.

ඉදිරියේ දී මෙම කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීමට මේ වන විටත් සැලසුම් කර ඇත.

2.2.4

(අ) අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය කුළි පදනම මත පවත්වාගෙන යාම අධික මුදලක් වැය වීම හේතුවෙන් කාර්යාංශයට අයත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියේ තිබූ ගොඩනැගිල්ලේ දෙවන මහල කඩිනමින් ඉදිකර අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා ස්ථාපිත කිරීම කළමණාකාරිත්වයේ තීරණය විය. එහිදී ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් මුදලින් (කම්කරු කුලිය නොමැතිව) ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව එකඟවූ බැවින් ද මෙම කාර්යය කඩිනමින් ඉටුකර ගැනීමේ හැකියාව ශ්‍රී ලංකා නාවික හමුදාවට තිබෙන බැවින්ද අදාල කොන්ත්‍රාත්තුව කාර්යාංශ අධ්‍යක්ෂ මන්ඩල අනුමැතිය මත ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබාදෙන ලදී.

තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව කටයුතු කිරීමේ අරමුණින් තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කලද අදාල කාර්ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සෘජුවම ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පැවරූ බැවින් තාක්ෂණික ඇගයීම් සිදුකර ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර නොමැත.

(ආ) අදාල ලිපිගොනු ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනු ඇත.

3.වෙනත් කරුණු

(අ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ස්ථාපිත කර ඇති ඉඩමට අදාලව අංක 10/2859/527/001 හා 2011.12.08 දිනැති කැබිනට් මණ්ඩල අනුමැතිය ප්‍රකාරව පිටකෝට්ටේ, එපිටමුල්ල පාරේ, අංක 569 දරණ ස්ථානයේ කාර්යාංශය ස්ථාපිත කර ඇති පර්චස් 205 ක බිම් ප්‍රමාණයට කාර්යාංශයේ නමට පවරා ගැනීමේ එකඟතාව මත කාර්යාංශය මුදල් ගෙවා ඇති බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 209 ක මුළු බිම් කොටසම පරිසර අමාත්‍යාංශයට පවරා දීමට කළමණාකරණ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

අදාළ පර්චස් 205 ක බිම් ප්‍රමාණය කාර්යාංශයේ නමට පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක්ද ඉදිරිපත් කර ඇති අතර, එම එකඟතාව ලබා ගත් වහාම ඉඩම් කොමසාරිස් විසින් දැනට කාර්යාංශය ස්ථාපිත මෙම ඉඩම පවරා දීම සිදු කරනු ඇත.

මේ සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය මඟින් කැබිනට් මණ්ඩලය වෙත අදාල ඉඩම් පැවරීම සම්බන්ධනේ අපගේ ඉල්ලීම යොමුකර ඇති නමුත් මේ වනතෙක් නීත්‍යානුකූල පැවරීමේ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදුකල යුතුව ඇත.

ප්‍රසම්පාදන කමිටු තීරණය කිරීමේදී හා ඒ සඳහා පත් කිරීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තුව මත අකටයුතු කලද කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමේදී තේරී පත්වූ කොන්ත්‍රාත් වටිනාකමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.

මෙම ටෙන්ඩරය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම ඇතුළු සියලු ප්‍රසම්පාදන කටයුතු රේඛීය අමාත්‍යාංශය හරහා සිදු වූ අතර එම කටයුතු ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සිදුව ඇත. එහිදී අදාළ වියදම් පමනක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇති බව නිරීක්ෂණය කරමි.

(ආ) බෝගල ග්‍රැෆයිට් සමාගම වෙත කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර නිකුත් කිරීම

(ඇ) මේ වන විට අර්ධ මිනිරන් භාණ්ඩ සැකසීම පිළිබඳ පර්යේෂණ කරමින් පවතී. ඒහෙත් පැවති අපනයන ඒ ආකාරයෙන්ම සිදුකරන අතර පවතින ආර්ථික තත්ත්වය මත අපනයන ආදායම් සුරක්ෂිත කර ගැනීම සඳහා අගය ඒකතු කරන ලද මිනිරන් අපනයනය කිරීමට අවසර දෙනු ලැබේ.

(ii) 2009 අංක 66 දරණ පනතින් සංශෝධිත 1992 අංක 33 දරණ පතල් හා කණිජ ද්‍රව්‍ය පනත යටතේ සාධන ලද බලපත්‍ර නිකුත් කිරීමේ නියෝගවලට අනුව කැණීම් බලපත්‍රලාභීන් විසින් ඉදිරිපත් කර ඇති ආර්ථික ජීව්‍යතා වාර්තාව පදනම් කරගෙන කාර්මික කැණීම් ඒ කාණ්ඩයේ බලපත්‍රවල වලංගු කාලය තීරණය

කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නෛතික බලතල හිමිවී ඇත. එබැවින් මේ වන විට පුරාවිද්‍යා නිර්දේශ දීර්ඝ කාලීනව වලංගු වන ලෙස නිකුත් කරනු ලබන අතර බලපත්‍රලාභියා විසින් අදාළ ආයතනවල නිර්දේශවලට යටත්ව වසරකට වැඩි වලංගු කාලයක් හිමි කැණීම් බපලත්‍ර යටතේ කැණීම් කිරීමට නීතිමය බාධාවක් නොමැත.

(අෘ) පුනරුත්ථාපන බැඳුම්කරවල වටිනාකම් සංශෝධනය කිරීම සඳහා දැනටමත් කටයුතු කරමින් පවතී. එසේම කැණීම් පිළිබඳ පසුවිපරම් කිරීම සහ පුනරුත්ථාපනය කිරීම් සම්බන්ධ ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට කටයුතු සම්පාදනය කරමින් පවතී.

(අෟ) විගණනයේ පෙන්වා දී ඇති පරිදි රාජ්‍ය භාගය අය කර ගැනීම සඳහා අදාළ ලිපිගොනු මේ වන විට පරීක්ෂා කරමින් පවතී. ඒ අනුව යම් අතපසුවීමක් සිදුවී තිබේ නම් ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට යොමු කර ඇත.

(ඉ) භූ විද්‍යා සමීක්ෂණ හ පතල් කාර්යාංශයේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල දීර්ඝ කාලයක් පවත්වාගෙන යන ලදී. මෙහිදී මහජන සේවාවන් වඩා ඵලදායිව සහ ක්‍රමවත්ව ලබාදීම සඳහා නාගරික කලාපය තුළ ඉඩකඩ තිබීම අත්‍යවශ්‍ය වූ බැවින්, දිස්ත්‍රික් ලේකම් වෙතින් එම කාර්යාලයේ ඉඩ පහසුකම් කාර්යාංශය ඉල්ලා තිබූ අතර, එවැනි ඉඩ පහසුකම් නොමැති වීම මත දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමිය රජයේ ඉඩමක් බැවින් එහි කාර්යාලයක් ස්ථාපිත කර ගැනීමට ඇති වූ එකඟතාවයක් මත කටයුතු කර ඇත.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල භූමියේ ඇති වෙනත් රජයේ ආයතන කුලී ගෙවන පසුබිමක භූ විද්‍යා සමීක්ෂණ හ පතල් කාර්යාංශය කුලී නොගෙවා තම ගොඩනැගිල්ලක් රජයේ ඉඩමක පවත්වා ගැනීම ආර්ථික වශයෙන් වාසි ගෙන දෙන්නක් බැවින්ද මේ සඳහා එකඟ වී ඇත. මෙම ඉඩම දිස්ත්‍රික්ක ලේකම් කාර්යාල භූමියේ ඉඩමක් බැවින් පවරා ගැනීමක් සිදු කළ නොහැක.

(ඊ) විගණනය දක්වා ඇති කරුණ සම්බන්ධව එකඟ වන අතර, මෙම පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල අංශ දැනුවත් කරන ලදී

(උ) ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මේ වන විට සකසා ඇති අතර සකසන ලද කෙටුම්පත සම්බන්ධව ඒ පිළිබඳ සුවිශේෂී දැනුමක් ඇති විද්වතුන්ගේ අදහස් ලබා ගැනීමට මේ වන විට අවශ්‍ය කටයුතු කරමින් පවතී. ඉතා කෙටි කලක් තුළ එය එළිදැක්වීමට යෝජිතය.

(උෟ) මේ වන විට කැණීම් බලපත්‍ර යටතේ කැණීම් ස්ථානවලින් ඉවත් වන කළු ගල් ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් හඳුන්වා දෙමින් පවතී. එම ක්‍රමවේදය යටතේ කාර්මික කැණීම් ඒ කාණ්ඩයේ බලපත්‍රවලට අදාළ කනින ලද කළු ගල් කියුබ් ප්‍රමාණය තක්සේරු කිරීම සිදුකරමින් පවතී. මෙම ක්‍රමවේදය සෙසු කාණ්ඩයේ බලපත්‍ර සඳහාද හඳුන්වා දීමට නියමිතය.

(එ) යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ භාවිතා කළ පස් හා වැලි වෙනුවෙන් අය විය යුතු රාජ්‍ය භාගය ගෙවා නිම කරන ලෙස අදාළ සමාගමට ලිපි කිහිපයක් වාරි මාර්ග දෙපාර්තමේන්තුවට පිටපත් සහිතව යොමු කර ඇත. ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාරයක් නොමැති බැවින් එකී රාජ්‍ය භාගය අය කර ගැනීම සඳහා නීතිමය කටයුතු කිරීම සඳහා යොමු කිරීමට නියමිතය.

(ඒ) කළුගල් ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් සකසා ඇති අතර ඉදිරියේදී ඒ සම්බන්ධව අමාත්‍යාංශය සමග සාකච්ඡා කර තීරණයට එළැඹීමට නියමිතය. එමෙන්ම පස්, බොරළු, මැටි, වැලි යන ඛනිජ ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම කාර්යාංශය විසින් කිසිවිටකත් නවතා දමා නොමැත. කැණීම් බලපත්‍ර යටතේ කැණීමට අවසර දී ඇති කියුබ් ප්‍රමාණය සඳහා රාජ්‍ය භාගය අය කිරීම කාර්යාංශය විසින් සිදුකර ඇත.

(ඔ) ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම එක් එක් ඛනිජ ද්‍රව්‍ය අනුව විවිධාකාර වේ. පොළොවෙන් ලබාගන්නා ඛනිජ ඒ ආකාරයෙන්ම අපනයනය කිරීම සිදුනොවන බැවින් අපනයන තත්ත්වයට කැබලි කිරීම, කුඩු කිරීම සේදීම, වෙන් කිරීම යන ක්‍රියාකාරකම් සියල්ලම වටිනාකම් එකතු කිරීමේ යටතට අයත් වේ. එබැවින් කාර්යාංශය විසින් අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදනය දක්වා ආයෝජකයින් යොමු කිරීම සඳහා

කර්මාන්ත අමාත්‍යාංශය සමග ඒකතුව කටයුතු කිරීමට සාකච්ඡා කරමින් පවතී.

(ඕ) 2009 අංක 66 පනතින් සංශෝධිත 1992 අංක 33 පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 17 වන වගන්තිය ප්‍රාකාරව කාර්යාංශය බලපත්‍ර නිකුත් කිරීමේදී හා කර්තව්‍ය ඉටුකිරීමේදී කාර්යාංශයට ලැබෙන සියලු මුදල් කාර්යාංශය අරමුදලේ තැන්පත් කර එම මුදල් කාර්යාංශයේ බලතල ඒහි බලතල ක්‍රියාත්මක කිරීමේදී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී අවශ්‍ය මුදල් ඒම අරමුදලින් භාවිතා කළ යුතු බවට දක්වා ඇත. ඒබැවින් කාර්යාංශය විසින් මුදල් අමාත්‍යාංශය විසින් විටින් විට ඉල්ලා සිටින අවස්ථාවලදී කාර්යාංශය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් මුදල් අරමුදලේ තබාගෙන භාණ්ඩාගාරයට මුදල් යවනු ලැබේ.

අනුර වල්පොළ
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

විගණන අංශය

විගණන කමිටු වාර්තාව - 2020

"ස්වාභාවික සම්පත් හා පරිසරය ආරක්ෂා කිරීමේ කාර්යයේ නියුතු, නිරන්තරවම ජනතා විශ්වාසය දිනාගත් ,වඩාත් යහපත් පාලන කාර්යය රාමුවක් තුළ ක්‍රියාත්මක වන, රජයට අයත් නියාමන ආයතනයක් නිර්මාණය කිරීම උදෙසා"

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විගණන කමිටුවෙහි නීතිරීති හා වගකීම් යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශන්හි මෙහෙයුම් මූලධර්ම මත පදනම් වන විගණන හා කළමනාකරණ කමිටු මණ්ඩල ප්‍රඥප්තිය තුළ පැහැදිලිව විස්තර කරනු ලැබ ඇත.

මෙම කමිටුව කළමනාකාරිත්ව මණ්ඩලයට වගකිව යුතු වන අතර එහි රැස්වීම් කටයුතු කළමනාකාරිත්ව මණ්ඩලයට වාර්තා කරනු ලැබේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විගණන කමිටුව කළමනාකාරිත්ව මණ්ඩලයෙහි විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර මහා භාණ්ඩාගාර නියෝජිතයන් එහි රැස්වීම්වල මුලසුන දරනු ලැබේ. එකී සාමාජිකයන් පහත සඳහන් වේ.

1. **සභාපති - රෝහිත වික්‍රමරත්න මහතා**

   (අධ්‍යක්ෂ - ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව)

2. **සාමාජික - අයි. සී. පතිරාජ මහතා**

   (අතිරේක ලේකම් - කර්මාන්ත සංවර්ධන)

3. **සාමාජික - ඩබ් ඩී එස් සී වැලිවත්ත මහතා**

   (අතිරේක ලේකම් - ස්වාභාවික සම්පත්)

විගණන හා කළමනාකරණ කමිටුවේ නීතිරීති හා වගකීම්

සමාගමෙහි මූල්‍ය සහ අනිකුත් ඒ ආශ්‍රිත කටයුතු සම්බන්ධයෙන් සමාගමෙහි වගකීම් සක්‍රියව සපුරාලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දැක්වීම විගණන හා කළමනාකරණ කමිටුව විසින් අඛණ්ඩව සිදු කරනු ලැබේ. පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට මෙම කමිටුවට බලය ලබා දී ඇත. ඵ

1. වාර්ෂික විගණන සැලැස්ම, කාර්යය වැඩසටහන, ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික අයවැය සහ ප්‍රාග්ධන අයවැය සමාලෝචනය කිරීම

2. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගුණාත්මකභාවය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාපිළිවෙල සිදුවන යම් යම් වෙනස්කම් සහ අදාල ගිණුම්කරණ ප්‍රමිතීන්හි ව්‍යවස්ථාපිත හා නියාමන අනුකූලතාවය කෙරෙහි එකී ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙත් අනුගතවීම සමාලෝචනය කිරීම.

කමිටුවෙහි රැස්වීම්

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළදී කාරක සභාවේ රැස්වීම් දෙකක් පවත්වන ලදී. කමිටු රැස්වීම්වල කටයුතු ප්‍රමාණවත් තොරතුරු සහිතව සටහන් කර නිරන්තරවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. කමිටුවේ ආරාධනය මත විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතවරයා අදාළ වර්ෂය තුළදී කමිටු රැස්වීම්වලට සහභාගි විය.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ පාලනය වන අභ්‍යන්තර විගණක ඒකකයක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සතුව ඇත. අභ්‍යන්තර විගණන වැඩසටහන විගණන කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලදුව එකී කමිටුව විසින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලදී. කමිටුව විසින් නිතිපතා අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ.

බාහිර විගණනය

වාර්තාවන සියලුම අනනුකූලතාවය පිළිබඳ සිද්ධි සහ අක්‍රමවත් ගිණුම්කරණ සහ වාර්තාකරණ ගැටළු සම්බන්ධයෙන් නිසි කලට ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා විගණන කළමනාකරණ කමටුව විසින් පරීකෂා කරනු ලැබේ.

ආයතනය විසින් යෝග්‍ය ලෙස ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කරනු ලබන බවට කමිටුව විසින් සෑහීමට පත් වන අතර ඒ අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි මූල්‍ය ප්‍රකාශනය විශ්වාසනීය බවට සාධාරණ තහවුරු කිරීමක් සිදු කරනු ලැබේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අදාළ නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරනු ලබන බවට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අනුකූලතා කාර්යරාමුව මගින් තහවුරු කරනු ලබන බවට කමිටුව සෑහීමට පත් වන අතර සමාලෝචිත වර්ෂය තුළදී වාර්තා වූ අනනුකූලතාවයන් සම්බන්ධයෙන් නිවාරණ හා විශෝධන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

රෝහිත වික්‍රමරත්න මහතා
සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව

ආයතනික සමාජ වගකීම

පතල් අංශය විසින් සිදු කරන ලද විශේෂ කාර්යයන් සහ ජාතික ආර්ථිකය වෙත දක්වන ලද දායකත්වය

1. රුක් රෝපණ වැඩසටහන

පරිසරය ආරක්ෂා කිරීම සහ තිරසර කැනීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පියවර කිහිපයක් ගන්නා ලදී. රට තුළ පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන ලදී. කෙසේ වුවද දිවයින පුරා දිස්ත්‍රික්ක 22 ක පිහිටි ආගමික ස්ථාන 97 කදී 2020 ජූනි මස 6 දිනට යෙදුණු ලෝක පරිසර දිනය සැමරීම උදෙසා රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.





2. දැනුවත් කිරීමේ වැඩසටහන

කළුගල් කර්මාන්තයේ නියුතු තැනැත්තන් සඳහා "සුරක්ෂිත සේවා ස්ථානයක් - සුරක්ෂිත අනාගතයක් " යන තේමාව යටතේ වූ වැඩමුළුවක් 2020.01.31 දින කොළඹදී ද 2020.02.28 දින කළුතර නරගයේදී ද කාර්යාංශය විසින් පවත්වන ලදී. ගඩොල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල හැකි වනුයේ කෙසේද, ආරක්ෂිත පිපිරවීම් ශිල්පීය ක්‍රම ප්‍රගුණ කරන්නේ කෙසේද, ආරක්ෂිත පුපුරුණ ද්‍රව්‍ය, සේවකයන්ගේ සෞඛ්‍යය සහ සුභසාධනය සහ කළු ගල් මගින් සිදු කරන පෙදරේරු කර්මාන්තය විසින් ක්ෂේත්‍රය තුළ මුහුණ දෙනු ලබන විවිධ ගැටලු විසඳනුයේ කෙසේද යන ක්ෂේත්‍රය තුළ ඇති ගැටළු සම්බන්ධයෙන් කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ විශේෂඥවරුන් සහ අනිකුත් විශේෂඥවරුන් විසින් මෙම වැඩමුළුව තුළදී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.





3. දැනට පවතින කොරෝනා වසංගත තත්ත්වය තුළ නම්‍යශීලී බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටියක් හඳුන්වා දීම

- දැනට ලෝකය පුරාම දක්නට ලැබෙන කොරෝනා වසංගත තත්ත්වය හමුවේ සංචරණ සීමාවන් සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ හා අනුකූල වන පරිදි නම්‍යශීලි සහ පහසු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.

මේ අනුව එමගින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- ප්‍රාදේශීය කාර්යාලය වෙත ගමන් කිරීමට පෙර කලින් වේලාවක් වෙන් කරවා ගැනීමට සේවාදායකයන් උනන්දු කරවීම
- ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සරල කිරීම
- ප්‍රාදේශීය කාර්යාල තුලින් කැනීම් බලපත්‍ර, වෙළඳ හා ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම
- අවම නිර්දේශ සහිතව කැනීම් බලපත්‍ර නිකුත් කිරීම
- කැනීම් බලපත්‍ර හා වෙළඳ බලපත්‍ර වලංගු වන කාල පරිච්ඡේදය 2020 මාර්තු 16 සිට 2020 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කිරීම
- රට තුළ දැනට පවතින තත්ත්වය හමුවේ කැනීම් කටයුතු නිම කරනු ලැබ ඇති ප්‍රදේශ තුළ භෝග වගා කිරීමට බලපත්‍ර හිමියන්ට උපදෙස් ලබා දී ඇත.
- නව නීති හා මාර්ගෝපදේශ හා අනුකූලව රටෙහි ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කොරෝනා වසංගතය සහිත කාල පරිච්ඡේදය තුළදී කාර්යාංශය විසින් අපනයන බලපත්‍ර නිකුත් කරනු ලැබ ඇත.



නො. 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.
0112886289/0112886290